(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 9.]

# පාර්ලිමේන්තුවේ
# න්‍යාය පුස්තකය

**2018 අප්‍රේල් මස 19 වැනි බ්‍රහස්පතින්දා ඇතුළුව එදින සිට**

**නිකුත් කළේ 2018 අප්‍රේල් මස 06 වැනි සිකුරාදා**

---

## 2018 අප්‍රේල් මස 19 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

840/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුරගමන් සේවා බස්රථ විවේකය සඳහා නතර කරනු ලබන ස්ථානවල පිහිටි ආපනශාලා බොහෝමයක් ඉතා අපිරිසිදු තත්ත්වයේ පවතින බවත්;

(ii) එම ස්ථානවල වැසිකිළි පහසුකම් නිසියාකාරව නොමැති බවත්;

(iii) එම ආපනශාලාවල ප්‍රමිතියෙන් බාල ආහාරපාන අධික මිල ගණන්වලට විකුණනු ලබන බවත්;

(iv) ඉහත (i) හා (ii) හි සඳහන් තත්ත්වයන් බස් මගීන්ගේ සෞඛ්‍යය කෙරෙහි බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත ආපනශාලා නියාමනයට දැනට ඇති ක්‍රමවේදය කවරේද;

(ii) එම ක්‍රමවේදය සංශෝධනය විය යුතු බවට පිළිගන්නේද;

(iii) එසේ නම්, එම සංශෝධන සිදුකරන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1248/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට මන්නාරම දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයා තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුද්ධමය තත්ත්වය නිමවන තුරු පානීය ජලය ලබා දීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුද්ධමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1655/'17

ගරු වමින්ද විජේසිරි මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය වරාය ආශ්‍රිතව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතු තෙල් ටැංකි තිබේද;

(ii) එසේ නම්, එම තෙල් ටැංකි සංඛ්‍යාව කොපමණද;

(iii) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතු තෙල් ටැංකි බදු දී තිබේද;

(iv) එසේ නම්, එම තෙල් ටැංකි බදු දී ඇති ආයතන හා රටවල් කවරේද;

(v) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසු එම තෙල් ටැංකි බදු දීමෙන් සංස්ථාව ලබාගත් ආදායම, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2000/'17

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්යය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2008/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේ ඇති වූ ගංවතුර හා නායයාම්වලින් අගතියට පත් පවුල්වලට ලබාදෙන බවට ප්‍රකාශ කරන ලද රක්ෂණ වන්දි මුදල එම පවුල්වලට ලැබී තිබේද;

(ii) 2016 වර්ෂයේ ගංවතුර ඇතිවූ අවස්ථාවේදී හානි වූ නිවසකට උපරිමය ලක්ෂ 25 දක්වා රක්ෂණ වන්දි මුදල් ලබාගත හැකි බව අග්‍රාමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළද, එකී ගංවතුරට ලක් වූ කොළොන්නාව, අංගොඩ, වැල්ලම්පිටිය, සේදවත්ත, කැළණිමුල්ල, පැලියගොඩ, කඩුවෙල හා පහළ බෝමිරිය යන ප්‍රදේශයන්හි පිහිටි කිසිදු නිවසකට මේ දක්වා එබඳු රක්ෂණ වන්දි මුදලක් ලැබී නොමැති බව පිළිගන්නේද;

(iii) 2016 හා 2017 වර්ෂවලදී විපතට පත්වූවන්ගේ හානි වූ නිවාස තක්සේරු කර රක්ෂණ වන්දි මුදලක් හෝ කවර හෝ වන්දි මුදලක් ගෙවීමට පියවර ගනු ලබන දිනය කවරේද;

(iv) හානිවූ නිවාස සඳහා මේ වනවිට යම් වන්දි මුදලක් ගෙවා ඇත්නම්, එසේ වන්දි ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) එම රක්ෂණ මුදල් ගෙවා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2011/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ මීතොටමුල්ල කසළ කන්ද පුළුල් කිරීම හේතුවෙන් නිවාස අහිමි වූ පවුල් 160 ක් සඳහා සාලමුල්ල, "ලක්සඳ සෙවණ" තට්ටු නිවාස සංකීර්ණයෙන් 2014.12.01 දින නිවාස ලබා දී ඇති බවත්;

(ii) එම නිවාස ලබා දී මාස දෙකක් ඇතුළත ඔවුන්ට නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සින්නක්කර ඔප්පු ලබා දීමට පොරොන්දු වී තිබූ බවත්;

(iii) මෙතෙක් එම පදිංචිකරුවන් සඳහා ඔප්පු ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සින්නක්කර ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

(ii) යම් ගැටලුකාරී තත්ත්වයන් පවතී නම්, ඒවා විසඳා ගනිමින් මෙම නිවාස සඳහා සින්නක්කර ඔප්පු ලබා දිය හැකි නිශ්චිත දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2110/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය යුදමය තත්ත්වය හේතුවෙන් අවතැන් වූ පවුල් 150ක් අවුරුදු 25ක් පුරා වවුනියාව පූන්තෝට්ටම් සුභසාධන කඳවුරේ වාසය කරන බවත්;

(ii) මෙම පවුල් 150 නෙඩුන්කේනි, සින්න අඩම්පන් ප්‍රදේශයේ නැවත පදිංචි කරන බවට වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දැනුම් දී තිබියදී, මෙම පවුල් සඳහා වූ නිවාස කොටස් දෙකකට බෙදා නෙඩුන්කේනි සින්න අඩම්පන් ප්‍රදේශයේ නිවාස 68ක් සහ පුලියන්කුලම් ප්‍රදේශයේ නිවාස 82ක් වශයෙන් "ලයිකා ඥානම් පුණ්‍යායතනය" විසින් ඉදිකරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස 150හි එකී ජනතාව නැවත පදිංචි වී සිටින්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2130/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතාවට ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබාදීම සඳහා මේ වනවිට අවශ්‍ය කරන වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(ii) 2017.06.30 දිනට රාජ්‍ය සේවය තුළ සිටින වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(iii) අවශ්‍ය ඉලක්කය සම්පූර්ණ කර ගැනීම සඳහා ඉදිරි වර්ෂවලදී රජයේ සේවයට බඳවා ගැනීමට නියමිත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ඉලක්කය සම්පූර්ණ කර ගැනීම සඳහා රජයේ සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2149/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බීමට පිරිසිදු ජලය නොමැතිකමින් පුත්තලම දිස්ත්‍රික්කය තුළ විශාල පිරිසක් දැඩි පීඩාවට ලක්වී සිටින බව දන්නේද;

(ii) දිස්ත්‍රික්කය තුළ ඇති බීමට පිරිසිදු ජලය නොමැති ගම්මාන හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) මේ දක්වා දිස්ත්‍රික්කය තුළ ක්‍රියාවට නංවා ඇති ජල ව්‍යාපෘතිවල නම් හා එයින් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉදිරියේදී පුත්තලම දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2177/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2016 වර්ෂයේ මැයි මාසයේදී කොළඹ දිස්ත්‍රික්කයේ ඇති වූ ගං වතුරෙන් සහ වැසි වතුරෙන් සිදු වූ ජල ගැලීමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන්ට රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2191/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භූමිතෙල් මෙරටට ආනයනය කිරීමේදී භූමිතෙල් ලීටරයක් වෙනුවෙන් රජය විසින් අයකරනු ලබන ආනයන බද්ද කොපමණද;

(ii) භූමිතෙල් සඳහා රජය විසින් ආනයන බද්ද හැර වෙනත් බදු අය කරන්නේද;

(iii) එසේ නම්, එම බදු වර්ග කවරේද;

(iv) එක් ලීටරයක් සඳහා අයකරනු ලබන බදු ප්‍රමාණය, එක් එක් බදු වර්ගය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) භූමිතෙල් ලීටරයක් සඳහා රජය විසින් අයකරනු ලබන මුළු බදු ප්‍රමාණය, භූමිතෙල් ලීටරයක සිල්ලර මිලෙහි කවර ප්‍රතිශතයක්ද;

(ii) භූමිතෙල් සඳහා රජය විසින් අයකරනු ලබන සියලු බදු ඉවත් කළහොත්, පාරිභෝගිකයාට භූමිතෙල් ලීටරයක් ලබා දිය හැකි සිල්ලර මිල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2200/'17

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතුකරයේ පදිංචි ද්‍රවිඩ කම්කරුවන් පවුල් ලක්ෂ 08ක් පමණ මේ දක්වා අඩි 10x12 ලයින් කාමරවල ජීවත්වන බව පිළිගන්නේද;

(ii) ඔවුන්ට නිවාස ලබාදීම සඳහා පසුගිය රජය විසින් ආරම්භ කළ වැඩපිළිවෙළට අනුව 2014.12.31 දින වනවිට ඉදිකර තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් නිවාස ඉදිකර ඇති වතු සහ දිස්ත්‍රික්ක කවරේද;

(iv) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මෙම ව්‍යාපෘතියට වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(v) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ඉදිකළ නිවාස සංඛ්‍යාව, එක් එක් වර්ෂය සහ දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) වතුකරයේ ජීවත්වන ජනතාවට පැවති රජයන් විසින් ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(vii) මෙම නිවාස ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳීමට ගතවන කාලය කොපමණද;

(viii) එම වැඩපිළිවෙළ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2219/'17

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2012 සිට 2016 දක්වා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව;

(i) ලැබූ මුළු ආදායම;

(ii) උතුරු සහ නැගෙනහිර පළාත්වලින් ලැබූ ආදායම;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල පිහිටි ප්‍රධාන සහ උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උතුරු පළාතේ වවුනියාවේ සිට කන්කසන්තුරෙ දක්වා පිහිටි ප්‍රධාන හා උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) මැදවච්චියේ සිට තලෙ මන්නාරම දක්වා පිහිටි ප්‍රධාන හා උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) උතුරු පළාතේ දුම්රිය ස්ථානවල සේවයේ නියුතු දුම්රිය ස්ථානාධිපතිවරු හා සේවකයන් අතරින් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් සේවය කරනු ලබන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පළමුවැනි පන්තියේ නිදන මැදිරි සහිතව ධාවනය වන දුම්රිය ගමනාන්තයන් කවරේද;

(ii) යාපනය දක්වා ගමන් කරන දුම්රියවල පළමුවැනි පන්තියේ නිදන මැදිරි නොමැති වීමට හේතුව කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2460/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධාතුසේනපුර, කලාවැව, මහඅක්කරය වත්ත සහ කැළණිවත්ත යන ප්‍රදේශවල කුඹුරු ඉඩම් අක්කර 100 ක පමණ ප්‍රමාණයක් කුරුණෑගල වැවිලි සමාගමකට බදු දී ඇති බවත්;

(ii) මෙම ඉඩමේ අද ගොවීන් ලෙස ගොවීන් දීර්ඝ කාලයක් පුරා ගොවිතැන් කටයුතුවල නියැලෙන බැවින්, වැවිලි සමාගමෙන් මෙම ඉඩම් නිදහස් කර අද ගොවීන්ට සින්නක්කර අයිතිය ලබාදීමට කටයුතු කරන මෙන් ඉපලෝගම ප්‍රාදේශීය ලේකම්වරයා සහ ඉඩම් අමාත්‍යාංශය දැනුවත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඉඩම්වල සින්නක්කර අයිතිය මෙම ගොවීන්ට ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2499/'17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සිටින ස්ත්‍රී, ළමා, තරුණ, සහ වැඩිහිටි ජනගහණය අනුපිළිවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව පවත්වාගෙන යෑම සඳහා 2017 වර්ෂයට අයවැයෙන් වෙන් වූ මුදල කොපමණද;

(iii) එහි වර්තමාන ක්‍රියාකාරිත්වය කවරේද;

(iv) ප්‍රචණ්ඩත්වය හේතුවෙන් අසරණ වී දිවි ගෙවන කාන්තාවන්ට නිවාස හා වෙනත් සහන ලබා දීමට 2017 වර්ෂය සඳහා අයවැයෙන් වෙන් වූ මුදල කොපමණද;

(v) එම සහන ලබා දීම ක්‍රියාත්මක වන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ජාතික විගණන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

කොළඹ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය අසාමූහිකරණය කිරීමේ පනත් කෙටුම්පත — කාරක සභාව.

*3.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

සුරැකුම්පත් විනිමය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 11 දිනැති අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 1004 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජුනි 16 දිනැති අංක 1867/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සංශෝධනය කරමින් 2017 දෙසැම්බර් 29 දිනැති අංක 2051/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය යටතේ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 16 දිනැති අංක 2062/47 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2017 දෙසැම්බර් 15 දිනැති අංක 2049/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.03.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 59 සහ 63 වගන්ති සමඟ කියවිය යුතු, 142(2) වගන්තියේ (ද) ඡේදය යටතේ 2017 අංක 2 දරන ඖෂධ ලියාපදිංචි කිරීම (ගාස්තු) නියෝග සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 05 දිනැති අංක 2052/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.04.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*17.

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— පළාත් සභා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව,— 2017 අංක 17 දරන පනතින් සංශෝධිත 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 3අ. (11) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කමිටුව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදුව 2018.03.06 දින පාර්ලිමේන්තුවේදී සභාගත කරන ලද එකී කමිටුවේ වාර්තාව අනුමත කළ යුතු ය.

*18.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතියට යටත්ව 2015.11.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා විගණකාධිපතිවරයා වශයෙන් පත්කර ඇති හෙයින්ද;

විගණකාධිපතිවරයාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;

ජනාධිපතිවරයා විසින් 2017.11.14 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව 2017.12.05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතාට පහත පරිදි වැටුප් හා දීමනා ගෙවීමට අනුමතිය ලබා දී ඇති හෙයින්ද:—

(අ) 2015.11.27 වැනි දින සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව SL - 4 වැටුප් පරිමාණයේ 08 වැනි වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම හා තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීමට;

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව 2016.01.01 වැනි දින සිට වැටුප පරිවර්තනය කිරීමේ දී SL – 4 වැටුප් ක්‍රමය යටතේ එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වැටුප් පරිවර්තනය කර ගෙවීමට; සහ

(ඇ) එකී වැටුප් පරිමාණයට අදාළ වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 (2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති, එච්. එම්. ගාමිණී විජේසිංහ මහතා වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

*19.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5) (අ) ව්‍යවස්ථාව ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදන ලද, 2017 දෙසැම්බර් 04 දිනැති අංක 2048/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 2018.01.23 දින ඉදිරිපත් කරන ලද ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු, මාධ්‍ය උපමාන අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජුනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

24.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

25.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

26.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

27.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

28.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

29.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

30.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

31.

ආලෝකා සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

32.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2018 මැයි මස 08 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1246/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයනු ලැබ තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුදමය තත්ත්වය නිමවන තුරු පානීය ජලය ලබාදීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1330/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සීමාසහිත ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් (LTL) සමාගමෙහි උප සමාගමක් ලෙස LTL ප්‍රොජෙක්ට්ස් සමාගම පිහිටවූ දිනය කවරේද;

(ii) LTL සමාගමට එහි 100% ක අයිතිය තිබේද;

(iii) එහි වර්තමාන අයිතිකරුවන් කවුරුන්ද;

(iv) මේ වනවිට LTL සමාගමට LTL ප්‍රොජෙක්ට්ස් සමාගමේ කොටස් හිමිවී තිබේද;

(v) LTL සමාගම සතු LTL ප්‍රොජෙක්ට්ස් සමාගමෙහි කොටස් අන්සතු කිරීමට හෝ පැවරීමට අයිතියක් ලබා දුන්නේ කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) LTL සමාගමට අයත් සී/ස LTL ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) නමැති උප සමාගම 2006 න් පසු විගණන වාර්තාවන්ට ඇතුළත් වී නොමැති බවත්; ඒ හේතුවෙන් මෙම සමාගමේ ලාභාංශ රජයට නොලැබෙන බවත්;

(ii) මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කර 2006 වසරේ සිට මේ දක්වා රජයට අහිමි වූ ලාභාංශ මුදල් ලබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1408/'16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2016 අයවැයෙහි අංක 182 යෝජනාවට අනුව, ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලයක් (Primary Industry Council) පිහිටුවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය සහ ස්ථානය කවරේද;

(iii) උක්ත අයවැය යෝජනාවෙහි, ප්‍රාථමික කර්මාන්ත කවුන්සිලයක් පිහිටුවීමේ අරමුණු හා ඒ සඳහා වූ වැඩපිළිවෙළ සැකෙවින් පැහැදිලි කරන්නේද;

(iv) මෙම කවුන්සිලයට සම්බන්ධවන විශේෂඥයන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) උක්ත යෝජනාවෙහි සඳහන් වන ශ්‍රී ලංකාවේ දැනට සක්‍රීයව පවත්නා ප්‍රාථමික කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(vi) 2009 යුද ගැටුම් නිමවීමෙන් පසු, උතුරු නැගෙනහිර ඇතුළුව ශ්‍රී ලංකාව තුළ අළුතින් ඇරඹූ ප්‍රාථමික කර්මාන්තයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1742/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි අ.පො.ස. (උ/පෙළ) තාක්ෂණික විෂය ධාරාවෙන් පංති පැවැත්වෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) දැනට බදුල්ල දිස්ත්‍රික්කය තුළ සිටින තාක්ෂණික විෂය උගන්වන ගුරුවරයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් හා දැනට සේවයේ නිරතව සිටින පාසල් කවරේද;

(v) ඉදිරියේදී බදුල්ල දිස්ත්‍රික්කයේ සිසුන් අතර තාක්ෂණික විෂය ප්‍රචලිත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2142/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාවේ අමාත්‍ය ධූර දරන අමාත්‍යවරයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් දරන අමාත්‍යාංශ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් අමාත්‍යවරයා යටතේ ඇති ආයතන හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතන කවරේද;

(iv) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව එක් එක් අමාත්‍යවරයා විසින් ලබා දී ඇති පත්වීම් සංඛ්‍යාව කොපමණද;

(v) පත්වීම් ලබා ගත් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් හා තනතුරු කවරේද;

(vi) එම පත්වීම් ලබාදීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(vii) පත්වීම් ලබාදීමේදී යම් අක්‍රමිකතාවක් සිදුවී ඇත්නම්, අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2206/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ, පුනරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වලයිපාඩු ගම්මානයේ ධීවර පවුල් 300කට අධික සංඛ්‍යාවක් ජීවත්වන බවත්;

(ii) මෙම පවුල් අතරින් පවුල් 100ක් පමණ ඍජුවම ධීවර කර්මාන්තයේද, අනෙකුත් පවුල් වෙනත් රැකියාවලද නිරත වුවද, ප්‍රමාණවත් ආදායමක් නොමැතිව ජීවත් වන බවත්;

(iii) ඉහත සඳහන් ධීවර කාර්මිකයන් දිනපතා කිලෝග්‍රෑම් 1000 කට අධික කකුළුවන් සහ මුහුදු ආහාර නෙළාගෙන ඒවා වෙනත් ස්ථානවලට යවා සකස් කර පිට පළාත්වලට යවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ජනතාවගේ ජීවනෝපාය පිළිබඳව සළකා බලා, එම ප්‍රදේශයේ මුහුදු ආහාර සකස් කරන කර්මාන්ත ශාලාවක් ඉදිකිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2225/'17

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ දිස්ත්‍රික් තැපැල් අධිකාරි කාර්යාලය යුද සමයේදී වසා දැමූ බවත්;

(ii) නැවත පදිංචි කිරීම් කටයුතු ආරම්භ වීමෙන් පසු අනෙකුත් සියලු කාර්යාල නැවත ආරම්භ කළද මෙම කාර්යාලය පමණක් මේ දක්වා ආරම්භ කර නොමැති බවත්;

(iii) එබැවින්, කිලෝ මීටර් 100ක් පමණ ඈතින් පිහිටි වවුනියාව දිස්ත්‍රික් තැපැල් කාර්යාලයට ගොස් තමන්ගේ තැපෑලට අදාළ ගැටලු ඉදිරිපත් කිරීමේ ඉතා අසීරු තත්ත්වයට මුලතිව් දිස්ත්‍රික් ජනතාව මුහුණ දී සිටින බවත්;

(iv) මෙම කාර්යාලය නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් මා විසින් 2017.07.07 දිනැතිව ලිඛිත ඉල්ලීමක් යොමුකළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මුලතිව් දිස්ත්‍රික් තැපැල් අධිකාරි කාර්යාලය ඉතා කඩිනමින් නැවත විවෘත කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2236/'17

ගරු බිමල් රත්නායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2297/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහයක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට සේවයේ නියුතු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් සේවයේ නියුතු ග්‍රාම නිලධාරී වසම් කවරේද;

(iv) දැනට එම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2302/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) එය පවත්වාගෙන ගිය කාල වකවානුව කවරේද;

(iii) එම කාර්යාලයට අනුයුක්තව සේවය කළ කාර්ය මණ්ඩලය කොපමණද;

(iv) අදාළ කාලසීමාව තුළ එම කාර්යාලයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) වැඩිදුර විමර්ශනය සඳහා එක් එක් ආයතනයට එම පැමිණිලි යොමු කළ ආකාරය කවරේද;

(vi) අදාළ කාල සීමාව තුළ එම කාර්යාලයේ නඩත්තු සඳහා දරන ලද වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2347/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, මධ්‍යම පළාත් සභාව යටතේ පාලනයවන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) දැනට එම පාසල් අතරින්, වැඩබලන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) දැනට දිස්ත්‍රික්කයේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මාතලේ දිස්ත්‍රික්කයේ විදුහල්පති පුරප්පාඩු හා ගුරු පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2415/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් එක් එක් මැතිවරණ කොට්ඨාසය අනුව කවරේද;

(iii) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව මේ දක්වා දිස්ත්‍රික්කයේ දියුණු කරන ලද වැව් හා ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iv) රේඛීය අමාත්‍යාංශය මඟින් වයඹ පළාත් වාරිමාර්ග සංවර්ධනය කිරීමට මෙම වර්ෂය සඳහා රුපියල් මිලියන 400ක් මුදා හැර ඇතත්, අදාළ සංවර්ධන කටයුතු මේ වනතෙක් ආරම්භ කර නොතිබීම හේතුවෙන්, එම මුදල් යළි භාණ්ඩාගාරයට යැමේ අවදානමක් මතු වී ඇති බව දන්නේද;

(v) එසේ නම්, එම මුදල් දිස්ත්‍රික්කයේ වැව් සංවර්ධනය සඳහා යොදා ගැනීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2439/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රට තුළ සමෘද්ධි සහනාධාරය ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා 2017 අයවැයෙන් වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(iii) එම ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් දීප ව්‍යාප්ත සමීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(iv) එම සමීක්ෂණය සඳහා සහභාගී වූ නිලධාරීන්ට යම් දීමනාවක් ලබා දුන්නේ නම්, ඒ කවර පදනමක් මතද;

(v) එම සමීක්ෂණයේ අරමුණ කවරේද;

(vi) එම සමීක්ෂණය සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2446/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නො. 25/14, මරදාන වත්ත, හැඳල, වත්තල ලිපිනයෙහි පදිංචි ආර්. ජයබාල් මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි සීමාසහිත සෙලින්කෝ රියැල්ටි ඇන්ඩ් කොන්සොලිඩේටඩ් සමාගමේ රුපියල් මිලියනයක්, වසර තුනකට තැන්පත් කර එයින් ලැබෙන පොලී ආදායමෙන් ජීවත් වූ බවත්;

(ii) මෙම මුදල සඳහා ගෙවිය යුතු පොලිය වරින් වර අක්‍රමවත්ව ගෙවා ඇති බවත්;

(iii) මූලික තැන්පතු මුදලින් ඉතිරිව ඇති රු. 525,000/- ක මුදල කල් පිරීම මත ආපසු ගෙවීමට නියමිත වුවද, කොපමණ ඉල්ලීම් කළද සමාගම විසින් එම මුදල ආපසු ලබා නොදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත කී සමාගම ඇතුළු මෙබඳු තවත් සමාගම් රාශියක් මේ අයුරින් තැන්පත්කරුවන්ට වංචා කිරීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2466/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කලාවැව ගම්මානයේ පවුල් 2500 ක් පමණ ජීවත් වන බවත්;

(ii) මෙම ගම්මානය, දිස්ත්‍රික්කයේ ජනාකීර්ණ සහ ඉතා සීග්‍රයෙන් නාගරීකරණය වෙමින් පවතින ගම්මානයක් වීම හේතුවෙන් මෙහි අතුරු මාර්ග හා කානු පද්ධති පිළිවෙළට සකස් කිරීම අත්‍යවශ්‍ය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 මැයි මස 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1332/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් නමින් ආයතනයක් තිබුණේද;

(ii) එම ආයතනයේ නම වෙනස් කර තිබේද;

(iii) එසේ නම්, එහි වර්තමාන නම කවරේද;

(iv) සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමට අයත් කොටස් බෙදී ගොස් ඇත්තේ කෙසේද;

(v) ESOT (භාරය) කොටස්කරුවන් සතුව ඇති කොටස් පාලනය කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(vi) එහි කොටස්කරුවන්ගේ නම් හා ඔවුන් සතුව ඇති කොටස් සංඛ්‍යාව පිළිබඳ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(vii) සේවකභාර ගිවිසුම් අනුව, එය පිහිටුවා කොපමණ කාලයක් ඇතුළත ඔවුන්ගේ කොටස් පිළිබඳව හා ඔවුන් කොටස්කරුවන් බව දන්වා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ESOT සමාගමෙහි ආරම්භක කොටස්කරුවන් කවුරුන්ද, ඔවුන් සතුව තිබූ කොටස් ප්‍රමාණය කොපමණද;

(ii) එම කොටස්කරුවන් අතර ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් සිටින්නේද;

(iii) එසේ නම්, ඔවුන්ට ලැබෑදියාව පිළිබඳව පිළිගැටුම තිබෙන බව එතුමා පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) COPE වාර්තාවේ සඳහන් පරිදි සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමෙන් රුපියල් දස ලක්ෂ 232 ක ලාභාංශ ප්‍රමාණයක් ලංකා විදුලිබල මණ්ඩලයට නොගෙවා තිබෙන බව දන්නේද;

(ii) මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1619/’17

ගරු හේෂාන් විතානගේ මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ සීඝ්‍රයෙන් දියුණු වන ඇඹිලිපිටිය නගරය තුළ ව්‍යාපාරික ඉඩම් සඳහා හිමිකම් ලබාදීමේ ගැටලුවක් පවතින බව පිළිගන්නේද;

(ii) එසේ නම්, නිවැරදි අයුරින් ඉඩම් හිමිකම් ලබාදීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම නගරයේ ඉඩම් සම්බන්ධයෙන් විහාරස්ථානයක් අයිතිවාසිකම් ප්‍රකාශ කරන බැවින්, ව්‍යාපාරිකයන් තමන්ගේ ව්‍යාපාරික ස්ථාන තුළ ගොඩනැගිලි ඉදිකිරීම සිදු නොකරන බව දන්නේද;

(ii) මෙම විහාරස්ථානයට මෙකී ඉඩම් සම්බන්ධයෙන් සත්‍ය වශයෙන්ම ඇති හිමිකම කවරේද;

(iii) වසර ගණනාවක සිට මෙම නගරය තුළ අදාළ ව්‍යාපාරික ස්ථාන භුක්ති විඳිමින් සිටින ව්‍යාපාරිකයන්ට ඒවායේ හිමිකම් ලබාදීමටත්, තම ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ව්‍යාපාරික ප්‍රජාවට පහසුකම් සැපයීමටත් පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1651/’17

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නියුක්තව සිටින මුළු නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරින්ගේ නම්, තනතුරු නාම සහ සේවා ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දැනට අධ්‍යාපන පරිපාලන සේවයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා පුරප්පාඩු පවතින සේවා ස්ථාන කවරේද;

(iv) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය විසින් තරඟ විභාග පවත්වා තිබේද;

(v) එසේ නම්, එම විභාගයෙන් සමත් වූ අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(vi) එම පිරිසට පත්වීම් ලබාදීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1729/’17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දේශීය හා විදේශීය අධ්‍යාපන කටයුතු සඳහා ශ්‍රී ලාංකිකයන්ට ජනාධිපති අරමුදල මඟින් පූර්ණ හෝ අර්ධ ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ අනුව ඒ සඳහා සුදුස්සන් තෝරා ගනු ලබන පදනම හා ක්‍රමවේදය කවරේද;

(iii) අ.පො.ස. (උසස් පෙළ) ඉහළම ලකුණු ලබාගන්නා ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමවේදයක් තිබේද;

(iv) පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා උපාධිධාරින්ට ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමවේදයක් තිබේද;

(v) ඉහත (iii) සහ (iv) හැර වෙනත් දේශීය හෝ විදේශීය ශිෂ්‍යත්ව ලබාදීමේ ක්‍රමවේදයක් තිබේද;

(vi) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(vii) වර්ෂ 2005 සිට 2017 දක්වා ඉහත (iii) සහ (iv) හි සඳහන් ක්‍රමවේදවලට පරිබාහිරව, දේශීය හෝ විදේශීය ශිෂ්‍යත්ව ලබාගත් පුද්ගලයන්ගේ නම්, මුදල, ආයතන හා විදේශ රටක් නම්, එම රටෙහි නම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1735/’17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදේශීය විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපනය සඳහා යන ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් වෙනුවෙන් වසරකට වැයවෙන මුදල සඳහා ශ්‍රී ලංකාවේ විදේශ මුදල් සංචිතයට දැරීමට සිදුවන බර කොපමණද;

(ii) පෞද්ගලික විදේශ සංචාරයන් සඳහා විදේශගතවන පුද්ගලයන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ මුදල් සංචිතයට වසරකට දැරීමට සිදු වන බර කොපමණද;

(iii) ශ්‍රී ලංකාවෙන් යැවෙන වෙළඳ භාණ්ඩ හෝ සේවාවන් වෙනුවෙන් ලංකාවට අයවිය යුතු විදේශ මුදලින් කොපමණ මුදලක් නොලැබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1755/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගොඩ ඉඩම් නොමැති පුද්ගලයන්ට තම කුඹුරු ඉඩමෙන් පර්චස් 10ක කොටසක් ගොඩකර නිවසක් ඉදිකර ගැනීමට අවසර ලබාදීම දීර්ඝ කාලයක සිට පැවති බව දන්නේද;

(ii) දැනට ගොඩ ඉඩම් අහිමි පුද්ගලයන්ට තම කුඹුරු ඉඩමෙන් පර්චස් 10 ක පමණ කොටසක් ගොඩකර නිවසක් ඉදිකිරීම සඳහා ලබා දී තිබූ අවස්ථා අහිමි කර ඇති බව පිළිගන්නේද;

(iii) එමනිසා දිවයිනේ විවිධ ප්‍රදේශවල ඉඩම් නොමැති විශාල පිරිසක් අසරණ තත්ත්වයකට පත්ව සිටින බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුඹුරු ඉඩමෙන් පර්චස් 10ක ප්‍රමාණයක් ගොඩකර ගැනීම සඳහා මේ වනවිට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට අයදුම් කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම පුද්ගලයන්ට ඉතා කඩිනමින් එම පර්චස් 10ක කුඹුරු ඉඩම් ගොඩකර ගැනීමට අවස්ථා සලසා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1866/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිරි වර්ෂ 03 ඇතුලත ආරම්භ කිරීමට නියමිත කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ව්‍යාපෘතීන්හි ඉදිකිරීමට අපේක්ෂිත නිවාස ඒකක සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම නිවාස ව්‍යාපෘති සඳහා නිශ්චිත ඉඩම් හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘති සඳහා වැය කිරීමට අපේක්ෂිත මුළු මුදල කොපමණද;

(ii) මේ සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන පවතින්නේ නම්, ඒවා කවරේද;

(iii) රාජ්‍ය හා පෞද්ගලික ආයෝජනවලින් ඉදිකරනු ලබන නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ව්‍යාපෘති අවසන් කිරීමට බලාපොරොත්තු වන දින වකවානු කවරේද;

(v) මෙම නිවාස ව්‍යාපෘතිවල නිවසක මුළු වටිනාකම කොපමණද;

(vi) එම නිවාස ජනතාවට ලබාදීමේ වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2590/'17

ගරු නිහාල් ගලප්පත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේදී පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වූ සියලුම ශිෂ්‍යයන්ට ශිෂ්‍යාධාර මුදල් ලබාදෙන්නේද;

(ii) එක් ශිෂ්‍යයෙකුට මසකට ලබාදෙන ශිෂ්‍යාධාර මුදල කොපමණද;

(iii) ශිෂ්‍යාධාර ලබා දීම සඳහා මසකට වැයවන මුළු මුදල කොපමණද;

(iv) 2016 වර්ෂයට අදාළ ශිෂ්‍යාධාර මුදල් ගෙවා තිබේද;

(v) 2017 වර්ෂයේ කවර මාසය දක්වා ශිෂ්‍යාධාර මුදල් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍යාධාර මුදල් ලබාගැනීම සඳහා පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වීමට අමතරව වෙනත් සුදුසුකම් අවශ්‍ය වන්නේද;

(ii) එසේ නම්, එම සුදුසුකම් කවරේද;

(iii) එම සුදුසුකම්වලට අදාළ නිර්ණායක සකස් කර ඇති වර්ෂය කවරේද;

(iv) අතිරේක සුදුසුකම් නොසලකා පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් ශිෂ්‍යයන් සියලු දෙනාට ශිෂ්‍යාධාර මුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 මැයි මස 10 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

837/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ නගරයේ මධ්‍යම බස්නැවතුම, ගුණසිංහපුර පෞද්ගලික බස් නැවතුම හා බැස්ටියන් මාවතේ පිහිටි පෞද්ගලික බස් නැවතුම යන ස්ථානයන්හි බස්රථවලින් කප්පම් ලබා ගන්නා බවත්;

(ii) මත්ද්‍රව්‍ය හා වෙනත් අයථා ක්‍රියාවන්ට සම්බන්ධ පුද්ගලයන් තම ව්‍යාපාර කටයුතු සඳහා මෙම ස්ථාන යොදා ගන්නා බවත්;

(iii) මෙම ස්ථානයන්හි දේශීය හා විදේශීය මගීන් සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත අයථා ක්‍රියාවන්හි යෙදෙන පුද්ගලයන් මැඩලීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, 2016 වර්ෂය තුළ අත්අඩංගුවට ගත් සහ නීති මඟින් කටයුතු කළ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම ස්ථානයන්හි ආරක්ෂාවට පොලීසිය යොදවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම බස් නැවතුම්වල වැසිකිළි ඇතුළු යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට පියවරගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1247/’16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයනු ලැබ තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුදමය තත්ත්වය නිමවන තුරු පානීය ජලය ලබා දීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1550/’17

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 205ට අනුව, යන්ත්‍ර සඳහා ආයෝජනය කරමින් දැනට පවත්නා ව්‍යාපාර පුළුල් කිරීම සඳහා නවීකරණ දිරිගැන්වීමට බදු සහන ලබාදුන් ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(ii) උක්ත යෝජනාවට අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් බදු සානුබලයන් ලබාදුන් ව්‍යවසායකයන්ගේ නම් සහ ලිපිනයන් ඉදිරිපත් කරන්නේද;

(iii) උක්ත බදු සහනය ලබාගත් ව්‍යාපාර විසින් ආයෝජනය කරන ලද යන්ත්‍ර සූත්‍ර කවරේද;

(iv) මෙම නවීකරණ ව්‍යාපෘතිය මඟින් බදු ගණනය කිරීමේදී සැලකිල්ලට ගත් ඇති කරන ලද නව රැකියා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1759/'17

ගරු වජිරින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළිකසළ ප්‍රශ්නය විශාල ගැටලුවක් වී තිබෙන බව පිළිගන්නේද;

(ii) මෙම කැළිකසළ ගැටලුව විසඳීමට පළාත් පාලන ආයතන වෙත අමාත්‍යාංශය ලබාදෙන සහන හා ආධාර කවරේද;

(iii) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මත ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන පළාත් පාලන ආයතන කවරේද;

(iv) කැළිකසළ ප්‍රශ්නය විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2207/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ පිහිටා තිබෙන වැව් 11ක් ආශ්‍රිතව පවුල් 750ක් පමණ මිරිදිය මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන බවත්;

(ii) මෑතක සිට පවතින දැඩි නියඟය හේතුවෙන් මෙම පවුල්වල ජීවනෝපාය මුළුමනින්ම පාහේ අහිමි වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ජනතාවගේ ජීවනෝපාය පිළිබඳ අවධානය යොමු කර, යම් වන්දියක් ලබා දීමට හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ලබා දිය හැකි සහනය කවරේද

(iii) එම සහනය ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2231/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට වයඹ පළාතේ, පුත්තලම හා කුරුණෑගල දිස්ත්‍රික්කවලින් වාර්තා වූ ළමා අපයෝජන සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිදුවීම් වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) එම සිදුවීම් සම්බන්ධව ජාතික ළමාරක්ෂක අධිකාරිය ගෙන ඇති පියවර කවරේද;

(iv) ඉදිරියේදී වයඹ පළාත තුළ සිදුවන ළමා අපයෝජන අවම කිරීම සඳහා අමාත්‍යාංශය ගැනීමට බලාපොරොත්තු වන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2237/'17

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2298/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ ජීවත්වන පවුල් අතරින් දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වන පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පවුල්වල ජීවන මට්ටම උසස් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2303/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.08.01 වැනි දින වනවිට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය (FCID) මගින් විමර්ශන අවසන් කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද එක් එක් විමර්ශන වාර්තා නීතිපති දෙපාර්තමේන්තුවට ලැබුණු දින වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඒ අතරින් මේ වනවිට නඩු ගොනු කර ඇති පැමිණිලි සංඛ්‍යාව කවරේද;

(iii) ඒ එක් එක් නඩුව ගොනු කළ දිනය හා නඩුව විභාග වන අධිකරණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2404/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) මාතලේ දිස්ත්‍රික්කයේ පාසල්වල උග්‍ර විද්‍යා, ගණිත සහ ඉංග්‍රීසි ගුරු හිඟයක් පවතින බව දන්නේද;

(iv) එසේ නම්, එම විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු පවතින පාසල් සංඛ්‍යාව සහ එම පාසල්වල නම් කවරේද;

(v) මාතලේ දිස්ත්‍රික්කයේ පවතින විද්‍යා, ගණිත සහ ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2416/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නිකවැරටිය, මාගල්ලේ වැව යටතේ වගා කරන මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) මෙම වැවේ, වැව් රක්ෂිතයේ අනවසර පදිංචිකරුවන් පදිංචිව සිටින බව දන්නේද;

(iii) එසේ නම්, එම පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙසේ අනවසර පදිංචිකරුවන් රැඳී සිටීම නිසා වැවට දරුණු හානි සිදුවන බව දන්නේද;

(v) එසේ නම්, එම අනවසර පදිංචිකරුවන් ඉවත් කර මෙම වැව සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2440/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් ප්‍රාථමික හා ද්විතීක පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසල්වලින් මධ්‍යම රජයට අයත් පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රත්නපුර දිස්ත්‍රික්කයේ,

(i) 2010 වර්ෂයේ සිට මේ දක්වා 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් හා අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) විභාගය සමත් හා අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඉංජිනේරු හා වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iv) සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය ශිෂ්‍යයන් අතර ඉහත විභාග සමත් සහ අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2467/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේදී පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පලාගල - නැගම්පහ මාර්ගයේ ආරම්භ කළ "විජයගම" රණවිරු ගම්මානය 2013 වර්ෂයේ දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ජනතා අයිතියට පත් කර ඇති බවත්;

(ii) මෙම ගම්මමානයේ වන අලින් නිතර ගැවසීම හේතුවෙන් ගම්මානයේ පදිංචිකරුවන්ගේ එදිනෙදා කටයුතු සිදු කර ගැනීම පවා ඉතාමත් අනතුරුදායක තත්ත්වයක පවතින බවත්;

(iii) මෙම ගම්මානය වටා අලිවැටක් ඉදි කිරීමට යෝජනා කර ඇතත්, මෙතෙක් එය සිදු කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගම්වාසීන්ගේ ආරක්ෂාව සඳහා කඩිනමින් අලිවැටක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2474/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා පොළී අනුපාත වැඩි වීම, රුපියල අවප්‍රමාණ වීම සහ විදේශ විනිමය පාලනය ලිහිල් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවෙන් බැහැර වූ ඩොලර් ප්‍රමාණයේ වටිනාකම කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2501/'17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන සංරචක වන කෘෂිකර්මාන්තය, කර්මාන්ත අංශය හා සේවා සැපයීම 2016 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයට දායකවීමේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) 2016 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයට සේවා අංශයේ දායකත්වය රුපියල් මිලියන කොපමණද;

(iv) එම සේවා ගණයට අයත් වී ඇති නව සංරචක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2013 සිට 2016 වර්ෂය දක්වා කොටස් වෙළඳපොළ මිල දර්ශකය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත දර්ශකය තවදුරටත් පහළ යෑම වළක්වා ගැනීම සඳහා 2017 වර්ෂයේ දී කරඇති යෝජනා කවරේද;

(iii) 2016 ජනවාරි, ජූනි සහ සැප්තැම්බර් යන මාසවල ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි අගය කවරේද;

(iv) 2015 සහ 2016 වර්ෂවල පළමු භාගය තුළ ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය කවරේද;

(v) කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය කොපමණද;

(vi) 2015 සහ 2016 වර්ෂවල රාජ්‍ය අංශයේ හා ස්වයං රැකියාවල නියුක්තවූවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 මැයි මස 11 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

134/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014.01.01 දින සිට 2015.06.30 දින දක්වා කාලය තුළ අත්අඩංගුවට ගනු ලැබූ නීතිවිරෝධී ලෙස මෙරටට ගෙනෙන ලද දුම්වැටිවල වටිනාකම කොපමණද;

(ii) එම දුම්වැටි සමඟ අත්අඩංගුවට ගෙන වැරදිකරුවන් වූ අයගේ නම්, ලිපින, දුරකථන අංක හා විදේශිකයෙක් නම් රට කවරේද;

(iii) ඉහත (ii) හි සඳහන් පුද්ගලයන්ට දුන් දඬුවම් එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) අත්අඩංගුවට ගන්නා නීතිවිරෝධී දුම්වැටි නීතිමය ක්‍රියාමාර්ගයන්ගෙන් පසු විනාශ කරන්නේද;

(ii) එසේ නම්, දුම්වැටි විනාශ කිරීමේ ක්‍රියාපිළිවෙළ කවරේද;

(iii) නොඑසේ නම්, එම දුම්වැටි රජයේ බඳුවලට යටත්ව වෙළෙඳ පොළට නිකුත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1176/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයේදී, සීමාසහිත ලංකා රෝහලේ කොටස් හිමියෙකු ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම කාල පරිච්ඡේදය තුළදී සීමාසහිත ලංකා රෝහලේ සභාපති ලෙස ඒ මහතා ලබාගත් වැටුප් සහ දීමනා කවරේද;

(iii) වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය තුළ සීමාසහිත ලංකා රෝහල වාර්තා කළ වාර්ෂික ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1192/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1983 වර්ෂය වනවිට මන්නාරම දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1378/'16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 132ට අනුව, පොලොන්නරුව, කිලිනොච්චිය සහ රත්නපුර (ඇඹිලිපිටිය) දිස්ත්‍රික්කයන්හි සුවිශාල ගබඩා තුනක් ඉදිකිරීමට සහ මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉදිවන ගබඩාවේ වැඩ නිම කිරීමට රුපියල් මිලියන 1000 ක් වෙන් කළ බව පිළිගන්නේද;

(ii) මන්නාරම දිස්ත්‍රික්කයෙහි ඉදිකෙරෙන ගබඩාවෙහි මුල් පිරිවැය ඇස්තමේන්තුව සහ මේ දක්වා වූ එහි ප්‍රගති සමාලෝචන වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කිලිනොච්චිය, ඇඹිලිපිටිය හා පොලොන්නරුවෙහි නව ගබඩා සංකීර්ණ තුන ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය කවරේද;

(iv) 2016 අයවැය යෝජනා අංක 132 වෙනුවෙන් වෙන් කළ රුපියල් මිලියන 1000 ක මුදල වැය කළ ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1476/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ලංකාව තුළ ක්‍රියාත්මක වන පෞද්ගලික විදුලිබල ජනන සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට එම එක් එක් සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දුන් විදුලි ඒකක සංඛ්‍යාව සහ එම එක් සමාගමකට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වත්මන් යහපාලන රජය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සිදු කරනු ලබන විදුලි ජනනය වැඩි කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1578/’17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රටේ සමස්ත බදුවලින් 57 %ක් අයකර ගනු ලබන්නේ ශ්‍රී ලංකා රේගුව විසින් බවත්;

(ii) ඉන් වැඩි බදු ප්‍රතිශතයක් වාහන ආනයන බදු බවත්;

(iii) බදු නොගෙවීමට වාහන ආනයනකරුවන් විවිධ උපක්‍රම භාවිතා කරන බවත්;

(iv) දැනට නිකුත් කර ඇති අති විශේෂ ගැසට් නිවේදනවලට අමතරව, 2015.02.10 දිනැති අංක 1901/3 ගැසට් නිවේදනය මඟින්ද, මෙම තත්ත්වය මඟ හැරවීමට නියෝග පනවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත්, 2015.09.22 දිනැති අංක 1933/6 ගැසට් නිවේදනයෙන් ජාවාරම්කරුවන්ට රිසි ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලබා දී ඇති බවත්;

(ii) අ (iv)හි සඳහන් ගැසට් නිවේදනයෙන් ලබා දුන් අධිකාරි බලය මත රේගු නිලධාරින් අනාවරණය කරගත් මිල අඩුවෙන් සඳහන් වාහන 1000 සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කළහොත්, රු.මිලියන 8000කට අධික ආදායමක් අය කර ගත හැකි බවත්;

(iii) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝගය අනුව 2016.09.21 දින සියලු රේගු පරීක්ෂණයන් තාවකාලිකව අත්හිටුවා දැනට මාස 04ක් ගතවීමෙන් රටට විශාල ආදායමක් අහිමි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, අ (iv)හි සඳහන් නියෝගය අවලංගු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1602/’17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඇන්ටේ ලෙකෝ ප්‍රයිවට් ලිමිටඩ් (Ante Leco (Pvt.) Ltd.) ආයතනය පිළිබඳ රජයට ඇති අයිතිය කවරේද;

(ii) එම ආයතනය ආරම්භ කරන ලද අරමුණ කවරේද;

(iii) එම සමාගම විසින් නිෂ්පාදනය කර ඇති විදුලි මීටර් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සමාගමේ සේවක සංඛ්‍යාව කොපමණද;

(v) ආරම්භයේ සිට එම සමාගම ලබා ඇති ලාභය හෝ පාඩුව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8\.

1605/'17

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කෙරවලපිටිය ප්‍රදේශයේ ඉදිකර ඇති බර ඉන්ධන (HFO) මඟින් දැනට ක්‍රියාත්මක වන බලාගාරය වසරක කාලයක් තුළ ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) මඟින් ක්‍රියාත්මක කරවීම සඳහා එකඟතාවයක් තිබුණේද;

(ii) එම එකඟතාවය කඩ වී තිබේද;

(iii) එම එකඟතාවය කඩවීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවී ඇති අලාභය කොපමණද;

(iv) එකී බලාගාරය මඟින් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දෙන විදුලි ඒකකයක මිල නියම කිරීමට අදාළව ඇතිකර ගන්නා ලද එකඟතාවයන්ට පටහැනිව කටයුතු සිදුවන බව දන්නේද;

(v) ගිවිසුම් ප්‍රකාරව විදුලි සැපයුම්කාර සමාගම ක්‍රියා කිරීම තහවුරු කිරීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(vi) එම එකඟතාවය පරිදි කටයුතු නොකිරීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදු වී ඇති පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9\.

2131/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා වෛද්‍ය උපාධිය හැදෑරීම සඳහා විදේශගත වූ ශ්‍රී ලාංකික සිසුන් සංඛ්‍යාව;

(ii) ඔවුන් ඇතුලත් වූ විදේශ වෛද්‍ය පීඨ සහ ඒවාට ඇතුලත් වූ සිසුන් සංඛ්‍යාව;

(iii) එම විදේශ වෛද්‍ය අධ්‍යාපනය නිසා රටට අහිමි වූ විදේශ විනිමය ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10\.

2201/'17

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වතුකරයේ ජීවත්වන ලක්ෂ 08කට ආසන්න ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් වතුකරයේ රෝහල් රජයට පවරා ගැනීමේ වැඩපිළිවෙළක් පසුගිය රජය විසින් ක්‍රියාත්මක කළ බව පිළිගන්නේද;

(ii) එම වැඩපිළිවෙළ අනුව, 2014 වර්ෂය අවසන් වනවිට එලෙස රජයට පවරාගෙන ඇති වතු රෝහල් සංඛ්‍යාව, රෝහලේ නම සහ පවරාගත් කාලවකවානුව කවරේද;

(iii) මේ වනවිට එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන බව පිළිගන්නේද;

(iv) මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශය වාර්ෂිකව වැයකළ මුදල ඉදිරිපත් කරන්නේද;

(v) වතුකරයේ සෞඛ්‍ය තත්ත්වය නඟාසිටුවීමට මෙම ව්‍යාපෘතිය මඟින් විශාල පිටුවහලක් වූ බැවින් එය කඩිනමින් නැවත ආරම්භ කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2214/’17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළොන්නාව අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි එකම බාලිකා ජාතික පාසල කොළොන්නාව බාලිකා විද්‍යාලය බවත්;

(ii) මේ වනවිට එම විද්‍යාලයේ අඩුපාඩු රැසක් පවතින බවත්;

(iii) ගුරු පුරප්පාඩු 18ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු 08ක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පුරප්පාඩු පැවතීම විද්‍යාලයේ ඉදිරි ප්‍රගතියට හා කීර්තියට බාධාවක් සහ හානියක් බව පිළිගන්නේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඇති සැලසුම් කවරේද;

(iii) ඒ සඳහා පියවර ගනු ලබන දිනය කවරේද;

(iv) 2017 වර්ෂයේදී මෙම විද්‍යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා ලබාදී ඇති ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ප්‍රතිපාදනවලින් දැනට සිදු කර ඇති වැඩසටහන්වල ප්‍රගතිය කවරේද;

(vi) 2018 වර්ෂයේ මෙම විද්‍යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබා දීමට සැලසුම් කර තිබේද;

(vii) එසේ නම්, එම ප්‍රතිපාදන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2227/’17

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ඉහත සේවාවල සේවයේ නියුතු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රත්නපුර දිස්ත්‍රික්කයේ ඉහත එක් එක් සේවාවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2285/'17

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගියදා සිදුවූ නායයෑමෙන් හා ගංවතුරෙන් මාතර දිස්ත්‍රික්කයේ නිවාස හා දේපල හානි වූ පවුල් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ගංවතුර උවදුරෙන්, මියගිය හා අතුරුදහන් වූවන්ගේ සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත ජීවිත හා දේපල හානි වෙනුවෙන් ගෙවිය යුතු වන්දි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) දැනට ගෙවා ඇති වන්දි ප්‍රමාණය හා තවදුරටත් ගෙවිය යුතු වන්දි ප්‍රමාණය කොපමණද;

(v) මෙතෙක් නොගෙවා ඇති වන්දි ගෙවීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2300/'17

ගරු ඩී. වී. චානක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 ජනවාරි 08 දින සිට මේ දක්වා කාලය තුළ වර්තමාන ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා සඳහා නව වාහන ආනයනය කර තිබේද;

(ii) එසේ නම්, එම වාහන කවරේද;

(iii) ඒවායේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2677/'17

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2018 අයවැයෙන් නාවික ක්ෂේත්‍රය, විදේශීය සමාගම්වලට 100%ක් විවෘත කිරීමට කළ යෝජනාවට එකඟ වන්නේද;

(ii) ලංකා නැව් ඒජන්තවරුන්ගේ සංගමය (CASA) විසින් රජයේ වගකිවයුතු නිලධාරීන්ට ලිපියකින් දන්වා ඇති පරිදි, මෙම විවෘත කිරීම නැවැත්වීමට කටයුතු කරන්නේද;

(iii) නැව් සමාගම් ඒකාධිකාරී වීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

පා.11/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

2.

පා.12/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

3.

පා.13/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

4.

පා.14/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩසටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

5.

පා.15/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශ්වයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශ්වයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

6.

පා.16/'15

ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

7.

පා.17/'15

ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවම කිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

8.

පා.18/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පිරිමි පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම,— පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පිරිමි පොලිස් නිලධාරින් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

9.

පා.19/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම,— රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

10.

පා.21/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සහතිකවීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම් ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

11.

පා.22/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකිරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා ඍජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

12.

පා.23/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

13.

පා.24/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

14.

පා.25/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

15.

පා.26/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

16.

පා.27/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මඟ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

17.

පා.28/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

18.

පා.29/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

19.

පා.30/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

20.

පා.31/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට (20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

21.

පා.32/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

22.

පා.33/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

23.

පා.34/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

24.

පා.35/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

25.

පා.36/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

26.

පා.37/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික සහ ජාත්‍යන්තර අනාගත ඉල්ලුමට සරිලන ලෙස නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම,— ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාවගේ අනාගත ඉල්ලුමට සරිලන කාර්මික සහ කෘෂිකාර්මික නිෂ්පාදනයන් පිළිබඳව පුරෝකථනයක් කර අදාළ නිෂ්පාදනයන්ට අනුබද්ධිත සියලුම ක්ෂේත්‍රවල අන්තර් සම්බන්ධතාවයක් තුළින් ද, නවීන තාක්ෂණය උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ද, නිෂ්පාදන ක්‍රියාවලිය වර්ධනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

27.

පා.38/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික උරුමයන් රැකගැනීම සඳහා ඩිජිටල් පුස්තකාලයක් ඇති කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කරමින්, පෝෂණය කර අනාගත පරම්පරාව වෙත රැගෙන යාම සඳහා ද, ජාන සම්පත් හා ජෛව උරුමයන් අපහරණය වැළැක්වීම සඳහා පුළුල් ජාතික වැඩපිළිවෙළක් අවශ්‍යව ඇති බැවින් ද, පරිසරය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, කෘෂිකර්මාන්තය හා සම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු සියලු ක්ෂේත්‍රයන් සඳහා ඩිජිටල් තාක්ෂණය උපයෝගී කරගත් නවීන පුස්තකාලයක් සකස් කිරීමට ද, ඒ සඳහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO), ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාංශය, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ඒකකය ඇතුළු සියලු අංශ ඒකාබද්ධවූ වැඩපිළිවෙළක් සකස් කිරීමට ද පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

28.

පා.39/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම ආරක්ෂා කර ගැනීම සඳහා වූ ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කිරීම,— ශ්‍රී ලාංකික ජනතාවගේ පාරම්පරික දැනුම භාවිතා වන වෛද්‍ය ක්‍රම, කෘෂිකර්මාන්තය, ආහාර සංරක්ෂණය, හස්ත කර්මාන්ත අංශය ඇතුළු විවිධ ක්ෂේත්‍රයන්හි පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම සඳහා අදාළ ක්ෂේත්‍රයන් නියෝජනය කෙරෙන ජනතාවගෙන් තොරතුරු ලබාගෙන, ජෛව විවිධත්ව ඒකකය, බුද්ධිමය දේපළ කාර්යාංශය ඇතුළු අදාළ අංශ ඒකාබද්ධව ජාතික වැඩපිළිවෙළක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

29.

පා.40/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට ආවේණික හා ඖෂධමය වටිනාකම්වලින් යුතු ශාකවල ජාන සම්පත්වලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම,— විදේශීය රටවල් ශ්‍රී ලංකාවට ආවේණික වටිනා ඖෂධමය ශාකවල සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් හඳුනා ගෙන, ඒවාට වංචනික ලෙස පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම වැළැක්වීම සඳහා අදාළ සක්‍රිය රසායනික ද්‍රව්‍ය සහ ජාන සම්පත් සඳහා ශ්‍රී ලංකාවට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමටත්, ඖෂධ නිෂ්පාදනයට සහ වැඩි දියුණු කිරීමට එම කොටස් යොදා ගැනීමටත්, ජෛව විවිධත්ව අංශය, බුද්ධිමය දේපළ කාර්යාංශය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇතුළු වගකිවයුතු සියලු ආයතන එක්ව විශේෂ වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

30.

පා.41/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතා නියෝජිතයින්ගේ ගරු නාම අත්හැරීම,— ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු පාර්ලිමේන්තු, පළාත් සභා, ප්‍රාදේශීය සභා නියෝජනය කරන සියලුම ජනතා නියෝජිතයන් මාසිකව තමන් කරන සේවයට අදාළව වැටුප් හා / හෝ දීමනා ලබා ගන්නා අතර ඉහත කිසිදු ධූරයක් නිස්සරණධ්‍යාසයෙන් සිදු කරනු ලබන ගරු සේවයන් නොවන බැවින් ද, එම ධූර දරන්නන්ගේ නමට ඉදිරියෙන් හෝ ධූරයට ඉදිරියෙන් අතිගරු, ශ්‍රීමත් හෝ ගරු යන නාම සහ නමට පසුව උතුමාණන්, මැතිතුමා යන පද යෙදීම උපහාසයට ලක්වීමට හේතුවක් වී ඇති බැවින් ද, ජනතා නියෝජිතයන්ගේ ගරු නාම භාවිතය නතර කිරීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

31.

පා.42/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීම,— විවිධ පාර්ශ්වයන් විසින් වැඩිහිටි පුරවැසියන් නොසලකා හැරීම තුළින් සිදුවන විවිධ අසාධාරණයන් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සමාජ සේවා අමාත්‍යාංශයේ වැඩිහිටි ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩසටහන පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

32.

පා.43/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි ප්‍රජාව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායක කර ගැනීමට ණය දීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවට තම ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරගනිමින් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයට දායකවීමට බැංකු පද්ධතිය මගින් ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම ඔවුන්ට සමාජය තුළ වෙනත් අකාරයකට සැලකීමක් වන හෙයින් එම අසාධාරණ තත්ත්වය වැළැක්වීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

33.

පා.44/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති පුද්ගලයින් සමාජය තුළ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීම,— සමාජ ආර්ථික ක්‍රියාවලියේ ප්‍රගමනය උදෙසා තම ශ්‍රමය කැප කර වයස අවුරුදු 60 ඉක්මවීමෙන් පසු සමාජය තුළ නිසි පිළිගැනීමක් නොමැතිව අක්‍රීයව කොන්වී සිටින වැඩිහිටියන්, සමාජයේ සක්‍රීය පුද්ගලයින් බවට පත් කිරීමේ වැඩපිළිවෙළක් සකස් කිරීමට පාසල් ප්‍රජාව ඇතුළු මුළු මහත් සමාජයම දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

34.

පා.45/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

35.

පා.46/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

36.

පා.47/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25 - 30ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

37

පා.48/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව සෘජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරින් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රීය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

38.

පා.49/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතියික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මඟින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

39.

පා.50/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මඟින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

40.

පා.51/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන්ගේ පර්යේෂණ නිබන්ධන අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කර සකස් කිරීම,— විශ්වවිද්‍යාල සහ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිසුන් විසින් තම පාඨමාලා සම්බන්ධයෙන් ඉදිරිපත් කරන පර්යේෂණ නිබන්ධන රටේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා සංවර්ධන කටයුතුවලට උපයෝගී කර ගැනීම වැදගත් වන බැවින් එම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරු හා පර්යේෂණ නිබන්ධන අදාළ වන අමාත්‍යාංශ අතර මනා සම්බන්ධීකරණයක් ඇති කිරීම සඳහා එකී අමාත්‍යාංශයේ නිලධාරියෙකු පත්කිරීමෙන් එම පර්යේෂණ නිබන්ධන මඟින් අමාත්‍යාංශයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සහ කාලීන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

41.

පා.52/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— වයස අවුරුදු 18 සම්පූර්ණ වන අවස්ථාවේදීම ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කිරීම,— මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂිකව ඡන්ද හිමි නාමලේඛන සංශෝධනය කිරීමට නියමිත දිනට පසුව හෝ පෙර දිනකදී වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ට නියමිත වයස සම්පූර්ණ වූ දිනටම ඡන්ද හිමි නාමලේඛනයෙහි නම ඇතුළත් කරවා ගත හැකි ආකාරයේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

42.

පා.53/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව සේලයින් විශාල ප්‍රමාණයක් භාවිතා කරනු ලබන අතර සේලයින් ආනයනය කිරීම සඳහා ද විශාල මුදලක් වාර්ෂිකව විදේශීය රටවලට ඇදී යන බැවින්, එම විදේශ විනිමය ප්‍රමාණය රට තුළ ඉතිරි කර ගැනීමේ අරමුණ ඇතිව ලංකාව තුළ පවත්නා දේශීය තාක්ෂණය යොදාගෙන සේලයින් නිෂ්පාදනය කිරීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හෝ සමූපකාර අංශයන් සම්බන්ධ කර ගනිමින් ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය මැදිහත් වීමෙන් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

43.

පා.54/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් ඇති කිරීම,— ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව විශාල ප්‍රමාණයක පොල් වතුර අපතේ යන බැවින්, නව තාක්ෂණය යොදා ගනිමින් විධිමත් ක්‍රමවේදයක් යටතේ පොල් වතුර ආශ්‍රිතව නව නිෂ්පාදනයන් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

44.

පා.55/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සාගරයේ නව සම්පත් ගවේෂණය,— විශාල සාගර කලාපයක් හිමි රටක් වූ ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා දී ඇත්තේ ධීවර කර්මාන්තය සඳහා පමණක් වන අතර සාගරය ආශ්‍රිතව විශාල ප්‍රමාණයක සවභාවික සම්පත් ඇති බැවින් මෙරටට විශාල රැකියා අවස්ථා ප්‍රමාණයක් මෙන්ම ධනයක් ද උපයා ගැනීමේ අරමුණ ඇතිව සාගර සම්පත් පිළිබඳව විධිමත් වැඩිදුර අධ්‍යයනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

45.

පා.56/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ මත්ස්‍ය සම්පත විදේශිකයින් විසින් නෙලා ගැනීම වළකාලීම,— ශ්‍රී ලාංකික ධීවරයන්ට විශාල ආර්ථික අවාසියක් ඇති කරමින් ශ්‍රී ලංකා මුහුදු කලාපයේ මත්ස්‍ය සම්පත් විදේශිකයින් විසින් නෙලා ගන්නා බැවින් ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ මාළු ඇල්ලීමට සහ විදේශ යාත්‍රාවලට මාළු බෑම සඳහා තොටුපලක් ලෙස භාවිතා කිරීම වළකාලීම සඳහා රජය විසින් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

46.

පා.57/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කොස් නිෂ්පාදනය වැඩි කර ඒ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කිරීම,— ඉතා ප්‍රනීත මෙන්ම ඖෂධීය ගුණයෙන් අනූන, රසායනික ද්‍රව්‍යවලින් තොරව වගා කළ හැකි බෝගයක් වන කොස් වගාව ව්‍යාප්ත කිරීම තුළින් ඒ ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නංවා ඒවා අපනයනය කිරීම මඟින් විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අප රටට උපයා ගත හැකි බැවින් ඒ සඳහා රජයේ මැදිහත්වීමෙන් විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

47.

පා.58/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ගොවි සම්මාන උළෙලක් වාර්ෂිකව සංවිධානය කිරීම,— රටක් පෙරට යාමට නම් මූලික වශයෙන් ගොවිතැනින් සශ්‍රීක විය යුතු බැවින් රට සරු කරන ගොවි ජනතාවට සිය වෘත්තිය පිළිබඳ අභිමානයක් ඇතිවන පරිදි විධිමත් සංවිධාන ව්‍යුහයක් හරහා ක්‍රියාත්මක වන ගොවි සම්මාන උළෙලක් රජයේ මැදිහත්වීමෙන් වාර්ෂිකව සංවිධානය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

48.

පා.59/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සහන මිලකට LED බල්බ පාරිභෝගික ජනතාවට ලබාදීම,— නිවාස ආලෝක කිරීමට යොදා ගන්නා ගුණාත්මක LED බල්බ මිල අධික බැවින්, විදුලිබල මණ්ඩලය මැදිහත්වී සහනදායී මිලකට හා ගෙවීමේ ක්‍රමයට මෙම බල්බ පාරිභෝගික ජනතාවට ලබාදී ජාතික වශයෙන් විදුලිය විශාල ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමටත්, LED බල්බ ජනතාව අතර ජනප්‍රිය කිරී මඟින් විදුලිබල මණ්ඩලයටද අමතර ආදායමක් උපයා ගැනීමටත් හැකිවන පරිදි ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැකසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

49.

පා.60/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සුළු පරිමාණ සෙල්ලම් බඩු කර්මාන්තශාලා ව්‍යාප්ත කිරීම,— ශ්‍රී ලංකාව තුළ සෙල්ලම් බඩු සඳහා විශාල වෙළඳපොළක් පැවතුණ ද, රට තුළ ඒවා නිෂ්පාදනය කෙරෙන්නේ සුළු වශයෙන් වන අතර ඒ සඳහා චීනය ප්‍රමුඛ අනෙකුත් රටවලට විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ඇදී යන බැවින්, සුළු පිරිවැයක් දැරිය යුතු මෙම කර්මාන්තය ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාප්ත කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

50.

පා.61/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ඖෂධ නිෂ්පාදනය දැනට ඉතා අවම මට්ටමක පවතින අතර ඖෂධ ආනයනය සඳහා වසරකට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවන බැවින් දියුණු මානව සම්පතක් හිමි රටක් ලෙස ශ්‍රී ලංකාවට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග රට තුළම නිපදවීමට අවශ්‍ය පහසුකම් රජය මැදිහත් වීමෙන් ලබා දී ඖෂධ නිෂ්පාදන කර්මාන්ත ශාලා ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

51.

පා.62/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් විෂය නිර්දේශයට මනෝ විද්‍යාව විෂයය ඇතුළත් කිරීම,— පාසල් ශිෂ්‍ය ප්‍රජාව නිරෝගී මනසකින් යුත් බුද්ධිමත් තීරණ ගැනීමට හැකි පිරිසක් ලෙස හැඩගැස්වීම උදෙසා හය වැනි ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක වන පරිදි බෞද්ධ මනෝ විද්‍යාව සහ බටහිර මනෝ විද්‍යාව යන විෂයයන් ඒකාබද්ධ කොට ක්‍රමවත්ව සැලසුම් කරන ලද "මනෝ විද්‍යාව සහ භාවනාව" නමින් විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

52.

පා.63/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවීම,— විශ්‍රාමිකයන් වෙනුවෙන් උපදේශන සේවා, වෛද්‍ය පහසුකම් සහ දිවා සුරැකුම් සේවා යනාදී වැඩිහිටියන්ට අවශ්‍ය සුබසාධන කටයුතු රැසක් එකම ස්ථානයකින් ඉටු කර ගැනීමට හැකි වන පරිදි විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන ගොඩනැංවීමටත්, එම මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් යම් නිෂ්පාදන කටයුත්තක් සඳහා විශ්‍රාමිකයන් යොමු කිරීම හරහා ඔවුන්ගේ දිවියට සහනයක් ලබාදෙන අතර අමතර ආදායමක් ද උපයා ගැනීමට හැකි වන ලෙස රජය මැදිහත් වීමෙන් රටපුරා විශ්‍රාමික ආධාරක මධ්‍යස්ථාන පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

53.

පා.64/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්‍රාමිකයන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නව ලොතරැයියක් හඳුන්වා දීම,— විශ්‍රාමික රාජ්‍ය සෙවකයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට සහ ඔවුන්ගේ සුබසාධන කටයුතු සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම සඳහා නව ලොතරැයියක් වෙළඳපොළට හඳුන්වාදීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

54.

පා.65/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක මගපෙන්වන්නන් පුහුණු කිරීම,— සංචාරකයින්ට ඵලදායී හා ආචාරශීලී සේවාවක් සැපයීමට හැකි පිරිසක් බවට පත් කිරීමට මෙන්ම, ඔවුන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීම සඳහාත් සංචාරක මග පෙන්වන්නන් පුහුණු කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

55.

පා.66/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සම්බන්ධව පවතින නීති සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඉඩම්වලට ව්‍යාජ ඔප්පු සකසා විකිණීමේ ජාවාරමක් ක්‍රියාත්මකවන අතර මීට අදාළව නීතිය ක්‍රියාත්මක වීම ද ඉතා අවම මට්ටමක පවතින බැවින්, ඉඩම් අයිතිය සම්බන්ධව සුරක්ෂිතභාවය වැඩි වන අයුරින් හා වැරදිකරුවන්ට දැඩි දඬුවම් පැමිණවිය හැකි අයුරින් පවතින නීති පද්ධතිය සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

56.

පා.67/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව අවට සාගරයේ කොරල්පර ආරක්ෂා කර ගැනීම,— ශ්‍රී ලංකාව අවට සාගරයේ ඇති කොරල්පර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශවීමේ තර්ජනයට මුහුණපා ඇති බැවින්, එම කොරල්පර ආරක්ෂාකර ගැනීම සඳහා මිනිස් ක්‍රියාකාරකම් පාලනය කිරීමට හැකිවන පරිදි පුද්ගල ආකල්පමය වෙනසක් මෙන්ම, නෛතික රාමුවේ වෙනසක් ඇති කිරීම සඳහා විද්වත් කමිටුවක් හරහා සුදුසු වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

57.

පා.68/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් වෑන් රථ සඳහා කාන්තාවන් සේවයට යෙදවීම,— පාසල් වෑන් රථ සේවයෙහි ගුණාත්මක බව වැඩි කිරීමටත්, එම වෑන් රථවල ගමන් කරන දරුවන්ගේ ආරක්ෂාව උදෙසාත් සියලුම පාසල් සේවා වෑන් රථවල සේවය සඳහා කාන්තාවන් යොදා ගැනීම අනිවාර්ය කිරීමට නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

58.

පා.69/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ මිල පහත හෙළීම,— ශ්‍රී ලංකාව තුළ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කර ඖෂධීය නාමයෙන් බෙහෙත් අලෙවි කිරීම කඩිනමින් ආරම්භ කිරීම මඟින් ඖෂධ මිල පහත හෙළීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

59.

පා.70/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය හරහා අලෙවි කරන ඖෂධ ඇතුළු ජාවාරම් මැඩපැවැත්වීම,— මේ වන විට අන්තර්ජාලය හරහා ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවන්‍ය නිෂ්පාදන විශාල ලෙස අලෙවි කෙරෙන අතර මෙම ජාවාරම් අප රටේ ජනතාවගේ සෞඛ්‍යයට සහ යහපැවැත්මට විශාල තර්ජනයක් වන බැවින් ඒවා මැඩපැවැත්වීම සඳහා නිසි වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

60.

පා.71/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතා නොකර වගා කිරීම,— අධික විෂ සහිත කෘෂි රසායන ද්‍රව්‍ය ශ්‍රී ලංකාව තුළ තහනම් කර පැරණි ක්‍රමයට පරිසර හිතකාමී වගා ක්‍රමයක් රටට හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ සිදුකිරීමට කෘෂි විද්‍යාඥයන් හා පරිසරවේදීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඔවුන්ගෙන් ලබා ගන්නා නිර්දේශ තුළින් ජනතාවට වස විසෙන් තොර සෞඛ්‍යාරක්ෂිත ආහාර වේලක් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත්වීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

61.

පා.72/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමෙන් මුදවා ගැනීම,— මේ වන විට ශ්‍රී ලංකාව තුළ පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමේ වැඩි ප්‍රවණතාවයක් නිර්මාණය වී ඇති බැවින් පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලින් මුදවාගැනීම සඳහා රජය මැදිහත්වී විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

62.

පා.73/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඵලදායිතා කමිටුවක් පත් කිරීම,— රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඵලදායිතා වැඩසටහන්හිදී තම ආයතන ඉතා ඉහළ ඵලදායිතා මට්ටමක් කරා මෙහෙයවූ ආයතන ප්‍රධානීන් හඳුනාගෙන ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ප්‍රයෝජනයට ගත හැකි වන ආකාරයෙන්, එම ආයතනවල ක්‍රියාත්මක කරන ලද

වැඩසටහන් සහ ක්‍රමවේද අනෙකුත් ආයතනවලට ගැලපෙන පරිදි ආදේශ කිරීමට හැකිවන පරිදි එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත ජාතික ඵලදායීතා කමිටුවක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

63.

පා.74/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රජා වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංගයක් වන ප්‍රජා වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ අංශය දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම හා එම ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

64.

පා.76/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිභෝජනයට නුසුදුසු ආහාර වෙළඳපොළට ඒම වැළැක්වීමට කටයුතු කිරීම,— පරිභෝජනයට නුසුදුසු ආහාර නිෂ්පාදනය කරන, අලෙවි කරන හා ඊට අනුබල දෙන පුද්ගලයන් හා ආයතන වැටලීමට පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විශේෂ වැටලීම් ඒකකයට පවතින ගැටලු නිරාකරණය කර අවශ්‍ය පහසුකම් නොඅඩුව ලබා දීමටත්, වැරදිකරුවන්ට උපරිම දඬුවම් ලබා දිය හැකි වන පරිදි පවතින නීති පද්ධතිය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

65.

පා.77/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිමත් කිරීම,— ආහාර හා සම්බන්ධ නිෂ්පාදන කටයුතුවල දේශීයව නිරතව සිටින නිෂ්පාදකයින් ඉලක්ක කර ගනිමින් ගුණාත්මක බවින් ඉහළ, සෞඛ්‍යාරක්ෂිත ආහාර පාරිභෝගිකයන්ට ලබා දීම තුළින් රටට කළ හැකි සේවාව පිළිබඳව දැනුවත් කර, ආකල්පමය වෙනසක් ඇති කිරීමට හා එලෙස වස විසෙන් තොර ආහාර නිපදවන ව්‍යවසායකයින්ට ගෞරව නාමයක් සහිත සම්මාන ප්‍රදානය කොට ඔවුන් දිරිගැන්වීමට වැඩසටහනක් රජය මැදිහත්වී ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

66.

පා.78/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අයථා ලෙස අත්පත් කරගත් අභයභූමිවලට අයත් ඉඩම් නිදහස් කරගැනීම,— ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කර ඇති අභයභූමිවලට අයත් ඉඩම් විවිධ පුද්ගලයන් හා සංවිධාන විසින් නීති විරෝධී ලෙස අත්පත් කරගෙන ඇති බැවින්, එම ඉඩම් නැවත ලබා ගැනීමට රජය කඩිනමින් මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

67.

පා.79/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආදිවාසී ජනයා නගාසිටුවීම සඳහා සැලසුමක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට වාසය කරන ආදිවාසී ජනතාව පිළිබඳ වෙනම සංගණනයක් සිදුකර, ඔවුනට ජීවත් වීම සඳහා දැනට පවතින අපහසුතා ක්‍රමවත්ව හඳුනාගෙන, ඔවුනට ගෞරවනීයව ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කර දීමට අවශ්‍ය සාධනීය සැලසුමක් ආදිවාසී නායකයින් ද ඇතුළත්ව පත්කරන ලද විද්වත් මණ්ඩලයක් හරහා ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

68.

පා.80/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි හානි වූ පුරාවස්තු සංරක්ෂණය කිරීම,— තිස් වසරක යුද්ධය හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත් වල පැවති පුරාවස්තු විශාල ලෙස විනාශ වූ අතර පවතින පුරාවස්තු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තොරතුරු රැස්කර ගැනීමත්, එම පුරාවස්තු තහවුරු කිරීම, ආරක්ෂා කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීමත් අරමුණු කර ගෙන විද්වත් පුරාවිද්‍යාඥයින්ගෙන් සමන්විත කමිටුවක් පත්කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

69.

පා.81/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වගා කිරීම සඳහා දේශීය බීජ ප්‍රචලිත කිරීම,— කෘෂි රසායන භාවිතයෙන් තොරව දේශීය කාබනික පොහොර ආශ්‍රයෙන් වගා කළ හැකි දේශීය බීජ වර්ග හඳුනාගෙන එම බීජ කඩිනමින් රට පුරා ව්‍යාප්ත කර රසායනික වස විසෙන් තොර ආහාර ජනතාවට ලබා දීම සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, තාක්ෂණය හා නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

70.

පා.82/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ භාෂා අධ්‍යයනයට පහසුකම් සැපයීම,— පුද්ගල බුද්ධියේ පෘථුල බව තීරණය වීමට ඔහු සතු භාෂා ඥානය ප්‍රධාන සාධකයක් වන බැවින් ඉංග්‍රීසි භාෂාව හැරුණුකොට අනෙකුත් ප්‍රධාන විදේශ භාෂා හැදෑරීමට අවශ්‍ය පහසුකම් පුළුල් කර, සැලසුම් සම්පාදනය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

71.

පා.83/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා වියදම් කරන මුදල් සීමා කිරීම,— ශ්‍රී ලංකාව තුළ පැවැත්වෙන සියලු මැතිවරණයන්හිදී ඇතැම් අපේක්ෂකයන් අති විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරන අතර මුදල් වියදම් කළ නොහැකි, එහෙත් රටට වැඩක් කළ හැකි බුද්ධිමත් පිරිසකට ඉන් අවාසි සහගත තත්ත්වයක් ඇති වන බැවින් මැතිවරණ සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය සීමා කිරීමට හැකි වන ආකාරයේ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

72.

පා.84/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවෙන් රැගෙන ගිය පුරාවස්තු නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැවති සමයේ අප රටින් පෘතුගාලය, ඕලන්දය හා මහා බ්‍රිතාන්‍යයට රැගෙන ගිය පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදු කර එම භාණ්ඩ නැවත අප රටට ලබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

73.

පා.85/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංඝාධිකරණයක් ස්ථාපනය කිරීම,— භික්ෂූන් වහන්සේලාගේ ආරක්ෂාව හා ගෞරවය රැක ගැනීම වෙනුවෙන් උන්වහන්සේලාට අදාළ අධිකරණමය කාර්යයන් සඳහා වෙනම සංඝාධිකරණයක් පිහිටුවිය යුතු බවටත් එම අධිකරණ තීන්දු සඳහා නීතිමය බලය ලබාගැනීමට හැකි වන අයුරින් මෙම සංඝාධිකරණය ස්ථාපනය කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

74.

පා.86/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කිරීම,— පාර්ලිමේන්තුව ඇතුළු ජනතා නියෝජිත ආයතන සඳහා උපදේශකත්වය හා මග පෙන්වීම ලබා දීමට හා අණපනත්වලට සංශෝධන ඉදිරිපත් කළ හැකි නෛතික බලය සහිත සංඝ සම්මුතියෙන් පත් කර ගත් රාජ්‍ය පරිපාලනය, නීතිය, විදේශ කටයුතු හා සමාජ ක්‍රියාකාරකම් පිළිබඳ හසල දැනුමක් සහ අත්දැකීම් සහිත විද්වත් සංඝයා වහන්සේලාගෙන් සමන්විත ව්‍යවස්ථාපිත සංඝ සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

75.

පා.87/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලංකාවේ පැවැති ජල තාක්ෂණය හා වැව් තාක්ෂණය නැවත පණගන්වා රැකගැනීම සහ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කිරීමට හා අධ්‍යාපන පාඨමාලා මගින් උක්ත විෂය ගැන දැනුමින් සන්නද්ධ කරන ලද පිරිසක් නිර්මාණය කිරීමට හැකියාව ඇතිවන පරිදි "වාපි සංස්කෘතික අධ්‍යයන ආයතනය" නමින් ආයතනයක් රජය මැදිහත්වීමෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

76.

පා.88/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මහාවංශය අධ්‍යයනය සඳහා ආයතනයක් පිහිටුවීම,— ශ්‍රී ලාංකීය ඉතිහාසයේ ගමන් මග පෙන්වන මහාවංශය අධ්‍යයනය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ මැදිහත් වීමෙන් "මහාවංශ අධ්‍යයන පර්යේෂණ ජාතික ආයතනය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

77.

පා.89/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ විරෝධී ක්‍රියා නැවැත්වීම,— ධර්ම ග්‍රන්ථ හා ප්‍රකාශන අධ්‍යයනය කිරීමේ මනා දැනුමක් ඇති නෛතික බලයක් සහිත විද්වත් සංඝ මණ්ඩලයක් පිහිටුවීම මගින් යම් නිර්මාණයක් එළිදැක්වීමට පෙර එය එම මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, සමාජගත කිරීමට නුසුදුසු නම්, සංශෝධන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි යාන්ත්‍රණයක් සැකසීම මගින් බෞද්ධ විරෝධී ක්‍රියා හා ප්‍රකාශන රචනා වීම හා බුදු දහම සම්බන්ධ කරමින් සාවද්‍ය නිර්වචන ඉස්මතුවීම නැවැත්වීම සඳහා රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

78.

පා.90/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශ හිතෛෂී කලා නිර්මාණ ඇගයීම,— දේශානුරාගය හා ආත්මාභිමානය ඇතිවන පරිදි දේශීය හා සංස්කෘතික වටිනාකමින් අනූන කලාකෘති වාර්ෂිකව ඇගයීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

79.

පා.91/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විනය නැංවීමට කටයුතු කිරීම,— ශ්‍රී ලංකාවේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සෞඛ්‍ය සම්පන්න, නිරෝගී හා කායිකව ශක්තිමත් පුරවැසියන් ලෙස සමාජගත කිරීමේ අරමුණින් ඔවුන්ට තමා කැමති ක්‍රීඩාවකට යොමු වීමට සහ ප්‍රායෝගික විනය පුහුණුවකට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

80.

පා.92/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති බෞද්ධාගමික ස්ථාන, ඒ හා සබැඳි අනුෂංගික අංශයන් මෙන්ම, භික්ෂූන් වහන්සේලා පිළිබඳ තොරතුරු ආදී කරුණු එක් රැස් කර විධිමත්ව පරිගණක ගත කර, නවීන තාක්ෂණික උපකරණ සහ ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් වලින් පිරිපුන් "බෞද්ධ සංස්කෘතික තොරතුරු මධ්‍යස්ථානය" නමින් ආයතනයක් රාජ්‍ය අනුග්‍රහයෙන් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

81.

පා.93/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දහම් පාසල් පාඨ ග්‍රන්ථ කාලානුරූපීව සංශෝධනය කිරීම,— විභාග ඉලක්ක කරගත්, දැනුම පමණක් කේන්ද්‍රගත කළ පාඨ ග්‍රන්ථ වෙනුවට ප්‍රායෝගික පුහුණුව පදනම් කරගත්, බුද්ධිය වර්ධනය කරන්නාවූ, ශිෂ්ට සම්පන්න සමාජයක් නිර්මාණය කිරීම ඉලක්ක කර ගත් පාඨ ග්‍රන්ථ විද්වත් මණ්ඩලයක් හරහා සම්පාදනය කර දහම් පාසල් වෙත ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

82.

පා.94/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාත්‍යන්තර පාසල් නියාමනයට මණ්ඩලයක් පත් කිරීම,— ශ්‍රී ලංකාවේ සංස්කෘතියට, සදාචාරයට හා සමාජ පැවැත්මට ගැලපෙන පරිදි ජාත්‍යන්තර පාසල්හි විෂය පථයන් අවශ්‍ය පරිදි නියාමනය කළ හැකි පූර්ණ බලතල සහිත මණ්ඩලයක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

83.

පා.95/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රීය කිරීම,— දේශීය ඉතිහාස දැනුම, සාරධර්ම සම්පන්න බව, නිෂ්පාදන ශක්‍යතාව, බුද්ධි සම්පන්න බව, සම්ප්‍රදායික දැනුම, දේශානුරාගය, නිරෝගීතාව, කුසලතා පූර්ණ බව සහ ආකල්ප සම්පත්තියෙන් යුතු බව යන අංගයන්ගෙන් පරිපූර්ණ සාර්ථක පුරවැසියෙකු බිහි කල හැකි වන පරිදි සකසන ලද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් හරහා සමස්ත අධ්‍යාපන ක්‍රමයේම පරිවර්තනයක් ඇති කිරීමට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වඩාත් සක්‍රිය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

84.

පා.96/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීම,— සෞඛ්‍ය සේවාවේ අත්‍යාවශ්‍ය අංශයක් වන පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ ක්ෂේත්‍රය තුළ දැනට පවතින ගැටලු නිරීක්ෂණය කර ඒවා කඩිනමින් නිරාකරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමටත් එම පවුල් වෛද්‍යාවේදය පිළිබඳ විශේෂඥ සේවාව දියුණු කිරීමට සැලසුම් කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

85.

පා.97/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සේවය විදේශයන්ට ලබා දීම,— ආයුර්වේද වෛද්‍ය උපාධිය සම්පූර්ණ කරන උපාධිධාරීන්හට විදේශ රටවල රැකියා අවස්ථා ලබාදීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

86.

පා.98/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කිරීම,— දැනට පවතින යල් පැන ගිය ආයුර්වේද වෛද්‍ය පනත සංශෝධනය කර ආයුර්වේද වෛද්‍යවරුන්ගේ වෘත්තීය ගැටලු විසඳමින්, එම වෘත්තිය සතු ගරුත්වය හා අභිමානය රැක ගැනීමට නව ආයුර්වේද වෛද්‍ය පනතක් කඩිනමින් ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

87.

පා.99/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ දුම්රිය ආරක්ෂක පද්ධති නිර්මාණය කළ නව නිපැයුම් කරුවන් ද, එම ක්ෂේත්‍රයට සම්බන්ධ විද්වතුන් ද, දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන්ගෙන් ද සමන්විත කමිටුවක් මගින් දුම්රිය ආරක්ෂක පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

88.

පා.100/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම,— බස් මගී ප්‍රවාහන සේවයේ ගුණාත්මක තත්ත්වය වැඩි කිරීම මඟින් වාර්ෂිකව එම සේවාව ප්‍රතික්ෂේප කරන 1% - 2% ක් පමණ වූ මගීන් ප්‍රමාණය රඳවා ගැනීමට කටයුතු කිරීමෙන්, එම සේවයේ පැවැත්මට දීර්ඝ කාලීනව ඇති විය හැකි අවදානම අඩු කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

89.

පා.101/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සිංහල භාෂාවට සම්මතයක් සකස් කිරීම,— සිංහල භාෂාවේ ලිඛිත ව්‍යවහාරය හා කථන ව්‍යවහාරය දෙයාකාරයක් ගන්නා අතරම න, ණ, ල, ළ භේදය, අල්පප්‍රාණ, මහප්‍රාණ අක්ෂර යෙදීම සහ පද බෙදීම ආදිය ද විවාද සහිත බැවින් සිංහල භාෂාව සඳහා සම්මතයක් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර කාලානුරූපව සිදුවන වෙනස්කම් ද සැලකිල්ලට ගෙන භාෂාවේ පැවැත්ම තහවුරු කිරීමට හැකි ක්‍රියාදාමයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

90.

පා.102/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංස්ථානික කාබනික අපද්‍රව්‍ය මඟින් පරිසරය දූෂණය වීම පාලනය කිරීම,— පළිබෝධ නාශක සහ කර්මාන්ත ක්‍රියාවලියන්හි දී පිටවන සංස්ථානික කාබනික අපද්‍රව්‍ය (Persistent Organic Pollutants - POPs) දොළොස් වර්ගයක දූෂණ කාරකයන්ගෙන් සමන්විත අතර ඒවා මිනිසාගේ සෞඛ්‍යයට ඉතා අහිතකර බැවින් එම රසායනිකයන් පරිසරයට මුදා හැරීම පාලනය කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

91.

පා.103/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පාලනයට සම්බුද්ධ දර්ශනය සම්බන්ධ කර ගැනීම,— සප්ත අපරිහානීය ධර්ම, දසරාජ ධර්ම, රාජෝවාද ජාතකය, කුරු ධර්ම ජාතකය, ගන්ඩ තින්දුක ජාතකය, තෙසකුර ජාතකය, දේවධර්ම ජාතකය, සතර සංග්‍රහ වස්තු, චක්කවත්ති සීහනාද සූත්‍රය හා ධර්ම ප්‍රදීපිකාව යන සම්බුද්ධ ඉගැන්වීම් සම්බන්ධව පාර්ලිමේන්තු, පළාත් සභා හා ප්‍රාදේශීය මට්ටමේ සිටින සියලුම පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ භූමිකාව රටේ යහපාලනයට දායක කර ගැනීමට හැකි වන ආකාරයේ වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

92.

පා.104/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම,— ෆ්ලොරසන්ට් බල්බ, දුරකථන, ජංගම දුරකථන, විදුලි උපකරණ, බැටරි, පරිගණක හා එහි කොටස් ආදිය අපද්‍රව්‍ය ලෙස පරිසරයට බැහැර කිරීමේදී ආසනික්, කැඩ්මියම්, රසදිය, ලෙඩ් වැනි බැර ලෝහ පරිසරයට එකතුවන බැවින් මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීමට ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කර පරිසරය සුරැකීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

93.

පා.105/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ යහපාලනය ස්ථාපිත කිරීම,— අයහපත් පාලනයේ අංග ලක්ෂණ වන අත්තනෝමතික ප්‍රතිපත්ති සම්පාදනය, නිලබල වාදය, බලාත්මක නොවන සහ අසාධාරණ නීති, විධායක බලතල අනිසි පරිහරණය, දේශපාලනයට පුරවැසි දායකත්වය අඩුවීම සහ දූෂණය පැතිරීම යන කරුණු අප රට තුළ නොඅඩුව දක්නට ලැබෙන අතර මේ නිසා රටේ අයහපත් පාලනයක් පවතින බව පෙනී යන හෙයින් රට තුළ යහපාලනය ගොඩනැගීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

94.

පා.106/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රටවල ඇති ශ්‍රී ලංකාවට අයත් පුස්කොළ පොත් නැවත ලබා ගැනීම,— ශ්‍රී ලංකාවට අයත් වටිනා පුස්කොළ පොත් රාශියක් යුරෝපා රටවල් ඇතුලු ලෝකයේ රටවල් ගණනාවක තිබෙන අතර ඒවායේ අන්තර්ගතව ඇති දැනුම මේ වන විට වත්මන් ලාංකීය සමාජයට අහිමිව ගොස් ඇති බැවින්, එම පුස්කොළ පොත් අප රටට ආපසු ලබා ගෙන ඒවායේ අඩංගු පෞරාණික දැනුම නැවත සමාජගත කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

95.

පා.107/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජෛව විවිධත්වය රැක ගැනීම සඳහා කෘෂිකර්මය දායක කර ගැනීම,— ඒක බෝග වගාව වෙනුවට බහු බෝග වගාව සහ මිශ්‍ර බෝග වගාව ජනප්‍රිය කරවීම, ජෛව විවිධත්වයට හානිකර රසායන ද්‍රව්‍ය කෘෂි කර්මාන්තයෙන් ඈත් කිරීම හා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ ක්‍රම භාවිතය තුළින් රට තුළ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමට ගොවීන් යොමු කරන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

96.

පා.108/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ජනතාවගේ ආහාර ලැබීමේ අයිතිය සුරක්ෂිත කිරීම,— එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව අයිතිවාසිකම් පද්ධතීන්ට අනුකූලව ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම ශ්‍රී ලාංකික ජනතාවට අහිමි වන තත්ත්වයක් රජයේ ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම් තුළ දක්නට ලැබෙන හෙයින් උක්ත ප්‍රඥප්තීන්ට අනුව රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීමේ වගකීම මුළුමනින්ම රජයට පැවරී ඇති බැවින් රජය මැදිහත්වී ආහාර ද්‍රව්‍ය මිල පාලනය හා සෞඛ්‍ය ආරක්ෂිත ආහාර වේලක් රටේ ජනතාවට ලැබීම සහතික කෙරෙන විධිමත් වැඩ පිළිවෙළක් සම්පාදනය කර ජනතාවගේ ආහාර ලැබීමේ මූලික අයිතිවාසිකම තහවුරු කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

97.

පා.109/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීම,— අකාබනික ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමත්, අකාබනික ද්‍රව්‍ය භාවිතය අවම කිරීමත්, භාවිතයෙන් ඉවත්වන අකාබනික ද්‍රව්‍ය එකතු කිරීමේ යාන්ත්‍රණයක් සැකසීම හා අකාබනික ද්‍රව්‍ය භාවිතා කිරීමේ පරිසර නීති රීති විධිමත් කිරීමත් තුළින් රටේ පරිසර පද්ධතියේ ආරක්ෂාව හා යහපැවැත්ම සඳහා අකාබනික ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

98.

පා.110/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම,— නිරෝගී ජාතියක් ගොඩනැගීම සහ දේශීය ආයුර්වේදයේ යහපැවැත්ම මූලික අරමුණු වශයෙන් ගෙන දේශීය ඖෂධ වර්ග හා අත් බෙහෙත් පිළිබඳ විධිමත් කරුණු සහිත විෂයයක් පාසල් විෂය නිර්දේශයට ඇතුළත් කිරීම මඟින් දේශීය ඖෂධ සහ අත් බෙහෙත් පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

99.

පා.111/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— මාතෘ හා ළමා මන්දපෝෂණය තුරන් කිරීම,— ශ්‍රී ලංකාව තුළ අඩුබර දරු උපත් අනුපාතිකය 25% තරම් ඉහළ අගයක් ගන්නා අතර එයට ප්‍රධාන සාධකය වන්නේ පෝෂ්‍යදායී ආහාර හිඟකම වන බැවින්, මාතෘ හා ළමා මන්දපෝෂණය දුරලීමට අවශ්‍ය පෝෂ්‍යදායී ආහාර දුප්පත් ජනතාවට ලබා දීම ප්‍රමුඛතාවය කරගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

100.

පා.112/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසරය සුරැකීමෙන් නිරෝගී රටක් ගොඩනැගීම,— වර්තමාන ශ්‍රී ලංකාවේ පරිසර දූෂණය ඉහළ යාම හේතුවෙන් ජලයේ හා ආහාරවල විකිරණශීලී බව වැඩි වී ඇති අතර අනාගතයේදී මිනිසාට වැළඳෙන ඇතැම් රෝගවල රෝග නිධානය පවා සොයා ගැනීම අපහසු විය හැකි බැවින්, මේ පිළිබඳ වැඩිදුර විමර්ශනය කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කර වාර්තාවක් කැඳවා, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් රටේ ජනතාවගේ නීරෝගීභාවය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

101.

පා.113/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රටේ ආරක්ෂාවට කෘෂිකර්මය සුරක්ෂිත කිරීම,— ධනවාදයේ තුන්වැනි කාර්තුව වන දෙවැනි ලෝක යුද්ධයෙන් පසු කාලයේදී හරිත විප්ලවයත් සමඟ කෘෂිකාර්මික ජීවන රටාව සම්පූර්ණයෙන්ම වෙනස් වීම හේතුවෙන් වර්තමාන ලෝක ප්‍රජාව මුහුණ දී ඇති පරිසර දූෂණය, නීරෝගී බව නැතිවීම හා පිරිසිදු ආහාර නොමැතිවීම ආදී අවදානම් තත්ත්වයන්ගෙන් ශ්‍රී ලංකාව ආරක්ෂා කර ගැනීම සඳහා ජනතාව තිරසාර කෘෂිකර්ම භාවිතයන්ට පෙළඹවීමෙන් හා ගොවීන් ආරක්ෂා කෙරෙන රාජ්‍ය ප්‍රතිපත්ති රට තුළ ස්ථාපිත කරවීමෙන් රටේ අනාගතය සුරක්ෂිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

102.

පා.114/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සංකීර්ණ ගෝලීය වෙළඳපොළ නිසා ජනතාවට ඇතිවන ගැටලු අවම කිරීම,— ගෝලීයකරණය විසින් හඳුන්වාදුන් ලෝක වෙළඳ රටාව මිනිසාගේ මනස ආක්‍රමණය කිරීම හේතුකොට ගෙන ඔහු පාරම්පරිකව ගෙන ආ හර පද්ධතීන් හා දියුණු දාර්ශනික චින්තනයන් මිනිස් මනස තුළින් උදුරා දැමීම වර්තමානය වන විට ශ්‍රී ලාංකිකයින්ට ද පොදු බැවින්, වෙළඳපොළ ආර්ථිකය තුළ ගොඩනැගෙන සංකීර්ණ ජීවන රටාව හා ඒ සමඟ පැන නගින සංකීර්ණ සමාජීය ප්‍රශ්නත් විසඳා ගනිමින් සහනශීලී දිවි පැවැත්මකට යා යුතු වන්නේ කෙසේද යන්න පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් හා බුද්ධිමය සංවාදයක් රට තුළ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

103.

පා.115/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවට අවශ්‍ය සීනි රට තුළ නිපදවීම,— ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන සීනි නිෂ්පාදනය කිරීමට අවශ්‍ය සම්පත් ශ්‍රී ලංකාව සතුව ඇති බැවින්, මනා කළමනාකාරීත්වයකින්, කාර්යක්ෂමව හා සැලසුම් සහිතව කටයුතු කර රටට අවශ්‍ය සීනි ප්‍රමාණය මෙරට නිෂ්පාදනය කිරීමට හා සීනි පිරිපහදු කිරීමට අවශ්‍ය කර්මාන්තශාලා රජය මඟින් ස්ථාපනය කර සීනි කර්මාන්තය රැක ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

104.

පා.116/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— නකල්ස් රක්ෂිතය ආරක්ෂා කිරීම,— සමස්ත ශ්‍රී ලාංකීය පරිසර පද්ධතියටම බලපෑම් කළ හැකි සංවේදී පරිසර පද්ධතියක් වන නකල්ස් රක්ෂිත වනාන්තරය මේ වන විට මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි තර්ජනයකට ලක්වී ඇති අතර වත්මන් පරපුරට මෙන්ම අනාගත මිනිස් පරපුරට ද මෙම පරිසර විනාශය හේතුවෙන් අවදානමකට මුහුණ පෑමට සිදු වන බැවින්, මිනිස් තර්ජන ඉවත් කර නකල්ස් රක්ෂිතයේ ස්වාධීන පැවැත්ම කඩිනමින් තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

105.

පා.117/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රාවණා රජු පිළිබඳව විධිමත් ගවේෂණයක් සිදු කිරීම,— රාවණා රජු පිළිබඳ නිශ්චිත ඉතිහාස තොරතුරු නැති වුවද, විධිමත් ගවේෂණයක් තුළින් ඔහු පිළිබඳව අප රටේ ආකල්ප නැංවීමටත්, රාවණා රජු සතුව තිබූ දැනුම රටේ අභිවෘද්ධිය සඳහා යොදා ගැනීමට හා ශ්‍රී ලාංකීය ඉතිහාසයේ සැඟවී ගිය පරිච්ඡේදයක් නිරාවරණය කර ගැනීමටත් හැකි වන බැවින්, විද්වත් කමිටුවක් හරහා රාවණා රජු පිළිබඳව ගවේෂණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

106.

පා.118/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— බුද්ධිමය දිළිඳු බව තුරන් කිරීම,— භෞතික වෙළඳ භාණ්ඩ සැරිසරන වේගයට සාපේක්ෂව දැනුම, බුද්ධිය හා මානව හර පද්ධතීන් ජනතාව වෙත ළඟා නොවීම හේතුවෙන් නොදැනුවත්කම හිස එසවීම තුළින් බුද්ධිමය දිළිඳුභාවය අද අප රට තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවක් වුවද, ඒ පිළිබඳව රට තුළ ඇත්තේ අඩු අවධානයක් බැවින්, රටේ ජනතාවගේ බුද්ධිමය දිළිඳු බව නැති කිරීමට සියලු වයස් කාණ්ඩයන් ආවරණය වන පරිදි විධිමත්ව සැලසුම් කරන ලද ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

107.

පා.119/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— කල් ඉකුත් වූ ඖෂධ භාවිතය නැවැත්වීම,— මේ වනවිට ශ්‍රී ලංකාව තුළ කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළට හා රජයේ රෝහල් තුළ භාවිතයට පැමිණීමේ අවදානමක් ඇති බැවින් රජයේ අදාළ සියලු අංශ මැදිහත්වී ක්‍රියාකාරී සැලසුමක් සකස් කර කල් ඉකුත් වූ ඖෂධ වෙළඳපොළෙන් ඉවත් කිරීම හා ආනයනය කිරීම නැවැත්වීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

108.

පා.120/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට හඳුනා නොගත් ඒඩ්ස් රෝගීන් 3000 කට ආසන්න ප්‍රමාණයක් සිටින බවට වාර්තා පළ වී ඇති බැවින් ඔවුන් හඳුනාගෙන ප්‍රතිකාර සඳහා යොමු කිරීමටත්, ඒඩ්ස් රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීමටත් ඵලදායී සුදුසු ව්‍යාපෘතියක් කඩිනමින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

109.

පා.121/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශයන්හිදී ලිංගික අතවරයට ලක්වන කාන්තාවන්ට සහන සැලසීම,— ශ්‍රී ලංකාවේ කාන්තාවන් ගෘහ සේවයට විදේශ ගතවීමෙන් පසු සිදු වන අතවරයන් හේතුවෙන් සිදුවන ගැබ් ගැනීම් නිසා ශ්‍රී ලාංකීය සමාජය තුළ නිර්මාණය වී ඇති ගැටලු සහගත තත්ත්වයන් සමනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරීමට විද්වතුන් හා එම සිදුවීම් හා බැඳුණු පුද්ගල කණ්ඩායම්වලින් සැදුම්ලත් කමිටුවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

110.

පා.122/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත හා අභය භූමිවල ආරක්ෂාව දැඩි කිරීම සඳහා නීති සම්පාදනය කිරීම,— මෑතක සිට ශ්‍රී ලංකාවේ රක්ෂිත වනාන්තර සහ අභය භූමි විනාශය වැඩි වෙමින් පවතින අතර ශ්‍රී ලාංකීය පාරිසරික සමතුලිතතාවට ඉන් දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතින බැවින් මෙම විනාශය නැවැත්වීම සඳහා ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළක් සැකසීමට මෙන්ම පවතින නීති ප්‍රතිපාදන විධිමත් හා දැඩි බවකින් යුක්ත වන ලෙස සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

111.

පා.123/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— විවිධ ආගමික කණ්ඩායම්වලින් සිදු වන සමාජ බලපෑම් පිළිබඳව අධ්‍යයනය කිරීම,— ප්‍රධාන ධාරාවේ ආගමික මතවාදයන් විවේචනය කරමින්, එම ආගම්හි අනු කණ්ඩායම් ලෙස තම නිර්වචන හා පැහැදිලි කිරීම් සමාජගත කරන, නව මතවාද ඉදිරිපත් කරමින් එම මතවාද පිළිගත් පුද්ගලයින් එක් රැස් කර ගන්නා, ආගමික හා වෙනත් මුහුණුවරකින් සමාජගත වී ඇති කණ්ඩායම් පිළිබඳ අධ්‍යයනය කරමින් ඔවුන්ගේ මතවාද, ක්‍රියාකාරීත්වයන් හා සමාජයට ඔවුන් නිසා ඇති වන බලපෑම් කවරාකාරද යන්න පිළිබඳ තක්සේරුවක් ලබා දීමට පිළිගත් ආගමික නායකයන්ගෙන් හා විද්වතුන්ගෙන් සැදුම් ලත් කමිටුවක් පත් කර, වාර්තාවක් කැඳවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

112.

පා.124/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉහළ ප්‍රමිතියෙන් යුත් මැටි භාජන නිෂ්පාදනය කිරීම,— ආහාර පිසීමේදී ගෑස් හා විදුලිය අපතේ නොයන ලෙස ඉක්මනින් තාපය අවශෝෂණය කර ගන්නා මැටි භාජන නිෂ්පාදනය කර වෙළඳපොළට ඉදිරිපත් කිරීමට, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට හා මැටි භාජන භාවිතයෙන් සෞඛ්‍යාරක්ෂිතව ආහාර පිසීමට ඇති හැකියාව පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ජාතික මට්ටමේ වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

113.

පා.125/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයට බුදු දහමින් ආභාෂය ලබා ගැනීම,— බුදුන් වහන්සේගේ සිත පිළිබඳ ඇතැම් විග්‍රහයන් නූතන විද්‍යාවට හසු නොවන තරම් ගැඹුරු බැවින්, ඒ පිළිබඳ පර්යේෂණ කිරීමට හා වර්තමානයේ අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ ඇති ගැටලු සඳහා බුදු දහම ඇසුරින් නිර්වචන හා විසඳුම් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, අදාළ ක්ෂේත්‍රය පිළිබඳ හසල දැනුමක් ඇති දේශීය හා විදේශීය විද්වතුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා, ඒ හරහා බුදු දහම දේශීය හා විදේශීය වශයෙන් ප්‍රචලිත කිරීමටත්, ශ්‍රී ලංකාවේ කීර්ති නාමය ඉහළ නැංවීමටත්, අධිමානසික විද්‍යා ක්ෂේත්‍රයේ පුනරුදයක් ඇති කිරීමටත් රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

114.

පා.126/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කරවීම,— විද්‍යාර්ථීන් අතර පුරාවිද්‍යා විෂයය ජනප්‍රිය කිරීම සඳහා මූලික වශයෙන් පාසල් විෂයය නිර්දේශයට එම විෂයය ඇතුළත් කිරීම හා විශ්වවිද්‍යාලවල පුරාවිද්‍යා විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හා පහසුකම් ලබාදීම සඳහා කටයුතු කිරීමත්, එමගින් පුරාවිද්‍යා විෂයය රට තුළ ව්‍යාප්තවීම හරහා බිහිවන උගතුන්ගෙන් රටට යහපත් සේවයක් ලබා ගැනීමත් අරමුණු කරගත් ජාතික වැඩසටහනක් දිගුකාලීනව සැලසුම් සහිතව නිර්මාණය කිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

115.

පා.127/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආහාරවල ඇති වස විෂ පිළිබඳ සොයා බැලීමට විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවීම,— කෘෂිකර්මාන්තයේදී භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍ය හේතුවෙන් ආහාර ද්‍රව්‍යයන්ට ද වස විෂ මිශ්‍රවී ඇති අතර, ඒ පිළිබඳව සොයා බැලීමට අදාළ ප්‍රමිති ආයතනයක් දැනට ශ්‍රී ලංකාව තුළ පිහිටුවා නොමැති බැවින් එම කාර්යය සඳහා විශේෂ ප්‍රමිති ආයතනයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

116.

පා.128/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින් සිඟමනට යොදාගන්නා දරුවන් පුනරුත්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ යාචකයින් දරුවන් සමඟ සිඟමන් යැදීම තහනම් කර, සිඟමන සඳහා යොදා ගන්නා දරුවන් පුනරුත්ථාපනය කර, ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා අවශ්‍ය ජාතික මට්ටමේ වැඩපිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

117.

පා.129/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීම,— මහා ප්‍රජාපතී ගෝතමී තෙරණීන්වහන්සේගෙන් ඇරඹුණු භාරතීය භික්ෂුණී ශාසනය සංඝමිත්තා තෙරණීන්වහන්සේගේ ලංකාගමනයෙන් ශ්‍රී ලංකාව තුළ මැනවින් ස්ථාපිත වුවද, පසුකාලීනව අභාවයට ගිය බැවින්, මෑත

යුගයේ දී ශ්‍යාමෝපාලි මහා නිකායේ රංගිරි දඹුලු පාර්ශ්වය විසින් යළි ස්ථාපනය කරන ලද අතර, එලෙස ස්ථාපනය කරන ලද භික්ෂුණී ශාසනයට නිසි පිළිගැනීමක් ලබාදීම සඳහා රජය ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන්වහන්සේලා ඇතුලු අදාළ සියළු ක්ෂේත්‍රයන්ගේ මූලිකත්වයෙන් නිසි සංවාදයක් ඇරඹිය යුතු යැයි ද, එම සංවාදය අවසානයේ විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ ශ්‍රී ලංකාව තුළ භික්ෂුණී ශාසනය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වැඩපිළිවෙළක් සැකසිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

118.

පා.130/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව ව්‍යුහාත්මකව විධිමත් කිරීම,— ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාව තුළ සංඝයාවහන්සේලා පාර්ශ්ව ගත වීම හේතුවෙන් ව්‍යුහාත්මකව අසංවිධිත වී ඇති අතර එම නිසා ජාතික හා ජාත්‍යන්තර අභිචාර උපචාරයන්හිදී සංඝයා වහන්සේලා ඒකමතික නොවීම රටට අහිතකර ලෙස බලපාන බැවින් සමස්ථ සංඝ සමාජයේ ඒකමතිකත්වය ඇති කර ගැනීමට හැකි වැඩපිළිවෙළක් සැකසීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

119.

පා.131/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් කිරීම,— ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලාභදායී ආයතනයක් ලෙස ජනතාවාදීව සංවර්ධනය කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට විද්වත් මණ්ඩලයක් පත් කර ඔවුන්ගේ නිර්දේශයන්ට අනුව සංස්ථාවේ පවතින වංචා, දූෂණ හා පරිපාලනමය ගැටලු විසඳා ඵලදායී ජාතික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පරිසරය රජය මැදිහත්ව නිර්මාණය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

120.

පා.132/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඖෂධ සඳහා අවශ්‍ය ප්‍රමාණයට ගංජා වැවීමට දේශීය වෛද්‍යවරුන්ට අවසර ලබා දීම,— ඉන්දියාවේ සිට රහසිගත මාර්ග ඔස්සේ රට තුළට ගෙන්වන රසායනික ද්‍රව්‍ය මිශ්‍රිත ගංජා භාවිතා කර නිපදවන දේශීය ඖෂධවල ගුණාත්මක බව අඩුවන බැවින්, ආයුර්වේද ඖෂධ නිපදවීමේදී තම ඖෂධවල ගුණාත්මක බව ආරක්ෂා කර ගැනීම සඳහා ගංජා අත්‍යවශ්‍ය ඖෂධයක් ලෙස යොදා ගන්නා රජයේ පිළිගත් ආයුර්වේද වෛද්‍යවරුන්ට සීමාවන් සහිතව ගංජා ශාකය වැවීමට අවසර ලබාදීම සඳහා අවශ්‍ය නීති සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

121.

පා.133/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීම,— එළවළු තොග වෙළඳාමේදී ක්‍රියාත්මක වන කප්පම් ගැනීම හා මිල තීරණය කිරීම් ආදී ක්‍රියා හරහා ගොඩනැගී ඇති සංවිධානාත්මක වෙළඳ ඒකාධිකාරයන් නිසා එළවළු ගොවීන්ට සාධාරණ මිලක් ලබා දීමට මෙතෙක් ක්‍රියාත්මක කළ සැලසුම් අසාර්ථක වී ඇති බැවින්, ගොවියාට සාධාරණ මිලක් ලබා දීමේ මූලික අරමුණ කරගත් බලපෑම් වලින් තොර වෙළඳපොළක් රාජ්‍ය වෙළඳ ආයතන මැදිහත්වී නිර්මාණය කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

122.

පා.134/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන් හා පාසල් වෑන් රථ රියැදුරන් යන පිරිස් සඳහා දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේදයන් තුළින් සරළව පැහැදිලි කර, රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම සඳහා දරුවා සමාජ අභියෝගයන් හමුවේ ආරක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සංවාදයක් පැවැත්වීමට ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

123.

පා.135/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කාන්තාවන්ට ඇතිවන පීඩාවන් අවම කිරීම,— වත්මන් ගෝලීය සමාජය තුළ කාන්තාවන්ට සිදුවන පීඩාවන් වන ශ්‍රම හා ලිංගික සූරාකෑමට ලක්වීම, පෞද්ගලික දේපළ ක්‍රමය පුරුෂ කේන්ද්‍රීයව විකාශනය වීම, අසමාන ලෙස සැලකීම හා පවුල් සංස්ථාව තුළ සිරගත වීම නිසා ශ්‍රම සංචලතාවයට බාධා ඇතිවීම යන කරුණු ශ්‍රී ලාංකික කාන්තාවන්ට ද ප්‍රධාන වශයෙන් පොදු වන බැවින්, ඔවුන්ගේ යහපැවැත්ම වෙනුවෙන් මෙම පීඩාකාරී වාතාවරණය සමනය කර සහන සැලසීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

124.

පා.136/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නගා සිටුවීම,— ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති පුරාවස්තු සංරක්ෂණය කිරීමට හැකියාවක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නොමැත්තේ පවත්නා මානව හා භෞතික සම්පත්හි අඩුව නිසා වන හෙයින්, විද්වත් මණ්ඩලයක් මඟින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඇති අඩුපාඩුකම් පිළිබඳ සොයා බලා, ඒවා සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගැනීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

125.

පා.137/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— දුර ගමන් සේවා බස් රථවල ගමන් ගන්නා මගීන්ට සෞඛ්‍යාරක්ෂිත ආහාර පාන ලබා ගැනීමට පහසුකම් සැලසීම,— දුර ගමන් සේවා බස් රථ ආහාර පාන ගැනීම සඳහා නතර කරනු ලබන ආපනශාලාවන්හි ප්‍රමිතිය ඉතා පහළ මට්ටමක පවතින බැවින් එය මගී ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර වන අතර, එම ආපනශාලාවල ප්‍රමිතිය ඉහළ නැංවීමට නිරන්තරව පසු විපරම් කළ හැකි වන පරිදි සකස් කරන ලද ජාතික වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

126.

පා.138/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— රජය සතු වැවිලි සමාගම් ලාභදායී ආයතන බවට පත් කිරීම,— රජය සතු වැවිලි සමාගම් පාඩු ලබන ආයතන බවට පත්වී ඇති බැවින්, විද්වත් කමිටුවක් පත්කර එම ආයතනවල ලාභදායීත්වය වර්ධනය කිරීමට අවශ්‍ය නිර්දේශ සකස් කර, එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම තුළින් එම සමාගම්වල ලාභදායීත්වය ඉහළ දැමීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

127.

පා.139/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී ක්‍රියා නැවැත්වීම,— ශ්‍රී ලංකාවේ වන රක්ෂිත තුළ සිදුවන නීති විරෝධී වගාවන්, විවිධ ඉදිකිරීම්, වනාන්තර එළිකිරීම් හා රක්ෂිත සීමා මායිම් වෙනස් කිරීම ආදී වන විනාශයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් වැටලීමට විශේෂයෙන් සවිබල ගන්වන ලද පොලිස් වන ආරක්ෂක ඒකකයක් පිහිටුවීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

128.

පා.140/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කොරල්පර සංරක්ෂණය කිරීම,— සාගර ජලයේ උෂ්ණත්වය ඉහළ යෑම හා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් කොරල්පර විනාශ වීමේ තර්ජනයට ලක්ව ඇති බැවින්, ශ්‍රී ලංකා මුහුදු කලාපය අවට ඇති කොරල්පර ආරක්ෂා කර ගැනීමට හා නව කොරල්පර නිර්මාණය වීමට උචිත පරිසර පද්ධති සකස් කිරීම සඳහා අවශ්‍ය නව නියාමනයන් සකස් කර ක්‍රියාත්මක කිරීමට රජය මැදිහත් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

129.

පා.157/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ මුස්ලිම් පිරිමි පාසලක් ආරම්භ කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ මුස්ලිම් ජනතාව ඉතා වැඩි පිරිසක් ජීවත් වන අතර, මහනුවර නගරය ආශ්‍රිතව මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවිය යුතු යැයි දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ ද ඉල්ලීමක්ව පවතින බැවින්, ඉතා කඩිනමින් මහනුවර නගරයේ මුස්ලිම් පිරිමි පාසලක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

130.

පා.158/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර නගරය තුළ පිහිටි ජනප්‍රිය පාසල් සඳහා පළමු ශ්‍රේණියේ දරුවන් වෙනුවෙන් නව ගොඩනැගිලි ඉදිකිරීම,— මහනුවර නගරය ආශ්‍රිතව ජනප්‍රිය පාසල් සඳහා පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමට විශාල පිරිසක් ඉල්ලුම් කළත්, එම පාසල්වල ඉඩකඩ සීමිත හෙයින්, දරුවන් ඇතුළත් කිරීම ඉතා අසීරු වී ඇති බැවින් මහනුවර නගරය ආශ්‍රිත ප්‍රධාන පාසල්වලට පළමුවැනි ශ්‍රේණියේ පන්ති පැවැත්වීම සඳහා නව ගොඩනැගිලි ඉතා කඩිනමින් ඉදිකර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

131.

පා.159/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— මහනුවර පල්ලේකැලේ නිදහස් වෙළඳ උද්‍යාන ක්‍රමවත්ව පුළුල් කිරීම,— මහනුවර දිස්ත්‍රික්කය තුළ විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් විශාල පිරිසක් සිටින බැවින්, එම අයට රැකියා අවස්ථා කඩිනමින් සපයා දීම සඳහා මහනුවර පල්ලේකැලේ ප්‍රදේශයේ පිහිටා ඇති නිදහස් වෙළඳ උද්‍යාන දෙක ක්‍රමවත් ලෙස සකසා වැඩි පිරිසකට රැකියා අවස්ථා ලබා ගැනීමට අවස්ථාව සැලසීමට කඩිනමින් කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

132.

පා.160/'15

ගරු ලකී ජයවර්ධන මහතා,— උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව යළි ස්ථාපනය කිරීම,— අධිරාජ්‍යවාදී පාලන කාලයේදී අසරණ වූ උඩරට ප්‍රදේශවාසී ජනතාවට සහන සැලසීම උදෙසා ස්ථාපිත කර තිබූ උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව පසුගිය පාලන කාලය තුළ අක්‍රිය තත්ත්වයට පත් කිරීම නිසා උඩරට ජනතාවට සිදුවී ඇති අසාධාරණයන් සාධාරණය කිරීම සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන කොමිෂන් සභාව නැවත ක්‍රමවත්ව ස්ථාපිත කරලීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සැලසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

133.

පා.184/'16

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම,— ශිෂ්ඨ සම්පන්න සමාජයකට නොගැලපෙන අයුරින් රට තුළ ව්‍යාප්ත වන අපචාර හා බාල අපරාධ මර්ධනය කිරීම හා ස්වයං විනයක් ඇති කිරීම උදෙසා සියලුම දරුවන්ට, 9 ශ්‍රේණිය දක්වා ඔවුන්ගේ ආගමට අනුකූල දහම් පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීම සුදුසු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

134.

පා.185/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු අධ්‍යයන කේන්ද්‍රයක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාවේ හා ලෝකයේ විවිධ රටවල පාර්ලිමේන්තු ක්‍රියාදාමයන්, පාර්ලිමේන්තු ඉතිහාසය හා දේශපාලන ක්‍රමවේද පිළිබඳ පාසල් සිසුන්ට, තරුණ තරුණියන්ට හා අනෙකුත් විද්‍යාර්ථයන්ට අධ්‍යයනය කිරීම සඳහා පහසුකම් සැලසිය හැකි අධ්‍යයන කේන්ද්‍රයක් පාර්ලිමේන්තුව තුළ ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

135.

පා.191/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නවත්වාලීම,— ශ්‍රී ලංකාව අතීතයේ පටන්ම සත්ව කරුණාව පතුරුවාලන බෞද්ධ රටක් වුවද, අද වනවිට සමහර කුකුළු ගොවිපළ හිමියන් භාවිතා කරන බැටරි කේජ් ක්‍රමය නිසා සතුන් දැඩි හිංසාවකට ලක්වීමත්, අධික බිත්තර නිෂ්පාදනය තුළින් සුළු පරිමාණ කුකුළු ගොවිපළ හිමියන්ගේ රැකියා අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇති බැවින්, මෙම අති අමානුෂීය ක්‍රමය නවත්වාලීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

136.

පා.193/'17

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— සියලුම විශ්වවිද්‍යාලවල දැනට පවතින නවක වදය සම්පූර්ණයෙන් නැවැත්වීම සඳහා පවතින නීති ක්‍රියාත්මක කිරීම,— විශ්වවිද්‍යාල තුළ හෝ ඉන් පිටත නවක සිසුන්ට මුහුණ දීමට සිදුවන නවක වදය සම්පූර්ණයෙන්ම වැළැක්වීම හා 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත ප්‍රකාරව, එසේ නවක වදය ක්‍රියාත්මක කරන සියලුම පාර්ශ්වයන්ට නීතිය ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

137.

පා.194/'17

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— අන්තර්ජාලය තුළ අසභ්‍ය වීඩියෝ පට සංසරණය වීම වැළැක්වීමෙහිලා විශේෂ ඒකකයක් පිහිටුවීම,— වර්තමානයේ බහුල වශයෙන් අන්තර්ජාලය ඔස්සේ නොයෙකුත් අසභ්‍ය වීඩියෝ දර්ශන සංසරණය වීම මඟින් පුද්ගලයන්ගේ පුද්ගලිකත්වය විනාශවන අතර විශේෂයෙන්ම, කාන්තා පාර්ශ්වය එමඟින් විශාල අපහසුතාවයකට පත්වන බැවින්, මෙවන් වීඩියෝ දර්ශන ළඟ තබාගෙන සිටින, බෙදා හරින හා නිර්මාණය කරන පුද්ගලයන් පිළිබඳව විමර්ශනය කිරීමට ප්‍රතිඵලදායී විශේෂ ඒකකයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

138.

පා.199/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වාර්ෂිකව අපේ රටට කිරි පිටි ආනයනය සඳහා විශාල මුදලක් වැයවන අතර එම මුදල් අප රට තුළම ඉතිරි කරගත හැකිනම්, එය රටේ ආර්ථිකයට විශාල පිටුබලයක් වන බැවින්, කිරි කර්මාන්තයේ නියුක්ත දේශීය කිරි ගොවීන්ගේ ගැටලු විසඳීමට කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

139.

පා.200/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— වයඹ පළාත තුළ පිහිටා ඇති පුරාවිද්‍යා වටිනාකමක් සහිත ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය ඉතා ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන පුරාවිද්‍යා වටිනාකමක් ඇති ස්ථාන රැසක් සහිත දිස්ත්‍රික්කයක් වන අතර අතීතයේදී කුරුණෑගල, දඹදෙණිය සහ යාපහුව වැනි රාජධානි පිහිටා තිබුනේද කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වුවත්, අද වනවිට එම පෞරාණික ස්ථානවල ආරක්ෂාව සම්බන්ධයෙන් බලවත් ගැටලු මතුවී ඇති බැවින්, එම පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

140.

පා.201/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කිරීම,— ඕනෑම රටක සාර්ථක සමාජ ආරක්ෂණ ජාලයක් පැවතීම එම රටේ ජීවත් වන පුරවැසියන්ට වැදගත් වන අතර ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථ සාධක ක්‍රමයක් ක්‍රියාත්මක වුවද, රටේ අවිධිමත් අංශයේ සේවකයන් සඳහා කිසිදු සමාජ ආරක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක නොවන බැවින්, සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

141.

පා.202/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීම,— පුත්තලම දිස්ත්‍රික්කය අතිශය සුන්දර වෙරළ තීරයකට හිමිකම් කීවද, වෙරළ ඛාදනය, කඩොලාන විනාශ වීම, අනවසර ඉදිකිරීම් වැනි හේතු නිසා වෙරළ තීරය දූෂණයට ලක්ව් ඇති බැවින්, පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරය ආරක්ෂා කර ගැනීම සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

142.

පා.203/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය සතුව තිබූ වොලිබෝල් ක්‍රීඩාවේ අභිමානය නැවත ගොඩනැගීමට වැඩසටහනක් දියත් කිරීම,— මීට දශකයකට පමණ පෙර පුත්තලම දිස්ත්‍රික්කයේ පාසල් වලින් බිහිවූ දක්ෂ වොලිබෝල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තරඟ වලදී දැක්වූ දක්ෂතා නිසා පුත්තලම දිස්ත්‍රික්කයට වොලිබෝල් ක්‍රීඩාවෙන් ඉතා අභිමානවත් ස්ථානයක් හිමි වුවද, අද වනවිට එම තත්ත්වයේ යම් බිඳ වැටීමක් ඇති බැවින්, නැවත එම අභිමානය පුත්තලම දිස්ත්‍රික්කයට ගෙන ඒමට වැඩසටහනක් දියත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

143.

පා.204/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පාසල් හා ක්‍රීඩා සමාජ ක්‍රිකට් තරඟාවලිවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— පසුගිය වසර කිහිපයක සිටම ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දැඩි කඩාවැටීමකට ලක් වී ඇති බැවින්, ජාතික කණ්ඩායමට දක්ෂ ක්‍රීඩකයන් සොයා ගැනීම සඳහා පාසල් හා ක්‍රීඩා සමාජ මට්ටමින් ක්‍රිකට් තරඟාවලිවල තත්ත්වය ඉහළ නැංවීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

144.

පා.205/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ග්‍රාමීය පළාත්වල බෞද්ධ පන්සල් ඉතා අඩු ආර්ථික මට්ටමක පවතින බැවින්, එවැනි පන්සල්වල වැඩසිටින වයෝවෘද්ධ භික්ෂූන්වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහනක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

145.

පා.206/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පුත්තලම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීම,— ජනතාවගේ පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රෝටීන් ලබාදීමටත්, වාර්ෂිකව ටින් මාළු ආනයනය වෙනුවෙන් විදේශ රටවල් කරා ඇදී යන විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා මෙන්ම, ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය සියලුම සම්පත් පුත්තලම දිස්ත්‍රික්කය තුළ පවතින බැවින් ද, එම දිස්ත්‍රික්කය තුළ ටින් මාළු කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

146.

පා.207/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කිරීම,— රටක සංවර්ධනය සඳහා අධිවේගී මාර්ග ඉතා වැදගත් වන බැවින් ද, වත්මන් යහපාලන රජය යටතේ පුත්තලම දිස්ත්‍රික්කය ඉතා වේගයෙන් සංවර්ධනය වන බැවින් ද, එම සංවර්ධන වේගය තවදුරටත් ඉහළ නැංවීම සඳහා දැනට කොළඹ සිට කටුනායක දක්වා වූ අධිවේගී මාර්ගය හලාවත දක්වා දීර්ඝ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

147.

පා.208/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා, — වයඹ පළාතේ වැව්, ගංගා සහ ඇළ මාර්ග ආශ්‍රිතව කුඹුක් ශාඛ සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම,— පසේ පවතින ජලය ආරක්ෂා කිරීමේ හැකියාව මෙන්ම, පාංශු ඛාදනය අවම කිරීමේ ගුණාංග සහිත වූ දිගු ආයු කාලයක් ඇති කුඹුක් ශාඛ, වයඹ පළාතේ වැව්, ගංගා සහ ඇළ මාර්ග ආශ්‍රිතව සිටුවීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

148.

පා.209/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා, —බත්තලංගුණ්ඩුව දූපත්වාසී ධීවර ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා කඩිනම් පියවර ගැනීම,— වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය අර්ධද්වීපය අසල ඇති ප්‍රධාන දූපතක් වන බත්තලංගුණ්ඩුව දූපතේ ධීවර ප්‍රජාවගේ මූලික අවශ්‍යතා පිළිබඳව මෙතෙක් නිසි අවධානයට ලක් නොවී ඇති බැවින්, වත්මන් යහපාලන රජය යටතේ එම ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරා දී ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා කඩිනම් පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

149.

පා.210/'17

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය,— විශ්වවිද්‍යාල හා අනෙකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතනවලට විශේෂ පුහුණුවලත් මානසික උපදේශකවරු හෝ අනුශාසකවරු පත්කිරීම,— වර්තමානයේ බහුල වශයෙන් දක්නට ලැබෙන තරුණ තරුණියන්, සිසු සිසුවියන් සියදිවි හානිකර ගැනීමේ ප්‍රවණතාවය මැඩපැවැත්වීම සඳහා සියලුම රජයේ අධ්‍යාපන ආයතන සඳහා පුහුණුවලත් මානසික උපදේශකවරු, අනුශාසකවරු හෝ එම අධ්‍යාපන ආයතනවල දැනට සිටින ගුරුවර ගුරුවරියන්ට මානසික උපදේශනය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

150.

පා.211/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, — පාසල් ශිෂ්‍ය විනය කමිටු පරීක්ෂණ විධිමත් පරිදි සිදුකිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කිරීම,— ඇතැම් පාසල්වල ශිෂ්‍යයන්ගේ විනය ගැටලුවලදී විධිමත් විනය පරීක්ෂණ සිදු නොකොට ශිෂ්‍යයන් පාසලෙන් ඉවත් කිරීමට කටයුතු කරන අතර එමගින් එම ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වී විශාල

අසාධාරණයකට ලක්වීමත්, බොහෝ දරුවන් දැඩි මානසික පීඩනයකට පත් වී, මානසික රෝගීන් වීමත්, ඇතැම් දරුවන් සමස්ත ගුරු ප්‍රජාවට මෙන්ම, සමාජයටම වෛර කරමින් සමාජ විරෝධී අපරාධකරුවන් වූ අවස්ථා ද දක්නට ඇති හෙයින්, පාසල් ශිෂ්‍යයන්ගේ විනය විරෝධී ක්‍රියාවලදී වඩාත් විධිමත් පරිදි හා අපක්ෂපාතී විනය පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කිරීම සඳහා උචිත වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

151.

පා.213/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා, — බදුල්ල මහ රෝහල ශික්ෂණ රෝහලක් ලෙස භාවිතා කරමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අනුබද්ධව රජයේ වෛද්‍ය පීඨයක් ආරම්භ කිරීම,— අප රට තුළ ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වෛද්‍යවරුන් ප්‍රමාණයෙන් දැනට සිටින්නේ 50% ක් පමණ වන අතර අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යා විෂය ධාරාවෙන් ඉහළම සාමාර්ථ ලබා ගන්නා ශිෂ්‍යයන් රැසකට රජයේ වෛද්‍ය පීඨවලට ප්‍රවේශවීමේ අවස්ථාව අහිමි වී ඇති අතර රජයේ අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාවන් ශක්තිමත් කිරීම සඳහා බදුල්ල මහ රෝහල ශික්ෂණ රෝහලක් ලෙස භාවිතා කරමින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අනුබද්ධව රජයේ වෛද්‍ය පීඨයක් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

152.

පා.214/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මොරටුව විශ්වවිද්‍යාලය සඳහා යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස පානදුර මූලික රෝහල සංවර්ධනය කිරීම,— 2018 අයවැය මඟින් මොරටුව විශ්වවිද්‍යාලයට අනුබද්ධව වෛද්‍ය පීඨයක් ඉදිකිරීමට යෝජනා කර ඇති අතර එම යෝජිත වෛද්‍ය පීඨය සඳහා ශික්ෂණ රෝහල ලෙස පානදුර මූලික රෝහල සංවර්ධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2018 මැයි මස 22 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

885/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලාංකීය පාසල් දරුවන් විවිධ පෝෂණ ඌනතාවලින් පෙළෙන බවත්;

(ii) එයට හේතුව නිසි වේලාවට ආහාර නොගැනීම හා පෝෂ්‍යදායී ආහාර නොගැනීම බවත්;

(iii) මේ නිසා පාසල් දරුවන් විවිධ රෝගාබාධවලට ගොදුරුවීමේ ප්‍රවණතාවයක් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පාසල් දරුවන්ට පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1117/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක දිවිනැගුම ප්‍රජා මූල බැංකු (සමෘද්ධි බැංකු) සංඛ්‍යාව කොපමණද;

(ii) එම බැංකු පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එක් එක් බැංකු ශාඛාවෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් එක් එක් බැංකුවක සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දැනට එම බැංකුවල සේවක පුරප්පාඩු තිබේද;

(iii) එසේ නම්, එම පුරප්පාඩු සඳහා සේවකයන් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1251/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට මුලතිව් දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුද්මය තත්ත්වය නිමවන තුරු පානීය ජලය ලබාදීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිමවීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1376/'16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 130 ට අනුව, වැඩි අස්වනු ලබා දෙන බීජ හඳුන්වාදෙන සමාගම්වලට අර්ධ බදු විරාමයන් ලබා දුන්නේද;

(ii) එවැනි බදු සානුබලයක් ලබා ගත් සමාගම්වල නම් ලැයිස්තුව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත යෝජනාවට අනුව, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ආනයන බදු ඉවත් කිරීමට යෝජනා කළ බැවින්,

(i) 2015 ජනවාරි 01 දින වනවිට, ආනයන බදුවලින් නිදහස් කර තිබූ, යන්ත්‍රෝපකරණ ලේඛනයක්;

(ii) 2016 ජනවාරි 01 දිනෙන් පසු, ආනයන බදුවලින් නිදහස් කර තිබූ, යන්ත්‍රෝපකරණ ලේඛනයක්;

ඉදිරිපත් කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1466/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ තුළ පදිංචි අඩු ආදායම්ලාභී පවුල් සඳහා මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදල්වලින් නොමිලේ සෙවිලි තහඩු බෙදා දුන් බව පිළිගන්නේද;

(ii) විමධ්‍යගත අරමුදල් යොදාගනිමින් මන්ත්‍රීවරයන් විසින් සිදු කරනු ලැබූ සෙවිලි තහඩු බෙදාදීම තහනම් කර තිබේද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද;

(iv) එම තහනම ඉවත්කර, පෙර තිබූ පරිදි මන්ත්‍රීවරයන්ගේ මාර්ගයෙන් සෙවිලි තහඩු බෙදාදීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2178/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2016 වර්ෂයේදී කොස්ගම, සාලාව යුද හමුදා අවි ගබඩාව පිපිරී යෑමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන්ට රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2208/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර තනතුරෙහි සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට උක්ත තනතුරෙහි සේවයෙහි නිරත නිලධාරීන් සංඛ්‍යාව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) උක්ත දෙපාර්තමේන්තුවෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලබන දිනය කවරේද;

(iv) උක්ත තනතුරෙහි වැඩබලන නිලධාරීන් සඳහා වැඩබැලීමේ පත්වීම් හා වැඩබැලීමේ දීමනා ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2238/'17

ගරු බිමල් රත්නායක මහතා,— විශේෂ කාර්යභාර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විශේෂ කාර්යභාර අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2299/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ සමෘද්ධි සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව, එක් එක් මැතිවරණ කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) සමෘද්ධි ව්‍යාපාරයට අලුතින් පවුල් ඇතුළත් කරගැනීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2319/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2020 දී වයඹ පළාත තුළ තැලසීමියා රෝගය සම්පූර්ණයෙන්ම තුරන් කිරීම වෙනුවෙන් විශේෂ අරමුදලක් 2009 වර්ෂයේදී පිහිටුවනු ලැබූ බවත්;

(ii) එම අරමුදලින් රුපියල් මිලියන දහයකට අධික මුදලක් අයථා ලෙස පරිහරණය කිරීම පිළිබඳව සොයා බැලීමට විශේෂ විමර්ශන කමිටුවක් පත් කරන ලද නමුත් මේ දක්වා එහි වාර්තාව ප්‍රකාශයට පත් වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මෙම විමර්ශන වාර්තාව ප්‍රකාශයට පත් කර, අදාළ පුද්ගලයන්ට එරෙහිව අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2329/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාර්යාල පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එම කාර්යාලවලට දැනට පත්වීම් ලබා සිටින සහකාර තේ කොමසාරිස්වරුන්ගේ සුදුසුකම් කවරේද;

(iv) ඔවුන් එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබේද;

(v) කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය කාර්යාලය සඳහා ස්ථිර සහකාර තේ කොමසාරිස්වරයෙකු පත් නොකර සිටින්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2403/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළු ගඟ, මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ අවතැන් වූ පවුල්, ලග්ගල මැතිවරණ කොට්ඨාසය තුළම පදිංචි කිරීමට පියවර ගෙන තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, අවතැන් වූ පවුල් සංඛ්‍යාව සහ ලබාදුන් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ ලබාදුන් ඉඩම් ප්‍රමාණය වත්මන් පරපුරට ප්‍රමාණවත් වුවද, ඊළඟ පරම්පරා සඳහා ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් නැවත පදිංචි කරන ලද පවුල් මුහුණ දෙන ඉඩම් ගැටලු හා ඔවුන්ගේ ඊළඟ පරම්පරාවට මුහුණ දීමට සිදුවන ඉඩම් ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2417/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, මල්ලවපිටිය ලංකා විදුලිබල මණ්ඩල කාර්යාල පරිශ්‍රයේ දැවැන්ත විදුලි උත්පාදන යන්ත්‍ර සමූහයක් ස්ථාපිත කර තිබෙන බවත්;

(ii) මෙම යන්ත්‍ර ක්‍රියාත්මක වීමේදී පිටවන අධික ශබ්දය හේතුවෙන් අවට ජනතාව දැඩි පීඩාවකට ලක්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම යන්ත්‍ර සවිකිරීම සඳහා පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, පාරිසරික ඇගයීම සිදුකළ ආයතනය කවරේද;

(iii) මෙම ගැටලුව විසඳීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2475/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂය තුළ සිදු වූ හදිසි ආපදා තත්ත්වයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආපදාවලින් අවතැන් වූ සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(iii) දේපල හානි සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව කොපමණද;

(iv) අවතැන්වූවන් සඳහා වන්දි ලබාදීමට වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2479/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය කාලයේදී ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලා වැව ඉස්මත්තේ පිහිටුවන ලද දියවර ගම්මානයේ දැනට පවුල් 100ක් පමණ ස්ථිර නිවාස ඉදිකරගෙන ජීවත්වන බවත්;

(ii) මෙතෙක් එම අයට ඉඩම්වල අයිතිය ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඔවුන්ට මෙම ඉඩම්වල අයිතිය ලබාදීමට කටයුතු කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 මැයි මස 23 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

886/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රැකියාවන්හි නිරත ශ්‍රී ලාංකිකයන්ට ඔවුන් සේවය කරන රටවල් වලදී පහරදීම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අතවරයන් සිදු කිරීම, මුදල් වංචා කිරීම්, ජීවිත හානි සිදු කිරීම හා ගණිකා වෘත්තියේ යෙදවීම ආදිය සිදුවන බවත්;

(ii) එම අසාධාරණකම්වලදී ඔවුන් වෙනුවෙන් ප්‍රමාණවත් මැදිහත්වීමක් සිදු කිරීමට ක්‍රමවේදයක් නොමැති බවත්;

(iii) එම නිසා එම ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල අය අපහසුතාවයට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2015 හා 2016 වර්ෂයන්හි අ(i) හි සඳහන් අපහසුතාවයන්ට ලක් වූ ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ශ්‍රී ලාංකිකයන්ට ඔවුන් අපහසුතාවයට ලක් කළ පාර්ශ්වයන්ගෙන් වන්දි ලබා ගැනීමට ක්‍රමවේදයක් තිබේද;

(iii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) විදේශගත ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටිය හැකි නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම සුදුසු බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1043/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) 2016 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩල වාර්ෂික සැසිය සඳහා ජනාධිපතිතුමාගේ සංචාරයට සහභාගි වූ දූත පිරිස කොපමණද;

(ii) උක්ත සංචාරයට සහභාගි වූ පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් දූත පිරිසට ඇතුළත් වූ පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සංචාරය සඳහා රජය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම් විසින් දැරූ සම්පූර්ණ පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1252/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට යාපනය දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුද්ධමය තත්ත්වය නිමවන තුරු පානීය ජලය ලබාදීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුද්ධමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1428/'16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 204 යෝජනාවට අනුව, තාර සඳහා වූ වෙළෙඳපොළ ලිහිල් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(iii) උක්ත අයවැය යෝජනාවට අනුව තාර වෙළෙඳපොළට පිවිසි ප්‍රධාන සැපයුම්කරුවන් කවුරුන්ද;

(iv) වර්ෂ 2003 සිට 2016 දක්වා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙහි තාර නිෂ්පාදනය හා එක් එක් වර්ෂය අවසානයේදී පැවැති තොග ප්‍රමාණය කවරේද;

(v) වර්ෂ 2009 සිට 2016 දක්වා ලෝක වෙළෙඳපොළෙහි තාර මිල සහ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ තාර මිල වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) වර්ෂ 2015 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ තාර අවශ්‍යතාවය පිළිබඳ පුරෝකථනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1659/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ පාලනය වන ආයුර්වේද රෝහල් හා ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල නම් කවරේද;

(iii) දැනට එම රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වත්මන් ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වීමෙන් අනතුරුව පළාතේ ආයුර්වේද රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල රැකියා ලබාදී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) එසේ රැකියා ලබාදුන් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2009/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජීවත්වීමට නිවසක් නොමැතිව, තැනින් තැන යමින්, අගුපිල්වල රාත්‍රී කාලය ගත කරන දුගී ජනතාවට, වැසි හා සුළං දිනවල ඉතා ශෝචනීය තත්ත්වයන්ට මුහුණදීමට සිදු වන බව පිළිගන්නේද;

(ii) කොළඹ නගරයේ සහ අනිකුත් ප්‍රධාන නගරවල මෙබඳු අසරණ දුගී ජනතාවට ආවරණයක් ලබාදීමට පළාත් පාලන ආයතන හරහා තාවකාලික නවාතැන් පොළ හෙවත් "අම්බලම්" ඉදිකර දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2209/’17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොවි ජනතාවට සහනදායී පදනම මත විදුලිබලය ලබාදීමේ ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වන ආකාරය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක කවරේද;

(iii) මෙම ජාතික වැඩසටහනේ සමාරම්භක උත්සවය පැවැත්වූ යාපනය ඇතුළු උතුරු පළාතේ ගොවි ජනතාවට මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලැබෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2239/’17

ගරු බිමල් රත්නායක මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2320/’17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) දැනට එක් එක් පාසලේ සේවයේ නියුතු ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) පුත්තලම දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය පාසල්වල උග්‍ර ගුරු හිඟයක් පවතින බව පිළිගන්නේද;

(v) එසේ නම්, එම ගුරු හිඟය අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2331/’17

ගරු හේෂාන් විතානගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කර්මාන්තපුරයක් පිහිටා තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම කර්මාන්තපුරය ආරම්භ කළ දිනය හා එහි ආරම්භක අරමුණු කවරේද;

(iii) අද වනවිට මෙම කර්මාන්තපුරය තුළ ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) එම එක් එක් කර්මාන්ත ශාලාවේ රැකියාවල නියුක්ත සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(v) එම කාලසීමාව තුළ වැසීගිය කර්මාන්තශාලා තිබේ නම්, ඒවායේ නම් කවරේද;

(vi) මෙම කර්මාන්තපුරය තවදුරටත් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2333/’17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 27/88 හා අංක 01/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව රාජ්‍ය සේවයේ හා රාජ්‍ය සංස්ථාවන්හි පුරප්පාඩු පිරවීමේ දී ඉන් 3%ක ප්‍රතිශතයක් සුදුසුකම් ලත් හා ආබාධිත තත්ත්වය ඔවුන්ගේ කටයුතුවලට බාධාවක් නොවන ආබාධිත පුද්ගලයන්ගෙන් පිරවිය යුතු බවත්;

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයට නිලධාරීන් බඳවාගැනීමේ 2004 (2005) විවෘත තරඟ විභාගයට විභාග අංක 0087548 යටතේ පෙනී සිට ලකුණු 135 ක් ලබා සමත්ව සිටින 1 1/4 කණුව, අම්පාර පාර, සියඹලාණ්ඩුව යන ලිපිනයේ පදිංචි කායික ආබාධ සහිත තැනැත්තෙකු වන ඩබ්ලිව්. එල්. ආර්. එන්. ලියනගේ මහතා තමා ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට සලකා බලන ලෙසට කර ඇති අභියාචනය, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ආබාධ සහිත පුද්ගලයන් ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට නොහැකි බව සඳහන් කරමින් ප්‍රතික්ෂේප කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයට ආබාධ සහිත පුද්ගලයන් බඳවා නොගත යුතු බවට විධිවිධාන පවතීද;

(ii) නොඑසේ නම්, ඩබ්ලිව්. එල්. ආර්. එන්. ලියනගේ මහතාට යුක්තිය ඉටුකිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2452/’17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ එක් එක් මැතිවරණ බලප්‍රදේශයේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ජාතික පාසල්වල නම් කවරේද;

(iii) මාතලේ දිස්ත්‍රික්කයේ ජාතික පාසල් සංඛ්‍යාව වැඩි කිරීමට සහ දැනට ඇති ජාතික පාසල් තවදුරටත් දියුණු කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2476/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් සංවර්ධනය සඳහා මධ්‍යම රජය මඟින් ලබා දී ඇති නව අමාත්‍ය ධුරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අමාත්‍යාංශ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම අමාත්‍යාංශ සඳහා 2017 වර්ෂයට වෙන් කර තිබූ ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සබරගමු සංවර්ධන අමාත්‍යාංශය මඟින් ව්‍යාපෘති සංවර්ධනය සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිපාදනය කොපමණද;

(iii) එම ව්‍යාපෘති කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2480/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්බිරිස්වැව ගම්මානයේ, පිහිටා ඇති ග්‍රාමීය රෝහල දැනට ගොඩනැඟිල්ලකට පමණක් සීමා වී ඇති බවත්;

(ii) දිවා කාලයට පමණක් බාහිර රෝගී අංශයට වෛද්‍යවරයෙකු අනුයුක්ත කර සිටියද රාත්‍රී කාලයේදී හදිසි අවස්ථාවක හෝ ප්‍රතිකාර ගැනීම සඳහා වෛද්‍යවරයෙකු නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර විසඳුමක් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2502/'17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින තුළ දහම් පාසල් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) දහම් පාසල් සංවර්ධනය සඳහා ස්ථාපිත කළ අරමුදලේ ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම අරමුදල තර කිරීම සඳහා 2017 අයවැයෙන් වෙන් කළ මුදල කොපමණද;

(iv) දහම් පාසල් ගුරුවරුන් සිදු කරනු ලබන ගරු සේවය දිරිගැන්වීම, අගය කිරීම හා ගුරුවරුන් එම පද්ධතිය තුළ රඳවා ගැනීම සඳහා රජය සිදු කරනු ලබන ප්‍රවර්ධනයන් කවරේද;

(v) ඉරිදා දින උදේ වරුවේ උපකාරක පංති පැවැත්වීම, දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු වීමට බරපතල බාධකයක් වන බැවින්, එම තත්ත්වය පාලනය කිරීමට හා වැළැක්වීමට ගනු ලබන නව පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 මැයි මස 24 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

887/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ බට, වේවැල්, පන් හා හණ ආශ්‍රිත නිෂ්පාදන සිදු කරන ගම්මාන පිළිබඳ සමීක්ෂණයක් කර තිබේද;

(ii) එසේ නම්, එම ගම්මාන සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම කර්මාන්තයේ යෙදෙන පවුල් සංඛ්‍යාව, ගම්මානය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කර්මාන්තකරුවන්ට අවශ්‍ය නව තාක්ෂණය ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) බට, වේවැල්, පන් හා හණ නිෂ්පාදන වෙළෙඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට බට, වේවැල්, පන් හා හණ වලින් සාදන විසිතුරු භාණ්ඩ අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) 2015 හා 2016 වර්ෂවලදී බට, වේවැල්, පන් හා හණ භාණ්ඩ අපනයනයෙන් ලැබුණු විදේශ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1267/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ සමෘද්ධි ආධාර ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් සංඛ්‍යාව ඔවුන් ලබන සමෘද්ධි මුද්දරවල වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පසුගිය සමෘද්ධි සමීක්ෂණයෙන් ලද වාර්තා අනුව කිසියම් වර්ගීකරණයක් කර තිබේද;

(iv) එම සමීක්ෂණයෙන් අනතුරුව ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම අභියාචනා සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1430/'16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 157ට අනුව, තේ කර්මාන්තය මුහුණ පා ඇති ගැටලු විසඳීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශවලින් සමන්විත ක්‍රියාකාරී කමිටුවක් පිහිටවනු ලැබුවේද;

(ii) එසේ නම්, එහි සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) 2016 වර්ෂය තුළදී එම කමිටුව විසින් හඳුනා ගනු ලැබූ තේ කර්මාන්තය මුහුණ පා සිටි ප්‍රධාන ගැටලු කවරේද;

(iv) 2016 වර්ෂය තුළදී තේ කර්මාන්තයේ ගැටලු විසඳීම සඳහා රජය විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1660/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පාලනය යටතේ ධාවනය වන බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එහි දැනට සේවයේ නියුතු නිලධාරින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) ඌව පළාත් වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධූරයට පත්වීමෙන් අනතුරුව, මේ දක්වා එම අධිකාරියේ ලබාදී ඇති රැකියා සංඛ්‍යාව හා එම රැකියාලාභින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධූරයට පත්වීමෙන් අනතුරුව ලබාදී ඇති බස්රථ අවසර පත්‍ර (Permits) හා එම අවසර පත් ලබාදුන් මාර්ග හා පුද්ගලයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2010/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, "නීලවල ගම" පාරම්පරික ස්වර්ණාභරණ කර්මාන්තය ඉතාමත් දියුණු ලෙස පැවති පැරණි ගම්මානයක් බව දන්නේද;

(ii) රන්රිදී කර්මාන්තයෙන් ජීවත් වූ මෙම ගමේ පවුල් අතරින් අද වනවිට කර්මාන්තයේ යෙදෙන්නේ පවුල් 03 ක් පමණක් බව පිළිගන්නේද;

(iii) දේශීය කර්මාන්තකරුවන් නඟා සිටුවීම වෙනුවෙන් එකල ලක්සල මැදිහත්වීම නිසා නීලවල ගමේ රන්රිදී භාණ්ඩවලට විශාල ඉල්ලුමක් තිබූ නමුත්, අද වනවිට ලක්සල, ව්‍යාපාරිකයන් කීප දෙනෙකුගේ ආයතනයක් බවට පත්වීම හේතුවෙන් මෙම කර්මාන්තය දරුණු කඩා වැටීමකට ලක්වී ඇති බව එම ගමේ කර්මාන්තකරුවන් සළකන බව පිළිගන්නේද;

(iv) එබැවින්, නීලවල ගමට සුවිශේෂී වූ පැරණි කැටයම් සහිත රන්රිදී කර්මාන්තය නඟා සිටුවීමට රජය මැදිහත් වී පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2179/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2017 වර්ෂයේදී තෙත් කලාපයේ ගං වතුරෙන් සහ වැසි වතුරෙන් සිදු වූ ජල ගැලීමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන් වෙනුවෙන් රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2210/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ පිහිටි රජයේ කාර්මික විද්‍යාලයට, වෘත්තීය පුහුණුව සඳහා වාර්ෂිකව ඉල්ලුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබෙන අතර තෝරාගනු ලබන්නේ ඉතා සීමිත අපේක්ෂකයන් සංඛ්‍යාවක් පමණක් බවත්;

(ii) යාපනය දිස්ත්‍රික්කයේ රැකියා අවස්ථාවන් නොමැති තරුණ තරුණියන් දහස් ගණනකට මෙම කාර්මික විද්‍යාලයෙන් පුහුණුව ලැබීමට අවස්ථාව නොලැබෙන බවත්;

(iii) එකී තරුණ තරුණියන්ගේ යහපත උදෙසා යාපනය දිස්ත්‍රික්කය තුළ තවත් කාර්මික විද්‍යාලයක් ඉදිකිරීම සඳහා තෙන්මරච්චි ප්‍රදේශයේ, මීසාලේ වීරසිංගම් මධ්‍ය මහ විද්‍යාලයට අයත් ඉඩම් අක්කර 06ක් පරිත්‍යාග කර ඇති බවත්;

(iv) ඉහත ඉඩම නිරීක්ෂණය කළ වෘත්තීය පුහුණු දෙපාර්තමේන්තුවේ බලධාරීන් විසින්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද ව්‍යාපෘති යෝජනාව අනුමත වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මීසාලේ නව කාර්මික විද්‍යාල ඉදිකිරීම සඳහා මූලික වැඩ කටයුතු හා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, ඉහත විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2240/'17

ගරු බිමල් රත්නායක මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2321/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ එක් එක් පළාත් පාලන ආයතනය විසුරුවා හරින ලද දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පළාත් පාලන ආයතන විසුරුවා හැරීමෙන් පසු පළාත් පාලන ආයතනවල කටයුතු පවත්වාගෙන යෑම සඳහා සේවකයන් බඳවාගෙන තිබේද;

(iii) එසේ නම්, බඳවාගත් සේවකයන්ගේ නම්, ලිපිනයන් හා බඳවාගත් තනතුරු කවරේද;

(iv) එසේ බඳවා ගැනීමේදී ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි විධිවිධාන අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2332/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, නිවිතිගල අධ්‍යාපන කොට්ඨාසයේ, දැල දෙමළ මහා විද්‍යාලය නමින් පාසලක් තිබෙන බව දන්නේද;

(ii) එම පාසලේ දැනට ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට එම විද්‍යාලයේ උග්‍ර ගුරු හිඟයක් පවතින බව දන්නේද;

(iv) එම ගුරු හිඟය පියවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2334/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජයේ රෝහල්වල සේවය කරන පෝෂණවේදී වෘත්තිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්ෂේත්‍රයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව හා ලංකා වෛද්‍ය විද්‍යාල සභාව විසින් පිළිගත් ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ සිව් අවුරුදු උපාධිධාරීන් මෙම තනතුර සඳහා බඳවා ගැනීමට කටයුතු නොකරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2477/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු මගී ප්‍රවාහන බස් රථ අතරින් අධිවේගී මාර්ගවල ධාවනයේ යොදවා ඇති බස්රථ සංඛ්‍යාව කොපමණද;

(ii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී රජය මඟින් ශ්‍රී ලංගම වෙත ලබාදුන් බස් රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2014 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙතින් රජය ලැබූ ආදායම සහ ඒ වෙනුවෙන් සිදු කර ඇති වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2014 වර්ෂයේ සිට මේ දක්වා අධිවේගී මාර්ගවල ධාවනයේ යොදවා ඇති බස්රථ මඟින් රජය ලැබූ ආදායම සහ ඒ වෙනුවෙන් සිදු කර ඇති වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයේ යෙදී සිටින මුළු සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් ශ්‍රේණිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2481/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1994 වර්ෂයේ විවෘත කරන ලද විජිතපුර තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන්, දැඩිසේ අබලන්වී, කඩා වැටීමේ අවදානමක පවතින බව දන්නේද;

(ii) එම ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2503/'17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග අනතුරුවලින් මියයන හෝ තුවාල ලබන මගීන් හා පදිකයන් වෙනුවෙන් වන්දි ලබා දීමක් සිදු වන්නේද;

(ii) එසේ නම්, එම වන්දි ලබා දීම වෙනුවෙන් 2017 වර්ෂයට වෙන් කළ මුදල කොපමණද;

(iii) එම වන්දි ලබා දීමේදී පාදක කර ගනු ලබන කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ත්‍රීරෝද රථ අනතුරකින් මියයන ත්‍රීරෝද රථ රියදුරන් වෙනුවෙන් ලබා දෙන වන්දි සඳහා 2017 වර්ෂයට වෙන් කළ මුදල කොපමණද;

(ii) 2017 වර්ෂයේ මැද භාගය වනවිට වන්දි ලැබීමට සුදුසුකම් ලැබූ පිරිස කොපමණද;

(iii) 2017 වර්ෂයේ මැද භාගය වනවිට වන්දි ලබා දුන් පිරිස කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2528/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූර්ය විදුලිබල නිෂ්පාදනයන් සඳහා රජය විසින් සහන ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබේද;

(ii) එම වැඩපිළිවෙළ යටතේ පාරිභෝගිකයන්ට ලබා දෙන ණය සඳහා ගෙවිය යුතු පොළී ප්‍රතිශතය කොපමණද;

(iii) මෙම වැඩපිළිවෙළ යටතේ එක් එක් බැංකුව විසින් පාරිභෝගිකයන් වෙත ලබා දී ඇති ණය ප්‍රමාණය සහ එම ණය මුදල්වල එකතුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2018 මැයි මස 25 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

888/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මැටි ආශ්‍රිත වළං හා වෙනත් නිෂ්පාදන කරනු ලබන ගම්මාන පිළිබඳ සමීක්ෂණයක් කර තිබේද;

(ii) එසේ නම්, එම ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම කර්මාන්තයේ යෙදෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කර්මාන්තකරුවන්ට අවශ්‍ය නව තාක්ෂණය ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) මැටි නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට විසිතුරු මැටි භාණ්ඩ අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

(iii) 2015 හා 2016 වර්ෂවලදී මැටි භාණ්ඩ අපනයනයෙන් ලැබුණු විදේශ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1269/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ සේවයේ යෙදී සිටින විදුහල්පතිවරයන් සංඛ්‍යාව, එක් එක් කලාප අධ්‍යාපන කාර්යාල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 ජනවාරි 08 දිනෙන් පසුව, එම විදුහල්පතිවරයන්ට හෝ විදුහල්පති සේවයේ නොවන අයට හෝ විදුහල්පති සේවයේ උසස්වීම් ලබා දී තිබේද;

(iii) එසේ නම්, උසස්වීම් ලබා දී ඇති පුද්ගලයන් අතර දේශපාලන පළිගැනීමට ලක්වූවන් සිටින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1431/'16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 156ට අනුව, ප්‍රාදේශීය වැවිලි සමාගම් කොළඹ කොටස් වෙළඳපොළෙහි ලේඛනගත සමාගම් බවට පත් කිරීමේ අරමුණ සපුරා ගැනීම සඳහා 2016 වර්ෂය තුළදී අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(ii) 1992 වර්ෂයේදී පිහිටවූ ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ ඒවායේ හිමිකාරිත්වය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) වර්ෂ 1992 සිට 2016 දක්වා, ඉහත එක් එක් ප්‍රාදේශීය වැවිලි සමාගම්වල ලාභාලාභ ප්‍රමාණයන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත එක් එක් ප්‍රාදේශීය වැවිලි සමාගම් විසින් හිමිකරගෙන ඇති ඉඩම් අක්කර ප්‍රමාණයන් සහ ඒවායේ ඵලදායිතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2211/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව, මාමඩු, අක්බෝවිල් ප්‍රදේශයේ පුරාණ සුසාන භූමියක් පිහිටා තිබෙන බවත්;

(ii) එම සුසාන භූමිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සලකුණු කර ඇති බවත්;

(iii) මෑතකදී එම ප්‍රදේශයේ තේක්ක ගස් කපා දැමීමේ සිද්ධියක් හේතුවෙන් එම සුසාන භූමියට සහ එහි පිහිටා තිබෙන පුරාවස්තුවලට හානි සිදුවී විනාශ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සුසාන භූමියෙහි පුරාවස්තු විනාශ කිරීම සම්බන්ධයෙන් ඊට වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද;

(ii) අනාගතයේදී එම පුරාවස්තු ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2241/'17

ගරු බිමල් රත්නායක මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2335/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොරණ මූලික රෝහලේ සේවයේ නියුතු සුළු සේවා පාලක එස්. සොයිසා ගුණතිලක මහතා, සමස්ත ලංකා ඕවසියර් සංගමයේ ප්‍රධාන සභාපති ලෙස පත්වීම හේතුවෙන් එම සංගමයේ කටයුතු පහසුවෙන් ඉටු කිරීම පිණිස කළුතර මහ රෝහල වෙත ඔහු ස්ථාන මාරුවීමක් ඉල්ලුම් කර ඇති බවත්;

(ii) 2016.04.01 දින බස්නාහිර පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් මෙම ස්ථාන මාරුව අනුප්‍රාප්තිකයකු රහිතව සිදුකරන ලෙස පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට (බ.ප.) නිර්දේශකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙතෙක් එම ස්ථාන මාරුව ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2408/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කල්පිටිය, බත්තලන්ගුණ්ඩුව ධීවර ගම්මානයේ පදිංචිව සිටින ධීවර පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ධීවර ජනතාව ඉතා දැඩි පානීය ජල ගැටලුවකට මුහුණ පා සිටින බව දන්නේද;

(iii) එසේ නම්, එම ධීවර ජනතාව මුහුණ පා සිටින ජල ගැටලුව විසඳීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2478/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයට අනුමත කර ඇති සම්බන්ධීකරණ ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2016.01.02 දින සිට වත්මන් ජනාධිපතිවරයා යටතේ පත් කර ඇති සම්බන්ධීකරණ ලේකම්වරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සම්බන්ධීකරණ ලේකම්වරුන් පත් කර ඇති ක්ෂේත්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම එක් එක් සම්බන්ධීකරණ ලේකම්වරයාගේ නම, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් සම්බන්ධීකරණ ලේකම්වරයෙක් සඳහා ගෙවන වැටුප කොපමණද;

(iii) ඒ අනුව පසුගිය වර්ෂ දෙක තුළ එම සම්බන්ධීකරණ ලේකම්වරුන් සඳහා දරා ඇති සමස්ත පිරිවැය කොපමණද;

(iv) අදාළ සම්බන්ධීකරණ ලේකම්වරුන් විසින් එම පිරිවැයට සාපේක්ෂව ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටුකර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2482/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, ජායා මහා විද්‍යාලය, "පාසල් දහසක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට" අයත් පාසලක් බවත්;

(ii) ව්‍යාපෘතියට අදාළ තාක්ෂණ ගොඩනැගිල්ල පමණක් දැනට ඉදිකර ඇති බවත්;

(iii) එම ව්‍යාපෘතියට අදාළ අනෙක් ගොඩනැගිලි මෙතෙක් ඉදිකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතියට අදාළ අනෙක් ගොඩනැගිලි ඉදි නොකිරීමට හේතුව කවරේද;

(ii) එම ගොඩනැගිලි ඉදිකර දීමට අවශ්‍ය කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2504/'17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ ඇති මුළු රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) දිවයිනේ ඇති මුළු ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී දිවයිනේ ජාතික පාසල් සඳහා බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව වර්ෂය අනුව කොපමණද;

(iv) 2015, 2016 සහ 2017 වර්ෂවලදී දිවයිනේ ඇති පළාත් පාසල් සඳහා බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව වර්ෂය අනුව කොපමණද;

(v) 2016 වර්ෂයේ පළමු භාගය තුළ බාහිර හා අභ්‍යන්තර ඇගයීම් පද්ධති මඟින් ඇගයීමට ලක් කළ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(vi) 2016 අයවැයෙන් ග්‍රාමීය හා ප්‍රාදේශීය පාසල්වල ගුරු නිල නිවාස/ විවේකාගාර ස්ථාපිත කිරීම වෙනුවෙන් වෙන් කළ මුදල කොපමණද;

(vii) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2510/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පැල්මඩුල්ල, කිරිබත්ගල කන්ද නායයෑම හේතුවෙන් එම ගමේ පවුල් 30කට ආසන්න පිරිසකට උන්හිටිතැන් අහිමි වූ බවත්;

(ii) ආපදාවට ලක් වූ පවුල් සඳහා විකල්ප ඉඩම් ලබාදීමට තීරණය කර ඇත්තේ ගමෙන් කි.මී. 20ක පමණ ඈතින් පිහිටි දොඹගම්මන නමැති ප්‍රදේශයෙන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එලෙස දුර බැහැර ප්‍රදේශවලින් ලබාදී ඇති ඉඩම් වෙනුවට එම ගමට ආසන්නයේ පිහිටි කිරිබත්ගල රාජ්‍ය වතුයායෙන් ඉඩම් ලබාදෙන ලෙස ඔවුන් ඉල්ලා ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට කිරිබත්ගල රාජ්‍ය වතුයායෙන් ඉඩම් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2521/’17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2013 සිට 2017 දක්වා පොලිස් දෙපාර්තමේන්තුවේ පාවිච්චිය සඳහා කඳුළු ගෑස් මිලදී ගැනීමට වැය කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2529/’17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ආගමික ස්ථාන සඳහා සූර්ය විදුලිබල කට්ටල ලබාදීමේ ව්‍යාපෘතිය යටතේ විදුලි බලය ලබා දී ඇති ආගමික ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ආගමික ස්ථානයට සපයන ලද විදුලි පද්ධතියේ ධාරිතාවය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) 2017.06.01 දින වනවිට එම ව්‍යාපෘතිය සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iv) එම විදුලිබල කට්ටල මඟින් උත්පාදනය කරනු ලබන විදුලිබල ප්‍රමාණය කොපමණද;

(v) ආගමික ස්ථානවලට සූර්ය විදුලිබල කට්ටල නොමිලේ ලබාදීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2533/’17

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ, ලක්විජය ගල් අඟුරු බලාගාරය මඟින් සිදුවන පරිසර හානිය අවම කිරීම සඳහා යෝජිත සුළං ආවරණය ඉදිකිරීමට ගෙන ඇති පියවර කවරේද;

(ii) සුළං ආවරණය නොමැති වීමෙන් බලාගාරය අවට ජීවත්වන ගොවීන් බලවත් දුෂ්කරතාවයකට පත්වී ඇති බව දන්නේද;

(iii) සුළං ආවරණය ඉදිකිරීම ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම බලාගාර භූමිය තුළ අළු ගොඩ ගැසීම වැළැක්වීම සඳහා ගන්නා පියවර කවරේද;

(ii) බලාගාරයෙන් පිට වන අළු හේතුවෙන් වගා හානි වූ ගොවීන්ට ගෙවා ඇති වන්දි මුදල කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම බලාගාරය සඳහා වලංගු පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් තිබේද;

(ii) එම බලපත්‍රය නිකුත් කළ දිනය කවරේද;

(iii) එකී බලපත්‍රයේ කාලය අවසන් වන දිනය කවරේද;

(iv) එකී බලපත්‍රයේ සඳහන් කොන්දේසි ඉටු කිරීමට අසමත් වීමේ වගකීම ලංකා විදුලිබල මණ්ඩලය භාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2608/’17

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහාධිකරණයේ විභාග වූ අංක - එච්. සී./4648/2009 (නීතිපතිගේ අංක - සී. ආර්. - 2/26/2009) නඩුවේ විත්තිකරුවන් කවුරුන්ද;

(ii) එම අධි චෝදනා පත්‍රයේ නගා තිබූ අධි චෝදනා කවරේද;

(iii) එකී අධි චෝදනාවලින් සියලුම විත්තිකරුවන් නිදොස් කිරීමක් කර තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නිදහස් කළද, නීතිපතිවරයාට නැවතත් චෝදනා නිසි ලෙස සංස්ථාපනය කිරීමට හැකි බව තීන්දුවේ දන්වා තිබේද;

(ii) ඒ අනුව, නීතිපතිවරයා විසින් චෝදනා නිසි ලෙස සංස්ථාපනය කර විත්තිකරුවන්ට එරෙහිව නැවත නඩු පැවරීමක් කරනු ලබන්නේද;

(iii) එසේ නම්, නැවත නඩු පවරනු ලබන්නේ කවර කාලයක් තුළද;

(iv) එසේ නඩු නොපවරවන්නේ නම්, එකී තීරණයට අදාළ හේතු පිළිබඳව දැනුවත් කරන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 ජූනි මස 05 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

135/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රුපියල් කෝටි 400ක වැට් බදු මුදලක් වංචා කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවන් වූ පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන්ට ලබා දුන් දඬුවම් එක් එක් පුද්ගලයාට වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පුද්ගලයන්ට නියම කරන ලද දඩ මුදල් ඔවුන් විසින් ගෙවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත වැට් බදු වංචාවට සම්බන්ධ බොහෝ පිරිසක් සිටින බවත්;

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් මෙම වංචාවට සම්බන්ධ බවත්;

(iii) ඇතැම් පිරිස් මේ වනවිට රටින් පැන ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) වැට් බදු වංචාවට අදාළ සියලු පුද්ගලයන් පිළිබඳව විමර්ශන කටයුතු සිදුවන්නේද;

(ii) එසේ නම්, එමඟින් අනාවරණය කරගත් පුද්ගලයන්ගේ නම්, ලිපින, දුරකථන අංක හා තරාතිරම කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1197/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) යාපනය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේ යුදමය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1402/'16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැයෙහි අංක 169 යෝජනාවට අනුව, කුරුඳු හා ඒ ආශ්‍රිත පර්යේෂණ සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 5ක ප්‍රතිපාදනය වැය කළ ආකාරය පිළිබඳ වැය විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන භාවිතා කර සිදු කරන ලද පර්යේෂණ සංඛ්‍යාව, එම පර්යේෂණ සිදුකළ පර්යේෂකයන්ගේ නම් සහ ඒවායේ කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කුළුබඩු (ගම්මිරිස්, කරාබු නැටි සහ සාදික්කා) අපනයන සඳහා වූ සෙස් බදු ඉවත් කිරීම හේතුවෙන් 2016 වර්ෂයේදී සෙස් බදු ආදායම් අහිමිවීමේ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1508/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2016.12.31 දිනට සමස්ත කොටස් මිල දර්ශකයේ අගය කවරේද;

(ii) 2014.12.31 සහ 2015.12.31 දිනට සාපේක්ෂව, 2016.12.31 දිනට සමස්ත කොටස් මිල දර්ශකයේ අගය කොපමණ ප්‍රතිශතයකින් වෙනස් වී තිබේද;

(iii) 2016 වර්ෂය තුළදී ශුද්ධ විදේශීය මිලදී ගැනීම්වල අගය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1575/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිවරයාගේ නම හා ලිපිනය කවරේද;

(ii) ඔහුට හිමි වැටුප් හා දීමනා කවරේද;

(iii) එම සංස්ථාවේ කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ නම හා ලිපිනය කවරේද;

(iv) ඔහුට හිමි වැටුප් හා දීමනා කවරේද;

(v) උක්ත තනතුරු දෙකම එක් පුද්ගලයකු විසින් දැරීමට හේතු කවරේද;

(vi) තනතුරු දෙකක් එක් පුද්ගලයකු විසින් දැරීම සුදුසු නොවන බව මුදල් අමාත්‍යාංශය විසින් දැනුම් දී තිබේද;

(vii) එසේ නම්, එම උපදෙස් පිළිනොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1639/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් නමැති සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත වරින් වර සපයා ඇති මුළු ගල් අඟුරු ප්‍රමාණය කොපමණද;

(ii) එම ගල් අඟුරු වෙනුවෙන් ඉහත සමාගමට ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම සමාගම විසින් නිසි වෙලාවට ගල් අඟුරු සැපයීමට අසමත් වීම හේතුවෙන් නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ක්‍රියාකාරිත්වය අත්හිටුවීමට සිදු වූ කාලය කොපමණද;

(iv) එසේ විදුලි ජනක යන්ත්‍ර අත්හිටුවීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවී ඇති පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනය විසින් ලබාගෙන ඇති අංක LCC/09/T/02, LCC/01 සහ LCC/13/T/01 දරන ටෙන්ඩරවලට අදාළව ශ්‍රී ලංකාවේ දේශීය නියෝජිතයන් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(ii) ප්‍රසම්පාදන කාර්යය පටිපාටිය නොතකා ඉහත කී ගල් අඟුරු සැපයීම් එකී සමාගමට ලබාදීමට හේතුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1647/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඌව පළාත් සභාව විසින් ඉඩම් ඔප්පු ලබාදීමේ වැඩසටහනක් දියත් කර තිබේද;

(ii) එසේ නම්, වත්මන් ඌව ප්‍රධාන අමාත්‍යාවරයා එම ධූරයට පත්වීමෙන් අනතුරුව මේ දක්වා ලබා දී ඇති ඔප්පු සංඛ්‍යාව කොපමණද;

(iii) ඔප්පු ලබා දී ඇති පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් පදිංචි ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iv) මෙම ඉඩම් ඔප්පු ලබාදීමට පළාත් සභාව අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1669/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය සහ කැළිකසළ බැහැර කරන ස්ථාන කවරේද;

(ii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ව්‍යාපෘතියක් මෙම පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දී තිබේද;

(iii) එසේ නම්, 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ව්‍යාපෘතිය සඳහා එක් එක් පළාත් පාලන ආයතනයකට ලබා දී ඇති පහසුකම් හා මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1690/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2000.05.05 දිනැති අංක 1130/22 දරන ගැසට් නිවේදනය මඟින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, කොන්දේසි සහිතව නකල්ස් කඳු වැටිය සඳහා ලෝක උරුම තත්ත්වය ලැබුණු බවත්;

(ii) ඉහත කොන්දේසිවල ප්‍රධාන කොන්දේසිය ප්‍රකාරව, නකල්ස් කඳුවැටියට ඉතා ආසන්නව පිහිටි මිනිපේ, පන්විල, පාතදුම්බර, ලග්ගල, විල්ගමුව, රත්තොට, උකුවෙල හා මාතලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ට අයත් අක්කර 2000ක විශාලත්වයෙන් යුත් භූමි ප්‍රමාණයක් උක්ත කඳුවැටිය සමඟ ඒකාබද්ධ කර නොමැති බවත්;

(iii) එබැවින්, නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත්කිරීමේ අවදානමකට ලක්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත්කිරීම වළක්වා ගැනීම සඳහා ඉහත සඳහන් අක්කර 2000ක භූමි ප්‍රමාණය නකල්ස් කඳු වැටිය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1695/'17

ගරු මොහොමඩ් නවවි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2013 වර්ෂයේදී පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය සභාව, නොරොච්චෝලෙයි ගම්මානය තුළ ළමා උද්‍යානයක් පිහිටුවීමට අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එබඳු ළමා උද්‍යානයක් පිහිටුවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කාර්යය සඳහා කොපමණ මුදලක් ලැබී තිබේද;

(ii) එම මුදල් ලැබී ඇත්තේ කා වෙතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1697/'17

ගරු බිමල් රත්නායක මහතා,— විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ "ගූගල් ලූන්" ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගූගල් සමාගම හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකර ගත් ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) මේ සඳහා ගූගල් සමාගම තෝරා ගැනීමට රජය තීරණය කළ පදනම කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය ලබාදීමට එකඟ වූ හා ලබාදුන් පහසුකම් කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජයට වැය වූ මුදල කොපමණද;

(v) ගූගල් සමාගම ගුවන්ගත කළ බැලූනය කඩා වැටීමට බලපෑ හේතුව කවරේද;

(vi) ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් නිකුත් කර තිබේද;

(vii) ගූගල් සමාගම මෙම ව්‍යාපෘතිය අතහැර ඇති බවට ප්‍රකාශ කර තිබේද;

(viii) එසේ නම්, අදාළ ගිවිසුම හා එකඟතා කඩවීම හේතුවෙන් ඇති වූ මූල්‍යමය හා අනිකුත් හානි කවරේද;

(ix) එම හානිවල වගකීම පැවරෙන්නේ කාහටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1743/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) බන්ධනාගාර නියාමක තනතුරු සඳහා බඳවා ගැනීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ බව දන්නේද;

(ii) එසේ නම්, 2016.10.19 සිට 2016.10.27දක්වා පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ සහ 2016.11.03 සිට 2016.11.12 දක්වා පවත්වන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත අදාළ තනතුරු සඳහා තෝරාගන්නා ලද අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම තනතුරු සඳහා බඳවා ගැනීම් කර ඇති බව හා අදාළ ගිවිසුම් 2016.11.24 දින අත්සන් කරන ලෙස සුදුසුකම්ලාභීන්ට බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දී නැවත එය කල් දැමුවේ මන්ද;

(iv) එසේ කල් දැමූ පත්වීම් මේ වනවිටත් ලබා නොදීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පත්වීම් ලබා දීමේ ගැටලු සහගත තත්ත්වයක් තිබියදී, පත්වීම්ලාභීන් අපහසුතාවයට පත්වන අයුරින් ඔවුන්ට ගිවිසුම් ලිපි ලබා දුන්නේ මන්ද;

(ii) සුදුසුකම් සපුරන ලද පත්වීම්ලාභීන්ට පත්වීම් ලබා නොදීමෙන් ඔවුන් දැඩි අපහසුතාවයකට පත්ව සිටින බව පිළිගන්නේද;

(iii) එසේ නම්, පත්වීම් නැවත ලබාදීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1749/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන ගුවන් විදුලි නාලිකා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් විදුලි නාලිකා පවත්වාගෙන යනු ලබන ආයතන කවරේද;

(iii) එම ගුවන් විදුලි නාලිකාවල හිමිකරුවන් සහ එම නාලිකා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ආරම්භකර විකාශනය පවත්වාගෙන නොයන ගුවන් විදුලි නාලිකා තිබේද;

(v) එසේ නම්, එම නාලිකා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගුවන් විදුලි නාලිකා නියාමනය කරනු ලබන ආයතනය කවරේද;

(ii) දැනට එම ගුවන් විදුලි නාලිකා නියාමනය විධිමත්ව සිදු නොවන බව පිළිගන්නේද;

(iii) සමාජ හානියන් සිදුවන අයුරින් යම් යම් ගුවන් විදුලි නාලිකා මඟින් සිදු කරනු ලබන ප්‍රචාරයන් විකාශනය කිරීම වැළැක්වීම සඳහා ගුවන් විදුලි නාලිකා නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1842/’17

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ, ඔඩ්ඩිසුඩ්ඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති උළු කර්මාන්තශාලාව ක්‍රියාත්මක නොවන බව දන්නේද;

(ii) මෙම කර්මාන්තශාලාව සඳහා 2016 වර්ෂයේ අයවැයෙන් වෙන් කළ මුදල් ප්‍රතිපාදනය කොපමණද;

(iii) එම මුදල වියදම් කරනු ලැබුවේ කවුරුන් හරහාද;

(iv) එම වෙන් කරන ලද මුදලින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1874/’17

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014 වර්ෂයේ දෙසැම්බර් මාසයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති වූ දැඩි ගංවතුර තත්ත්වය හේතුවෙන් කින්නියා ප්‍රදේශයේ කුරින්ජක්කේනි පාලම විනාශ වූ බවත්;

(ii) මේ දක්වා එම පාලම සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය නොකර තාවකාලිකව ප්‍රතිසංස්කරණය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දෛනිකව විශාල ජනතාවක් විසින් භාවිතා කරනු ලබන මෙම පාලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ගනු ලැබූ පියවර කවරේද;

(ii) මේ දක්වා මෙම පාලම ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

(iii) මෙම පාලම හැකි ඉක්මනින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2018 ජූනි මස 06 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

838/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ කොටුව, මරදාන, මහනුවර, යාපනය, මාතර, ගාල්ල, හික්කඩුව, ත්‍රිකුණාමලය සහ කුරුණෑගල වැනි බොහෝ දුම්රිය ස්ථානයන්හි වැසිකිළි, ආපනශාලා ඇතුළු මූලික පහසුකම් ඉතා අවම මට්ටමක පවතින බවත්;

(ii) එම දුම්රිය ස්ථානවල ප්‍රමිතියෙන් බාල ආහාරපාන අධික මිලකට විකුණනු ලබන බවත්;

(iii) විදේශීය සංචාරකයන් වැඩි වශයෙන් මෙම දුම්රිය ස්ථාන භාවිතා කරන බැවින් මෙම තත්ත්වය රටේ සංචාරක කර්මාන්තයටද සෘජුව බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම දුම්රිය ස්ථානයන්හි පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) එම වැඩි දියුණු කිරීම් සඳහා මුදල් ප්‍රතිපාදන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1517/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව වෙනුවෙන් රජය විසින් දරන ලද මුළු වියදම කොපමණද;

(ii) එම කමිටුවේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) එකී කමිටුවට සාමාජිකයන් පත් කිරීමේ දී සලකා බැලූ නිර්ණායක කවරේද;

(iv) බුද්ධාගම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති දෙවන පරිච්ඡේදය ඒ අයුරින්ම පවත්වා ගෙන යෑමට නිර්දේශ කර ඇති කමිටු සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1738/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015 සහ 2016 වර්ෂවලට අදාළව, ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සඳහා 2016.10.18 දිනැති විගණන විමසුමක් නිකුත් වී තිබෙන බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, එම විගණන විමසුමේ පාසල් පාදක කළමනාකරණ හා පාසල් පාදක ගුරු සංවර්ධනය පිළිබඳව තායිලන්තයේ හා පිලිපීනයේ පැවති ගුරු පුහුණු වැඩමුළුවලට අදාළව, අංක 2, ආ, ඇ, ඈ, ඉ සහ ඊ යන වගන්තිවල දැක්වෙන කරුණු සහ අංක 3 ඡේදයේ දැක්වෙන කරුණු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) එහිදී සිදු වී ඇති යම් අක්‍රමිකතා, දූෂණ හා නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නිලධාරින්ට එරෙහිව පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1750/'17

ගරු ලකී ජයවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පවත්වාගෙන යනු ලබන රූපවාහිනී නාලිකා සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් රූපවාහිනී නාලිකාව පවත්වාගෙන යනු ලබන ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් රූපවාහිනී නාලිකාවල හිමිකරුවන් සහ ඒවා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ ආරම්භ කර ඇති රූපවාහිනී නාලිකාවලින් දැනට විකාශනය පවත්වාගෙන නොයන නාලිකා තිබේද;

(ii) එසේ නම්, එම නාලිකා කවරේද;

(iii) රූපවාහිනි නාලිකා නියාමනය සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(iv) එම නියාමනය නිසි අයුරින් ක්‍රියාත්මක නොවන බව පිළිගන්නේද;

(v) ද්වේශ සහගතව හා උපහාසාත්මකව යම් යම් නාලිකා මඟින් සිදු කරන බරපතල සමාජ හානි වැළැක්වීම සඳහා රූපවාහිනී නාලිකා නියාමනය කිරීමට කඩිනමින් විධිමත් ක්‍රමවේදයක් සකස් කරන්නේද;

(vi) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1814/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අ.පො.ස. (උසස් පෙළ) ජීව විද්‍යා හා ගණිත විෂය ධාරාවන් පැවැත්වෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විෂය ධාරාවල එක් එක් විෂය සඳහා, අවශ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව, දැනට සිටින ගුරුවරුන් සංඛ්‍යාව සහ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා විෂය ධාරාවන් සඳහා ගුරුවරුන් හිඟවීමට බලපා ඇති හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1979/'17

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තිරියාය ප්‍රදේශයේ පිහිටි ගිරිහඩු සෑය පූජා භූමියට අයත් ඉඩම් මැන අවසන් කර තිබේද;

(ii) එසේ නම්, මැන හඳුනාගත් භූමිය මත සලකුණු යෙදීම සිදුකර තිබේද;

(iii) මැනීම් මගින් හඳුනාගෙන ඇති පූජා භූමියට අයත්වන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) අදාළ පිඹුරුපත් බුද්ධශාසන අමාත්‍යාංශයට ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1981/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහවැලි සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වයඹ ඇල ව්‍යාපෘතියේ ප්‍රධාන ඇල මාර්ගය ගමන් ගන්නා දඹුල්ල, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කි.මී. 20 ක දුර ප්‍රමාණයක ඇලට පහළින් පිහිටි දැනට වැසි දියෙන් පමණක් පෝෂණය වන කුඩා වැව් අමුණු ප්‍රමාණය, එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කුඩා වැව් අමුණු පද්ධති සියල්ලම පෝෂණය කිරීම සඳහා වයඹ ඇල මඟින් වාරි ජලය සපයනු ලබන්නේද;

(iii) ඒ සඳහා මේ වනවිට සැලසුම් සකස් කර තිබේද;

(iv) ඉහත (i) හි සඳහන් වැව් අතරින් වයඹ ඇල ව්‍යාපෘතියෙන් ජලය සපයනු ලබන හා සපයනු නොලබන වැව්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ප්‍රධාන ඇලට පහළින් ඇති වැව් අමුණු පෝෂණය නොකර, වයඹ පළාතට ජලය සැපයීම දඹුල්ල, ගලේවෙල ගොවි ජනතාවට කරනු ලබන අසාධාරණයක් නොවන්නේද;

(vi) එයට පිළියමක් ලෙස ජලය සපයනු නොලබන වැව් සඳහා ජලය සැපයීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1991/'17

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වතුයායවල් පිහිටි ප්‍රදේශවල පිහිටා තිබෙන ප්‍රාදේශීය සභාවන්ට තමන්ගේ සේවාවන් ඉටු කිරීමට නොහැකිවනසේ ප්‍රාදේශීය සභා නීති විධිවිධානයන් අන්තර්ගත වී ඇති බවත්;

(ii) ඒවා සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති බවත්;

(iii) මේ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම නීති, විධිවිධාන සංශෝධනවල වත්මන් තත්ත්වය කවරේද;

(ii) එම සංශෝධන සිදු කිරීම සඳහා කිසියම් බාධාවන් තිබේද;

(iii) මෙම නීති සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 ජූනි මස 07 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

889/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෙසෙන ගාඩි ජනතාව පිළිබඳ සමීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ජනතාව ජීවත් වන ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) පවුල් සංඛ්‍යාව හා පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ජනතාවගේ නිවාස හා ඉඩම් ගැටලු පිළිබඳ රජය මැදිහත්වීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) උක්ත ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවයන් හා පාරම්පරික උරුමයන් රැකගෙන ජීවත්වීම සඳහා රජය අනුග්‍රහයන් ලබාදී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගාඩි ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමට සහ ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1199/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේ යුදමය තත්ත්වය නිම වනතෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1403/'16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැයෙහි අංක 174 යෝජනාවට අනුව, ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන යටතේ අමතර වැඩසටහන් සඳහා වෙන්කළ රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදන 2016 වර්ෂය තුළදී වැයකළ ආකාරය පැහැදිලි කරන්නේද;

(ii) උක්ත යෝජනාව අනුව මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් "අමතර වැඩසටහන්" කවරේද;

(iii) මෙකී අමතර වැඩසටහන් සඳහා වගකීම දරන ලද ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී,

(i) පාරිසරික සමතුලිත බව ආරක්ෂා කිරීම, තිරසර ඉඩම් කළමනාකරණය;

(ii) ජීව සම්පත් සංරක්ෂණය;

(iii) පරිසර දූෂණය පාලනය;

(iv) වන සම්පත ආරක්ෂා කිරීම;

සඳහා වැය කර ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1879/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015.01.08 දින සිට මේ දක්වා කැබිනට් අමාත්‍යවරයන්, රාජ්‍ය අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් සඳහා වාහන මිලදී ගත් අවස්ථා කවරේද;

(ii) එක් එක් වාහනයේ වර්ගය හා මිල කවරේද;

(iii) එම වාහන සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1997/'17

ගරු බිමල් රත්නායක මහතා,— නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට 2015 සිට 2017 වර්ෂයේ ජූනි මස 30 දක්වා ලැබුණු පැමිණිලි සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 සිට 2017 ජූනි මස 30 දක්වා,

(i) විභාග කර අවසන් කර ඇති, විභාග කරමින් පවතින සහ විභාග කිරීම ආරම්භ නොකළ පැමිණිලි සංඛ්‍යාව;

(ii) අධිකරණයන්හි නඩු පවරා ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iii) නඩු පැවරීමට හෝ නීතිපති උපදෙස් සඳහා යොමුකර ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iv) මේ වනතෙක් නීතිපති උපදෙස් නොලැබුණු පැමිණිලි සංඛ්‍යාව;

(v) පවරා ඇති නඩුවලින් දේශපාලනඥයන් හා සම්බන්ධ නඩු සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2073/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010 වර්ෂයේදී වවුනියාව, නෙඩුන්කර්ණි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, පුදුවිලාන්කුලම්, පුට්කුලම්, කුංජුකුලම්, මන්නකුලම්, කොල්ලර් පුලියන්කුලම් යන ගම්මාන 05ක පවුල් 270ක් පමණ නැවත පදිංචි කරන ලද බවත්;

(ii) මෙම ගම්මාන මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලට මායිම්ව පවතින බවත්;

(iii) නැවත පදිංචි කරන ලද කාලයේ සිට මේ දක්වා මෙම ජනතාවට කිසිදු මූලික පහසුකම් හෝ නොමැතිව දැඩි පීඩාවන්ට මුහුණ පා සිටින බවත්;

(iv) A - 9 මාර්ගයට පැමිණීම සඳහා ප්‍රවේශ මාර්ග නොමැති වීම සහ ගම්මාන හරහා තිබෙන දුම්රිය මාර්ගයට හරස්ව වැටී ඇති පාරවල් සඳහා ආරක්ෂාකාරි දුම්රිය ගේට්ටු නොමැති වීමෙන් මෙම ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මානවලට අවශ්‍ය මූලික පහසුකම් ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පහසුකම් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2120/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2015.01.09 දිනට සහ 2017.06.30 දිනට,

(i) යාපනය දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර තිබූ ශ්‍රී ලංකා නාවික හමුදා කඳවුරු සංඛ්‍යාව;

(ii) එම කඳවුරුවලට අනුයුක්තව සේවය කළ මුළු නිලධාරින් සංඛ්‍යාව හා සෙබළුන් සංඛ්‍යාව;

(iii) එක් එක් කඳවුරෙහි නම, පිහිටා තිබූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ අනුයුක්තව සිටි නිලධාරින් සහ සෙබළුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015.01.09 දින සිට 2017.06.30 දක්වා යාපනය දිස්ත්‍රික්කයෙන්,

(i) ඉවත් කර ඇති නාවික හමුදා කඳවුරු සංඛ්‍යාව;

(ii) නාවික හමුදා කඳවුරුවලින් ඉවත් කර ඇති නිලධාරින් හා සෙබළුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) යාපනය දිස්ත්‍රික්කයෙන් නාවික හමුදා කඳවුරු හා ඒවායේ සේවයේ නියුතු නිලධාරින් හා සෙබළුන් ඉවත් කර හමුදාව දුර්වල කිරීම ජාතික ආරක්ෂාවට බලවත් තර්ජනයක් බව පිළිගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2126/'17

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ ගොවිජන බලප්‍රදේශයේ, ගිරිඋල්ල විහාරස්ථානයට අයත් ජම්බුගහමුලදෙනිය නැමති කුඹුර නිසි අවසරයකින් තොරව පුරවා පෞද්ගලික මාර්ගයක් ඉදිකර ඇති බවත්;

(ii) මේ සඳහා කූඨ ලේඛන සකස් කිරීමට රජයේ මුදල් වියදම් කර ඇති බවත්;

(iii) ඉහත මාර්ගය ඉදිකර ඇත්තේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහයකවරයෙකුගේ නිවසක් සඳහා ප්‍රවේශ මාර්ගයක් වශයෙන් බවත්;

(iv) ඉහත මාර්ගයේ ආරම්භක කොටසද අනවසර ලෙස ඉදිකර ඇති බවත්;

(v) මෙම ස්ථානයේ අඩිපාරක් හෝ නොතිබුනු බවත්; ප්‍රාදේශීය සභාවට අයත් නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මහජන මුදල් අවභාවිතා කරන මෙවැනි නිලධාරින් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2175/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2014 වර්ෂයේදී බදුල්ල දිස්ත්‍රික්කයේ, මීරියබැද්ද නායයෑමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන්ට රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2187/'17

ගරු ප්‍රසන්න රණතුංග මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගුරුවරුන් නව දැනුමෙන් පෝෂණය කිරීමට ගුරු පුහුණු වැඩසටහන් ඉවහල් වන බව පිළිගන්නේද;

(ii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කලාප හා විෂය මට්ටමින් ගුරු පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබුවේද;

(iii) එසේ සංවිධානය කළ ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව, විෂයයන් හා ඊට වැය වූ මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2016.06.06 දිනට බස්නාහිර පළාතේ, මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් පාසල අනුව කොපමණද;

(ii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී ඔවුන් පුහුණු කිරීමට පවත්වා ඇති වැඩසටහන් සංඛ්‍යාව සහ ඊට වැය වූ මුදල, එක් එක් විෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ සඳහා වෙන්කළ මුදල හා ක්‍රියාත්මක කළ ගුරු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(iv) ගුරු පුහුණු වැඩසටහන්වලට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදලින් ප්‍රතිපාදන වෙන් කිරීමට නොහැකි බව දන්නේද;

(v) ජාතික අවශ්‍යතාවයක් සේ සලකා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ විමධ්‍යගත අරමුදලින් ගුරු පුහුණු වැඩසටහන්වලට ප්‍රතිපාදන වෙන් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2189/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය අමාත්‍ය මණ්ඩල සංශෝධනයට අනුව වර්තමාන රජයේ සම්පූර්ණ කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අමාත්‍යාංශ අධීක්ෂණ කටයුතු පැවරූ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) කැබිනට් අමාත්‍යවරයෙකු සඳහා වාර්ෂිකව වැය වන මුළු මුදල කොපමණද;

(v) අමාත්‍ය මණ්ඩල සංශෝධනයේදී අලුතින් වැඩි කරන ලද අමාත්‍යාංශ සඳහා 2017 අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(vi) එසේ නම්, වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2192/'17

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම පවත්වාගෙන යනු ලැබූ ගුවන් ගමන් වැඩසටහන්, 2016.10.30 දින සිට සී/ස ශ්‍රීලංකන් එයාර් ලයින්ස් වෙත පවරා ගත් බව දන්නේද;

(ii) ඊට සමගාමීව සී/ස ශ්‍රීලංකන් එයාර් ලයින්ස් වෙත බඳවා ගත් මිහින් ලංකා සේවකයන් සංඛ්‍යාව කොපමණද, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එසේ බඳවා නොගෙන සේවය අවසන් කළ මිහින් ලංකා සේවකයන් සංඛ්‍යාව කොපමණද, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) සේවය අවසන් කළ එක් එක් සේවකයාට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2016.12.31 දිනෙන් පසුව සේවයේ යොදවා සිටින අයගේ නම් හා තනතුරු කවරේද;

(vi) 2016.12.31 දින තෙක් උපදේශක තනතුරු දරමින් සේවය කළ පිරිස කොපමණද;

(vii) ඉහත (vi) හි සඳහන් පිරිස අතරින් ඉදිරි මාස සඳහා වැටුප් ගෙවා ඇති සංඛ්‍යාව කොපමණද, ඔවුන්ට ගෙවන ලද වන්දි මුදල් සහ වැටුප් හෝ දීමනා කොපමණද;

(viii) ප්‍රමාණවත් වන්දි නොලැබීම නිසා අභියාචනා ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව කොපමණද;

(ix) ඔවුන්ට හිඟ වන්දි මුදල් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2194/'17

ගරු විමලවීර දිසානායක මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2006 අංක 27 දරන දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනතට අනුව මත්පැන් හා දුම්පානය කිරීමේ දර්ශන ඇතුළත් ටෙලිනාට්‍ය, චිත්‍රපට හෝ දැන්වීම් ප්‍රචාරය තහනම් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පාලනය කෙරෙන ස්වාධීන රූපවාහිනී නාලිකාව 2017.02.11 වැනි දින ප.ව. 7.30ත් 8.00 ත් අතර විකාශය කළ "ස්වේත ගංතිර" ටෙලි නාට්‍යයේ ජවනිකාවක, නිළියක දුම්පානය කරන අයුරු ඉතා පැහැදිලි ලෙස ප්‍රදර්ශනය කළ බවත්;

(ii) විශේෂයෙන් කාන්තාවක් දුම්පානය කරන දර්ශන විකාශය කිරීම හේතුවෙන් දුම්පානය සඳහා උත්තේජනයක් ඇති වියහැකි බවත්;

(iii) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක විධිවිධාන රජයේ ජනමාධ්‍ය ආයතනයක් විසින්ම කඩ කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එම විකාශය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර මින් ඉදිරියට එවැනි සිදුවීම් වැළැක්වීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2196/'17

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයට අයත් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට සහ රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වතුවල සේවය කරන කම්කරුවන්ගේ වැටුපෙන් අඩුකරනු ලබන සේවක අර්ථසාධක අරමුදල්, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් හා පාරිතෝෂික දීමනා 2016 වර්ෂය අවසාන වනවිටත්, වසර ගණනාවක සිට එම කම්කරුවන්ට ගෙවා නැති බව පිළිගන්නේද;

(ii) මෙම වතුවල සේවයේ යෙදී සිටින කම්කරුවන් සංඛ්‍යාව හා මේ වනවිට ඔවුන්ට ගෙවිය යුතු හිඟ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අරමුදල් ලැබිය යුතු සමහර කම්කරුවන් මේ වනවිට මියගොස් ඇති අතර මෙම මුදල් ඔවුන් වෙත නොගෙවීමෙන් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හට බරපතල අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගන්නේද;

(iv) මෙම මුදල් වහාම කම්කරුවන්ට ගෙවීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2204/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ත්‍රිවිධ හමුදාව සඳහා පුද්ගලයන් බඳවාගැනීමේදී, ආධුනික අපේක්ෂකයාගේ කල්ක්‍රියාව, චරිතය හා අධ්‍යාපන සුදුසුකම් ඉතා උසස් තත්ත්වයෙන් තිබුනද, පියාට අනවසර මත්පැන් චෝදනා තිබීම හෝ දඩ ගැසීම් සිදු කර තිබීම හේතුවෙන්, ආධුනික අපේක්ෂකයාගේ බඳවාගැනීම අහෝසිවී යන බව එතුමා දන්නෙහිද?

(ආ) මේ නීතිය ඉවත් කරලීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 ජූනි මස 08 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

890/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1997 මැයි 02 වැනි දින එවකට ජනාධිපතිතුමියගේ අත්සනින් යුතුව රතුගල ආදිවාසී ජනතාව වෙත අක්කර දෙක බැගින් ජයභූමි ඔප්පු ලබාදුන් බවත්;

(ii) මෙතෙක් ඔවුන්ට එම ඉඩම්වල අයිතිය ලබා දී නොමැති බවත්;

(iii) එම ඔප්පු මඟින් වෙන් කළ සීමා නොතකා නිලධාරීන් විසින් වනාන්තරයේ මැනුම් කටයුතු සිදුකර සීමා ලකුණු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ජනතාවට ජයභූමි ඔප්පු මඟින් ලබාදුන් ඉඩම්වල අයිතිය ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත ආදිවාසී ජනතාවට වනාන්තරය ආශ්‍රිතව දඩයම් කිරීම හා වෙනත් ආහාර සොයා ගැනීමට අවසර ලබා දී තිබේද;

(ii) ඒ සඳහා සීමාවක් පනවා තිබේද;

(iii) එසේ නම්, ඒ සීමාවන් කවරේද;

(iv) එම සීමා ලිහිල් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මෙම ආදිවාසී ජනතාවගේ, ජීවන තත්ත්වය ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1271/’16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වසරේ අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා මොණරාගල දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) 2015 වසරේ ඉහත දිස්ත්‍රික්කයෙන් අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා ඉදිරිපත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iv) එම ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව, එක් එක් පාඨමාලාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. (සා.පෙළ) සහ අ.පො.ස. (උ.පෙළ) යන විභාග තුනෙහි මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිඵලය, සමස්ත ජාතික ප්‍රතිඵලය සමඟ සංසන්දනාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1432/’16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය ලේඛනයෙහි, කුකුල් පාලනය වෙනුවෙන් වූ එකම යෝජනාව, අංක 155 වශයෙන් ඉදිරිපත් කරන ලද බව පිළිගන්නේද;

(ii) එම යෝජනාවෙහි 2016 වර්ෂය සඳහා වූ ප්‍රගතිය කවරේද;

(iii) 1977 සිට 2016 දක්වා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද සහ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කුකුල් මස් ප්‍රමාණය හා ඒවායේ වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1760/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියේ නම, අපේක්ෂිත අරමුණු සහ ආවරණය වන ප්‍රදේශය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා බඳවාගත් සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සේවකයන් බඳවාගත් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2109/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කලුතර දිස්ත්‍රික්කයේ, මතුගම අධ්‍යාපන කලාපයේ පිහිටි කලෙලේමගල් දෙමළ විද්‍යාලයේ ශිෂ්‍යයන් හාරසියයකට අධික පිරිසක් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) දක්වා අධ්‍යාපනය ලබමින් සිටින බවත්;

(ii) මෙම පාසල "ළඟම පාසල-හොඳම පාසල" වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා මාස දෙකකට පෙර මුල්ගල් තැබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අ(ii)හි සඳහන් සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(ii) ඉහත පාසලෙහි අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම පන්ති ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2203/'17

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙස්ට්හෝල් වත්තේ පිහිටි වෛද්‍ය මධ්‍යස්ථානය රජයට පවරාගෙන ග්‍රාමීය රෝහලක් බවට පත් කරන ලද බවත්;

(ii) මෙම ග්‍රාමීය රෝහල මඟින් එම ප්‍රදේශයේ පවුල් 3500 - 4000 ක් අතර ප්‍රමාණයකට සේවය සැලසූ බවත්;

(iii) දැනට වසරකට පෙර වෛද්‍යවරුන් හා උපකරණ හිඟය හේතුවෙන් මෙම රෝහල වසාදමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මෙම රෝහල නැවත විවෘත කර වතුකරයේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් විසඳීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2215/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොලොන්නාව අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි එකම මිශ්‍ර ජාතික පාසල කුඩා බුත්ගමුව රාජසිංහ විද්‍යාලය බවත්;

(ii) මේ වනවිට එම විද්‍යාලය භෞතික හා මානව සම්පත් හිඟ වීමෙන් දිනෙන් දින අභාවයට යමින් පවතින බවත්;

(iii) මෙම ජාතික පාසලේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 26ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 10ක් පවතින බවත්;

(iv) මේ හේතුවෙන් මෙම විද්‍යාලයේ සිසු සිසුවියන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් පසුව අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීමට වෙනත් පාසල් කරා යොමු වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ඇති සැලසුම් කවරේද;

(ii) ඒ සඳහා පියවර ගනු ලබන දිනය කවරේද;

(iii) 2017 වර්ෂයේදී මෙම විද්‍යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන වෙන් වශයෙන් කවරේද;

(iv) එම ප්‍රතිපාදනවලින් දැනට සිදුකර ඇති වැඩසටහන්වල ප්‍රගතිය කවරේද;

(v) 2018 වර්ෂයේදී මෙම විද්‍යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබාදීමට සැලසුම්කර තිබේද;

(vi) එසේ නම්, එම ප්‍රතිපාදන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2221/'17

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අංක WPGD 4998 දරන වාහනය හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයට අයත් බවත්;

(ii) 2000 වර්ෂයේදී මිලදීගෙන ලියාපදිංචි කර ඇති එම වාහනය මේ වනවිට කවර පුද්ගලයකුගේ භාරයේ පවතින්නේද යන්නත්;

(iii) උක්ත වාහනය කලකට පෙර වාවකච්චේරිය ප්‍රදේශයේ දේශපාලන බලවතෙකුගේ භාවිතයේ පැවති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, උක්ත වාහනය යළි ඔබ අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා ලබා ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2233/'17

ගරු ඩී. වී. චානක මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට වරාය පෞද්ගලීකරණය සඳහා සමාගම් දෙකකින් යෝජනා ඉදිරිපත් කර තිබුණේද;

(ii) එසේ නම්, එම සමාගම්වලින් එක් සමාගමක් තෝරාගන්නා ලද පදනම කවරේද;

(iii) එම සමාගම තෝරා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව මඟින් ලබාදුන් නිර්දේශ කවරේද;

(iv) තෝරාගත් සමාගම සමඟ අත්සන් කරන ගිවිසුම් දෙක කවරේද;

(v) එම ගිවිසුම් මඟින් ස්ථාපනය කරන සමාගම් දෙකෙහි කොටස් බෙදීයන ආකාරය කවරේද;

(vi) එම සමාගම් දෙකට පැවරෙන කාර්යයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vii) එම සමාගම්වලට ලැබෙන ආදායම් මාර්ග කවරේද;

(viii) දැනට සේවය කරන සේවකයන්ගේ රැකියා සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ix) වරායේ නඩත්තු කටයුතු පැවරෙන සමාගම කවරේද;

(x) මෙම පෞද්ගලීකරණය හරහා රජයට හා ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලැබෙන ආදායම් ප්‍රභවයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2242/'17

ගරු බිමල් රත්නායක මහතා,— විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2284/'17

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3(1) ශ්‍රේණියට උපාධිධාරින් බඳවා ගැනීම සඳහා 2017 වර්ෂයේ විභාගය පැවති දිනය කවරේද;

(ii) ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පැවති මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවති බව පිළිගන්නේද;

(iii) එම නිසා, විභාග අපේක්ෂකයන්ට ඉහත ඕනෑම භාෂාවකින් පිළිතුරු සැපයිය හැකි වූ බව පිළිගන්නේද;

(iv) ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා සිංහල භාෂාවෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට තේරී පත්වීමට අවස්ථාවක් ලබා නොදී තිබේද;

(v) එසේ නම්, සිංහල මාධ්‍ය ප්‍රශ්න පත්‍රයටද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුයැයි අදාළ විභාගය සඳහා අයදුම්පත් කැඳවූ ගැසට් පත්‍රයේ හෝ වෙනත් ආකාරයකින් පූර්ව දැනුම්දීමක් කර තිබුණේද;

(vi) ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයීම නුසුදුසුකමක් වන්නේ යැයි පූර්ව දැනුම්දීමක් කර නොතිබියදී, සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන් තෝරා නොගැනීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2336/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2006 - 2015 කාලසීමාව තුළ විශේෂ ජනාධිපති සමාව යටතේ නිදහස් කළ සිරකරුවන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන්ගේ නාම ලේඛනය හා සිරගතවීමට අදාළ වූ චෝදනා සඳහන් කරන්නේද;

(iii) එසේ නිදහස ලැබූවන් අතර මිනීමැරුම් චෝදනාවලට, ස්ත්‍රී දූෂණ චෝදනාවලට හා ළමා අපචාර චෝදනාවලට ලක්වූවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2401/'17

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය දිනවල පැවති දැඩි නියඟය හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පීඩාවට පත් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) පීඩාවට පත්වූ එම පවුල් පිළිබඳ වාර්තා වූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) නියඟය නිසා පීඩාවට පත් වූ ජනතාවගේ පානීය ජල ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගත් පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2409/’17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාදම්පේ, ඓතිහාසික තනිවැල්ල දේවාලය අසළ කිනිපිටිය වැව නමින් වැවක් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම වැවේ ජලයෙන් වගා කරන කුඹුරු ප්‍රමාණය කොපමණද;

(iii) එමගින් ප්‍රතිලාභ ලබන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) අද වනවිට එම වැවේ විවිධ ජලජ ශාක වැඩී වැව ඉතා අබලන් තත්ත්වයට පත්ව තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, එම වැව කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2456/’17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව නගරයේ සිට තලාව හරහා අනුරාධපුරය දක්වා දිවෙන (තලාව පාර) මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු දැනට ඉපලෝගම නගරය දක්වා සිදුකර වර්ෂ ගණනාවක් ගත වී ඇතත්, එතැන් සිට තලාව නගරය දක්වා වූ මාර්ගය මෙතෙක් සංවර්ධනය කර නොමැති බව දන්නේද;

(ii) වාහන විශාල සංඛ්‍යාවක් ධාවනය වන මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු මෙලෙස ඇණ හිටීමට හේතු කවරේද;

(iii) මෙම මාර්ගයේ ඉතිරි සංවර්ධන කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 ජූනි මස 19 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

1054/’16

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පුහුණු වැඩසටහන් සඳහා කොළඹට පැමිණෙන එම දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට නිසි නවාතැන් පහසුකම් ලබා නොදෙන බවත්;

(ii) එම අවස්ථාවන්හිදී ඔවුන්ට ගෙවනු ලබන අනෙකුත් ගෙවීම්ද ප්‍රමාණවත් නොවන බවත්;

(iii) මේ හේතුවෙන් එම නිලධාරීන් දුෂ්කරතාවයට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවීමේදී උක්ත නිලධාරින්ට කොළඹදී නවාතැන් පහසුකම් ලබාදෙන ස්ථාන කවරේද;

(ii) මෙම ස්ථාන පිළිබඳ නිලධාරින්ගේ පැමිණිලි ලැබී තිබේද;

(iii) එසේ නම්, එම පැමිණිලි සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම නිලධාරින්ට සුදුසු නවාතැන් සපයා දීමට අවශ්‍ය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(iii) මෙම නිලධාරින්ට ගෙවනු ලබන පුහුණු දීමනා, ප්‍රවාහන දීමනාව හා වෙනත් දීමනා ඉහළ දැමීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1272/’16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළමු එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදී ප්‍රහාරය සිදු කරන ලද දිනය කවරේද;

(ii) එම ප්‍රහාරය සිදු වූ ස්ථානය කවරේද;

(iii) එම ප්‍රහාරය එල්ල කරන ලද්දේ කා හටද;

(iv) එයින් අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් පළමුවෙන්ම සිවිල් වැසියන් ඉලක්කකර එල්ල කරන ලද ප්‍රහාරය කවරේද;

(ii) එම ප්‍රහාරය එල්ල කරන ලද දිනය කවරේද;

(iii) ප්‍රහාරය සිදු වූ ස්ථානය කවරේද;

(iv) එයින් අහිමි වූ මිනිස් ජීවිත සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් පළමුව ආගමික ස්ථානයකට එල්ල කළ ප්‍රහාරය කවරේද;

(ii) එම ප්‍රහාරය එල්ල කරන ලද දිනය කවරේද;

(iii) ප්‍රහාරය සිදු වූ ස්ථානය කවරේද;

(iv) එයින් විනාශ වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1433/'16

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 154ට අනුව, ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබුවේද;

(ii) එම යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී බලපත්‍ර ලබා ගත් තැනැත්තන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එකී බලපත්‍රලාභියකු විසින් අවම වශයෙන් ධීවරයන් 100 දෙනෙකු එම කාර්යයන් සඳහා යොදවා ගැනීමේ කොන්දේසිය ඉටු කරනු ලැබුවේදැයි නිරීක්ෂණය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1761/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ප්‍රාදේශීය සභා ඇතුළු පළාත් පාලන ආයතන විසුරුවා හැර ඇති බැවින් ඒවායේ පාලන කටයුතු කරන පුද්ගලයන් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) පළාත් පාලන ආයතන සතු වාහන සංචිත ප්‍රමාණය කවරේද;

(iv) අද වනවිට පළාත් පාලන ආයතන නියෝජිතයන් නොමැතිව ක්‍රියාත්මක වන බැවින්, මෙම පළාත් පාලන ආයතන සතු වාහන වෙනත් ආයතන සඳහා ලබා දී තිබේද;

(v) එසේ නම්, වාහන ලබා දී ඇති ආයතන සහ පුද්ගලයන් කවුරුන්ද;

(vi) නීති විරෝධී ලෙස වාහන ලබා දී ඇත්නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

2212/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, කෝපායි ගුරු පුහුණු විද්‍යාලයේ 600ක පමණ ශිෂ්‍යයන් පිරිසකට නේවාසිකව තම අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාමට පහසුකම් තිබෙන බවත්;

(ii) නමුත්, ශිෂ්‍ය නිවාසය වසර 25කින් පමණ ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් අබලන් තත්ත්වයේ පවතින බවත්;

(iii) ඒ හේතුවෙන් ගුරු සහායක පත්වීම් ලබා රුපියල් දස දහසක දිරි දීමනාවක් සහිතව පුහුණුව ලබන ශිෂ්‍යයන් හට, බාහිර නවාතැන් සඳහා විශාල මුදලක් දැරීමට සිදුවීමෙන් දුෂ්කරතාවන්ට මුහුණපා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ශිෂ්‍යයන්ගේ පහසුව සඳහා කෝපායි ගුරු පුහුණු විද්‍යාලයේ නේවාසිකාගාරය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

2243/'17

ගරු බිමල් රත්නායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ක්‍රීඩා අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

2337/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාවික හමුදා ලුතිනන් වයි. කේ. රාජපක්ෂ මහතාට (NRX 2431) එරෙහිව නාවික හමුදාව විසින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, ඒ කවර කාලවකවානුවකදීද;

(iii) ඔහුට එල්ල වී ඇති චෝදනා කවරේද;

(iv) එම චෝදනා හේතුවෙන් ඔහු නාවික හමුදා සේවයෙන් නෙරපනු ලැබුවේද; නැතහොත්, සේවය අත්හිටුවනු ලැබුවේද;

(v) සේවයෙන් නෙරපනු ලැබූ හෝ සේවය අත්හිටවනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

2410/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති මුස්ලිම් විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම දිස්ත්‍රික්කයේ දැනට සිටින මෞලවි ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෞලවි ගුරු හිඟය පියවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

2433/'17

ගරු ඩී. වී. චානක මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට වරාය පෞද්ගලිකරණය කිරීමේ ගිවිසුම මඟින් ලබාදෙන ඉඩම් ප්‍රමාණය සහ ඒවා ලබාදෙන පදනම කවරේද;

(ii) මෙම ගිවිසුම මඟින් මෙහෙයුම් පර්යන්ත සඳහා ලබාදෙන ඉඩම් සඳහා බදු කුලියක් අය කරන්නේද;

(iii) මෙම වරායේ තෙවැනි සහ සිව්වැනි අදියර ඉදිකිරීමේ අයිතිය ශිවිසුම්ගත සමාගම් දෙකෙන් එකකට ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒවා ලබාදෙන පදනම කවරේද;

(v) හම්බන්තොට වරායේ දෙවැනි අදියරේදී, ඉදිකරන ලද අක්කර 110ක විශාල දූපත මෙම සමාගම් දෙකෙන් එකකට ලබා දෙන්නේද;

(vi) එසේ නම්, ඒවා ලබාදෙන පදනම කවරේද;

(vii) මේ සඳහා දේශීය හෝ ජාත්‍යන්තර සමාගමක් මඟින් තක්සේරුවක් ලබාගෙන තිබේද;

(viii) නොඑසේ නම්, එම වටිනාකම නිර්ණය කරන ලද පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

2470/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ එක් එක් මැතිවරණ බලප්‍රදේශයේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) කෑගල්ල දිස්ත්‍රික්කයේ ජාතික පාසල් සංඛ්‍යාව වැඩි කිරීමට සහ දැනට ඇති ජාතික පාසල් තවදුරටත් දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

2483/'17

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවත්වන,

(i) බොහෝ දෙනෙක් වර්ෂයේ වැඩි කාලයක් ගොවිතැන් කටයුතුවල නිරත වන අය බවත්;

(ii) ගොවිතැන් සඳහා ජලය සපයා ගැනීමට වගා ළිං ප්‍රයෝජනයට ගන්නා බවත්;

(iii) එම වගා ළිං දීර්ඝ කාලයක් ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් කඩා වැටීමට හෝ ජලය හිඟ වීමට මුහුණපා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වගා ළිං ප්‍රතිසංස්කරණය කිරීමට යම්කිසි වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

2494/'17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේ සුරාබදු ආදායම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) 2016 වර්ෂයේ දුම්කොල හා සිගරට් නිෂ්පාදනය මත පනවන ලද බදු මඟින් උපයාගත් ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) පසුගිය වර්ෂයට සාපේක්ෂව, ඉහත (i) සහ (ii) හි ආදායම පිළිවෙලින් රුපියල් මිලියන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2016 වර්ෂයේ මෝල්ට් මධ්‍යසාර නිෂ්පාදනය ලීටර් කොපමණද;

(ii) 2016 වර්ෂය සඳහා මත්පැන් නිෂ්පාදනය අලුතින් ආරම්භ කිරීමට සමාගම්වලට නව බලපත්‍ර නිකුත් කර තිබේද;

(iii) එසේ නම්, එම බලපත්‍ර සංඛ්‍යාව සහ එම සමාගම්වල නම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සුරාබදු නීතිය යටතේ වැටලීම් සිදු කිරීමට බලය ඇති ආයතනය හා එහි අධිකාරි බලය ඇත්තේ කා හටද;

(ii) අත්අඩංගුවට පත් නීත්‍යානුකූල නොවන සුරා සම්බන්ධයෙන් නීති කටයුතු කිරීම සඳහා අධිකාරී බලය ඇත්තේ කා හටද;

(iii) ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

2520/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික කුරුඳු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් කොපමණද;

(iii) ලෝක කුරුඳු අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන්නේද;

(iv) කුරුඳු අපනයනයෙන් ලැබෙන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා අලුතින් වගාකර ඇති කුරුඳු වගා අක්කර ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කුරුඳු වගා බිම් ප්‍රමාණය ක්‍රමානුකූලව අඩුවී තිබේද;

(iii) එසේ වගාබිම් ප්‍රමාණය අඩුවී ඇත්නම්, එයට බලපා ඇති හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

2522/’17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.09 දින සිට 2017.11.30 දින දක්වා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල පිරිහී ඇති අගය කොපමණද;

(ii) එකී කාල වකවානුව තුළ රුපියලේ පිරිහීම හේතුවෙන් ආණ්ඩුවේ විදේශ ණය බර ඉහළ ගොස් ඇති ප්‍රමාණය රුපියල් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

2534/’17

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය සපයා ඇති දූපත් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දූපතෙහි සිටින විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම දූපත්වල බිල්පත් අය කර ගැනීමේ කාර්යක්ෂමතාව කොපමණද;

(iv) එකී දූපත් සඳහා ඩීසල් විදුලිබලාගාර වෙනුවට සූර්ය විදුලි බලය සහ සුළං විදුලි බලය භාවිතා කිරීමේ හැකියාවක් තිබේද;

(v) එසේ නම්, එම බලශක්තිය භාවිතා කරනු ලබන දූපත් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*1.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වන අපරාධ මැඩ පැවැත්වීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිළිබඳව කරුණු විමර්ශනය කර වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

ශ්‍රී ලංකාව තුළ වැඩිවෙමින් පවතින අපරාධ මැඩ පැවැත්වීම සහ නීතිය ක්‍රියාත්මක කිරීමේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම මෙරට ජනතාවගේ ප්‍රමුඛ අවශ්‍යතාවයක් බවට පත්වී ඇති හෙයින්ද,

ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමුකර ප්‍රතිකර්ම යෙදීමේ වගකීම මෙම පාර්ලිමේන්තුව වෙත පැවරී ඇති හෙයින්ද,

පහත සඳහන් කාරණා පිළිබඳව කරුණු විමර්ශනයකර සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(අ) පසුගිය වකවානුවේ සිදුවූ අපරාධවල ස්වභාවය, එසේ අපරාධ සිදුවීම සඳහා බලපා ඇති කරුණු කාරණා, අපරාධ සිදුවීම අවම කරගැනීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග සහ අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සහ/හෝ සංශෝධනයන්;

(ආ) සිවිල් සහ අපරාධ නඩුවලදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම පිණිස අනුගමනය කළ යුතු නිසි ක්‍රියා පිළිවෙත් සහ අලුතෙන් පැනවීමට අවශ්‍ය සහ/හෝ සංශෝධනයන්ට ලක්විය යුතු නීති රීති; සහ

(ඇ) ඉහත කරුණුවලට ආනුෂංගික වන්නා වූ සහ අවස්ථානුකූලව, සුදුසුයැයි හා අවශ්‍යයැයි කාරක සභාවට හැඟෙන සහ කාරක සභාව විසින් සලකා බලනු ලබන කරුණට බලපාන වෙනත් කාරණා;

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කළ යුතු ය;

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

3. එම කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව හෝ එබඳු කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එබඳු පුද්ගලයන්ගේ සන්තකයේ හෝ පාලනය යටතේ පවතින යම් ලිපියක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) සාක්ෂ්‍යකරුවන් වාචිකව විභාග කිරීමෙන් සත්‍ය අසත්‍යතාව විමසා බැලීමට හෝ අන්‍යාකාරයෙන් තහවුරු කර ගැනීමට ද, කාරක සභාවේ සභාපති හෝ එම කාර්යය සඳහා විශේෂයෙන් බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් දිවුරුම / ප්‍රතිඥා කරවනු ලැබූ සාක්ෂ්‍යකරුවන් විභාග කිරීමට ද;

(ඈ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සහය ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල්තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතුය.

4. සිය පළමුවැනි රැස්වීම් දිනයේ සිට මාස (06) හයක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් වැඩිදුරටත් ලබාදෙන අන් කවර කාල සීමාවක් තුළ හෝ කාරක සභාව සිය වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

2.

පා. 166/'15

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු නාමල් රාජපක්ෂ මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු මනුෂ නානායක්කාර මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු එස්.සී. මුතුකුමාරණ මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කනක හේරත් මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— මුදල් අමාත්‍ය, ගරු රවී කරුණානායක මහතාට එරෙහි විශ්වාස භංගත්වය,—

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන හෙයින්ද;

රාජ්‍ය මූල්‍ය කළමනාකරණයෙහි ප්‍රධානතම උපකරණය වන්නේ වාර්ෂික අයවැය ලේඛනය වන හෙයින්ද;

විසර්ජන පනත වශයෙන් මෙම උත්තරීතර සභාවට ඉදිරිපත් කරනු ලබන අයවැය හා සම්බන්ධිත මූල්‍ය අගයන් ඉතා සවිස්තරාත්මකව, විනිවිද පෙනෙන අයුරින්, උපරිම විශ්වාසය රැකෙන පරිදි, සත්‍ය ලෙස ඉදිරිපත් කිරීම මුදල් අමාත්‍යවරයාගේ ප්‍රධානතම යුතුකම හා වගකීම වන හෙයින්ද;

මුදල් අමාත්‍ය, ගරු රවී කරුණානායක මහතා පාර්ලිමේන්තුව හා මහජනතාව නොමඟ යවන දුර්නිරූපණය සහිත අයවැය ලේඛනයක් මෙවර (2016) මෙම ගරු සභාවට ඉදිරිපත් කරනු ලැබ ඇති හෙයින්ද;

2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණය (වගකීම්) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යවරයා විසින් මෙම ගරු සභාවට 2015 අප්‍රේල් 20 වැනි දින පිළිගන්වන ලද 2014 වාර්ෂික වාර්තාවේ 85 වැනි පිටුවේ "සාමාන්‍ය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් සඳහා සමස්ත ආයෝජනය රුපියල් බිලියන 164ක් වන අතර, 2013 වර්ෂයේදී සිදුකළ රුපියල් බිලියන 157ට වඩා රුපියල් බිලියන 7ක වැඩි වීමක්" වන හෙයින්ද;

"සාමාන්‍ය අධ්‍යාපනය සඳහා 2014 වර්ෂයේ සිදුකළ රාජ්‍ය ආයෝජනය රුපියල් බිලියන 117ක් වන අතර, එය 2013 වසරේ සිදුකළ බිලියන 108ක ආයෝජනයට වඩා 8%ක වැඩිවීමක්" වන හෙයින්ද;

2016 අයවැය ඇස්තමේන්තුවෙහි II වෙළුම 218 සහ 219 පිටු අනුව, 2015 වසරේදී සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රාග්ධන වියදම බිලියන 17.8 සිට 2016 දී රුපියල් බිලියන 18.3 දක්වාත් රුපියල් බිලියන 0.5කින් පමණ ඉතා සුළු ප්‍රමාණයකින් වර්ධනය වී ඇති හෙයින්ද;

ශ්‍රී ලංකාවේ අයවැය ලේඛන ඉතිහාසයේ අසාමාන්‍ය හා විස්මිත වෙනසක් ඇති කරමින් 2016 වර්ෂයේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වන පුනරාවර්තන වියදම 278%කින් (2015ට සාපේක්ෂව රුපියල් බිලියන 44 සිට බිලියන 167 දක්වා රුපියල් බිලියන 123කින්) රොකට් වේගයෙන් අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති හෙයින්ද;

මෙලෙස අසාමාන්‍ය හා විස්මයජනක ලෙස පුනරාවර්තන වියදම ඉහළ යෑමට බලපෑ ප්‍රධානතම හේතුව නිදහසින් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ කිසිම අයවැය ලේඛනයක සඳහන් නොවූ "රාජ්‍ය ආයෝජන පවත්වාගෙන යෑමේ පිරිවැය - ඉඩම් හා ගොඩනැගිලි" වශයෙන් රුපියල් මිලියන 121,352 හෙවත් රුපියල් බිලියන 121ක ගිණුම් සටහනක් පැවතීම වන හෙයින්ද;

මෙය පුනරාවර්තන වියදමක් ලෙස දැක්වුවද 2016 වර්ෂයේ දී සත්‍ය වශයෙන් වියදම් කරනු ලබන මුදලක් නොවන හෙයින්ද;

2016 වර්ෂයේදී අධ්‍යාපනයට වියදම් නොකරන රුපියල් කෝටි 1210කට අධික මුදලක් පුනරාවර්තන වියදම් ලෙස සටහන් කිරීමෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ව්‍යාජ ලෙස "පුම්බා පෙන්වා" මෙම ගරු සභාවට සාවද්‍ය තොරතුරු හා සංඛ්‍යා දත්ත ඉදිරිපත් කිරීමෙන් සභාවේ විශ්වාසය සම්පූර්ණයෙන් අහිමි කරගෙන ඇති හෙයින්ද;

තවදුරටත් මුදල් අමාත්‍යවරයා විසින් එම ධුරයේ කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනාව සම්මත කරයි.

3.

පා. 196/'17

ගරු  චමින්ද විජේසිරි මහතා

ගරු  අ. අරවින්ද් කුමාර් මහතා

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— උමා ඔය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමය හා සබැඳි ගැටලු පිළිබඳ සොයා බලා වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

කඳුරට නැගෙනහිර බෑවුමෙහි උමා ඔය මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාවක් වන හෙයින්ද;

උමා ඔයේ ජල සම්පත් බහුකාර්ය සංවර්ධන වැඩසටහන සඳහා උපයෝගී කර ගැනීම සහ එහි ජලය කිරිඳි ඔය වෙත හරවා යැවීම සඳහා ද මහවැලි සංවර්ධන වැඩසටහනෙහි සැලසුම්කරණ අවදියේදී සැලසුම් සකස් කොට තිබූ හෙයින්ද;

2007 වර්ෂය තුළ මෙම යෝජනා අත්හිටුවා තිබූ අතර 2007 නොවැම්බර් 27 වැනි දින උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකරනු පිණිස ශ්‍රී ලංකාවේ එවකට ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයා හා ඉරානයේ බලශක්ති අමාත්‍යවරයා අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ලැබූ හෙයින්ද;

මෙම අවබෝධතා ගිවිසුම යටතේ, ඉරාන ඉස්ලාමික ජනරජය (GIRI) එම රජය මෙන්ම, ශ්‍රී ලංකා රජය විසින්ද පිළිගනු ලැබූ කොන්ත්‍රාත්කරු වන ෆරාබ් සමාගමට (Farab Company) දැනට තිබෙන ශක්‍යතා අධ්‍යයනය යාවත්කාලීන කොට ව්‍යාපෘතියේ භෞතික ඉදිකිරීම් සිදු කිරීමටත්, “මූල්‍ය සම්පාදක” වශයෙන් ඉරාන අපනයන සංවර්ධන බැංකුව (EDBI) සමඟ උචිත සංවිධිවිධාන යෙදීමටත් බලය පවරා තිබූ හෙයින්ද;

මෙම අවබෝධතා ගිවිසුමට ආනුෂංගිකව උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2008 අප්‍රේල් 28 වැනි දින ශ්‍රී ලංකාවේ වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය සහ ඉරානයේ ෆරාබ් එනර්ජි ඇන්ඩ් වෝටර් ප්‍රොජෙක්ට්ස් නමැති සමාගම අතර කොන්ත්‍රාත් ගිවිසුමක් ඇති කර ගනු ලැබූ හෙයින්ද;

(අ) කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කරන කාලසීමාව තුළදී පාර්ශ්වයන් විසින් එකඟ වන පරිදි විශේෂිත කොන්දේසි සංශෝධනය කිරීමට,

(ආ) කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කරන කාලසීමාව තුළදී පාර්ශවයන් විසින් එකඟ වන පරිදි තාක්ෂණික පිරිවිතරයන්/සේවායෝජක අවශ්‍යතා සංශෝධනය කිරීමට,

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන සාකච්ඡා කමිටුවක් (Cabinet Appointed Negotiation Committee) විසින් මිල ගණන් සහ ගෙවීම් ක්‍රමවේදය සාකච්ඡා කිරීමට සහ සම්පූර්ණ කොන්ත්‍රාත් මිල සහ ගෙවීම් ක්‍රමවේදය තීරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට,

කොන්ත්‍රාත් ගිවිසුම යටතේ විධිවිධාන සකස් කොට ඇති හෙයින්ද;

(i) කොන්ත්‍රාත් මිල ලෙස ඇ. ඩො. 514,059,198ක් සහ ගෙවීමේ ක්‍රමවේදය පිළිබඳ සාකච්ඡාවලින් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන සාකච්ඡා කමිටුව විසින් කරන ලද නිර්දේශ භාර ගැනීමට,

(ii) කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම ඇ. ඩො. 529,059,198ක් වන ලෙස සකස් කිරීමට යෝජනා කොට ඇති ඇ. ඩො. 15,000,000ක අවිනිශ්චිතතා මුදලක් ඇතුළත් කිරීමට;

(iii) සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනයෙන් අනතුරුව වැඩ විෂය පථය තුළ යම් අඩුකිරීමක් හේතුවෙන් ඉතිරියක් ඇති වුවහොත්, එම ඉතිරිය අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් නිර්දේශ කොට ඇති පහත දැක්වෙන කාර්යයන් සඳහා භාවිතා කිරීමට;

(අ) ගඟ පහල සංවර්ධන (වාරිමාර්ග) කටයුතු,

(ආ) ඉහළ ජලපෝෂක ප්‍රදේශය සංරක්ෂණය කිරීම,

(ඇ) ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන්වූ පුද්ගලයින් නැවත පදිංචි කරවීම,

(ඈ) පරිසර අධ්‍යයනය,

(ඉ) නගර සංවර්ධනය.

(iv) අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා කමිටුව (CANC) සහ ෆරාබ් සමාගම විසින් එළැඹි ඉහත ගිවිසුම මත පදනම්ව වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය සහ ෆරාබ් සමාගම විසින් කොන්ත්‍රාත්තුව සඳහා පරිපූරකයක් අත්සන් කිරීමටද;

2008.12.08 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් 2008 දෙසැම්බර් 18 වැනි දින අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබාදෙන ලද හෙයින්ද;

ඒ අනුව, එවකට වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ෆරාබ් සමාගම විසින් 2009 පෙබරවාරි 22 වැනි දින කොන්ත්‍රාත් ගිවිසුමේ 1 වන පරිපූරකය අත්සන් කරන ලද හෙයින්ද;

2009 පෙබරවාරි 22 වැනි දින අත්සන් තබනු ලැබූ එකඟතා ගිවිසුම මඟින් සාදන ලද කොන්ත්‍රාත් ගිවිසුමේ පරිපූරක අංක 1 හි, අනෙකුත් කරුණු අතර ව්‍යාපෘති පිරිවැය ඇ.ඩො. 529,059,198 ක් ලෙස සංශෝධනය කර ඇති අතර, භෞතික අවිනිශ්චිත අවස්ථා සඳහා ඇ.ඩො. මිලියන 15ක් ද ඊට අයත් වන අතර ඒ අනුව කොන්ත්‍රාත් වටිනාකම ඇ.ඩො. මිලියන 514 ක් ඇති හෙයින්ද;

පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව සමාලෝචනය කිරීම පිණිස විවිධ නියෝජිතායතනවල කාර්ය මණ්ඩලවල සහ විෂය ක්ෂෙත්‍රයන්හි විශේෂඥයන්ගෙන් සමන්විත කණ්ඩායමක් ද පත්කර තිබූ හෙයින්ද;

(අ) මොණරාගල දිස්ත්‍රික්කයේ නව ඉඩම් හෙක්ටයාර 4500කට පමණ සහ දැනට වගාකරනු ලබන කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 1500කට පමණ වගා කිරීම සඳහා ජලය සැපයීමට,

(ආ) මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පානීය සහ කර්මාන්ත ජල අවශ්‍යතා සඳහා ජලය ඝන මීටර මිලියන 30ක් සැපයීමට,

(ඇ) මෙගාවොට් 120ක ස්ථාපිත ධාරිතාවය සහිත භූගත විදුලි බලාගාරයක් හරහා ජාතික පද්ධතියට වාර්ෂිකව ගිගාවොට් පැය 231 ක විදුලි බල ශක්තියක් උත්පාදනය සහ සැපයීමට,

(ඈ) ඩයරාබා ජලාශයෙන් මහා බණ්ඩාරවෙල නගරාශ්‍රිත ප්‍රදේශ සඳහා ජල යෝජනා ක්‍රමය, පුහුල්පොල ජලාශයෙන් ඇටම්පිටිය ජල යෝජනා ක්‍රමය සහ කුඩා ඔය ජලාශයෙන් හම්බේගමුව ජල යෝජනා ක්‍රමය සඳහා ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයට පානීය ජල අවශ්‍යතා සැපයීමට,

මේ වනවිට ආසන්න වශයෙන් සියයට 40 ක පමණ වැඩ අවසන් කර ඇති හෙයින්ද;

ඉන් අනතුරුව 2014 දෙසැම්බර් මාසයේදි බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මකුල් ඇල්ල වෙහෙරගලතැන්න, උඩ පේරුව, බඹරගම සහ හීල් ඔය ප්‍රදේශවල ගෘහස්ථ ළිංවල ජල මට්ටම අඩුවීම, ස්වභාවික ජල උල්පත් සිඳීයාම සහ නිවාසවල බිත්ති සහ පොළොවෙහි සහ භූමියෙහි ඉරිතැලීම් ඇතිවීම් වාර්තා වූ හෙයින්ද;

අනතුරුව 2017 අප්‍රේල් මාසයේදී එරනවිල සහ අත්තලපිටිය ග්‍රාම නිලධාරී වසම්වල සහ පසුව තන්තිරිය ග්‍රාම නිලධාරී වසමේ ද එම තත්ත්වය වාර්තා වූ හෙයින්ද;

මෙම තත්ත්වය හමුවේ මෙම ව්‍යාපෘතියේ ආරම්භය සහ ගැටලු පිළිබඳ පහත කරුණු සළකා බැලිය යුතු හෙයින්ද;

(අ) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පූර්වයෙන් නිසි සහ විස්තීරණ ශක්‍යතා අධ්‍යයනයන් සිදුකරනු ලැබුයේද,

(ආ) ව්‍යාපෘතිය සඳහා නිමි යථාර්තවාදී පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කරනු ලැබුයේද,

(ඇ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී යථාරූපී නොවූ පිරිවැය සීමා ඉක්මවා යාම් සිදුවූයේද,

(ඈ) විස්තීරණ පාරිසරික බලපෑම් ඇගයීමක් සිදු කරනු ලැබූයේද;

යන වග මෙන්ම,

(අ) ඉහතින් සඳහන් කරන ලද වාර්තා පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වූ පුද්ගලයන්,

(ආ) එකී වාර්තා පිළියෙල කිරීම සම්බන්ධයෙන් එම පුද්ගලයා හෝ පුද්ගලයන් නොසැලකිලිමත් අයුරින් කටයුතු කොට තිබේද,

(ඇ) උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වන කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේදී කවර හෝ වංචාකාරී හෝ අපරාධ ක්‍රියාකාරකමක් සිදුවීම සම්බන්ධයෙන් කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් වරදකරුවන් බවට පත්වී තිබෙනුයේ ද, යන්න සහ එසේ සිදු වී ඇත්නම්, එම පුද්ගලයන් කවුරුන්ද යන වග,

(ඈ) ව්‍යාපෘතියේ අහිතකර බලපෑම් සම්බන්ධයෙන් කවර හෝ පුද්ගලයකු හෝ පුද්ගලයන් හෝ ආයතන වගකිව යුතු වූයේද යන්න සහ එසේ වූයේ නම්, ඒ කවුරුන්ද යන වග,

(ඉ) මෙම ව්‍යාපෘතිය මඟින් අහිතකර බලපෑම්වලට ලක් වූ පුද්ගලයන් සඳහා යම් වන්දියක් ප්‍රදානය කිරීමට නියමිතව පවතීද යන්න තීරණය කිරීමටත්,

(ඊ) තමන් සිදුකරන විමසීම් කටයුතු සඳහා අදාළ වෙතැයි කාරක සභාවට හැඟෙන වෙනත් කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් විමසීමට සහ වාර්තා කිරීම සඳහා ද,

පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) කාරක සභාව සහ එහි සභාපති කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුනද, කාරක සභාව සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරනය නියමකර ගැනීමටත්;

(ආ) යම් පුද්ගලයින් කැඳවීමට, ලිපි ලේඛනාදිය සහ වාර්තා ගෙන්වා ගැනීමට, පාර්ලිමේන්තුව ඉදිරියේ හෝ එවන් කාරක සභාවක් ඉදිරියේ පෙනී සිටින ලෙස කවර හෝ පුද්ගලයකුට නියම කිරීමට සහ එවන් පුද්ගලයකුගේ සන්තකය හෝ පාලනය යටතේ පවතින කවර හෝ පත්‍රයන්, ග්‍රන්ථමය වාර්තාවක් හෝ ලිපිලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමටත්;

(ඇ) සාක්ෂිකරුවන්ගේ වාචික සාක්ෂි ලබාගැනීම මඟින් කරුණුවල සත්‍ය අසත්‍යභාවය පරීක්ෂාකර බැලීමටත්, සහතික කරගැනීමටත් සහ කාරක සභාවේ සභාපති විසින් හෝ මේ සඳහා විශේෂ අවසරය සලසා ඇති පුද්ගලයකු විසින් සිදුකරනු ලබන දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මඟින් සාක්ෂිකරුවන් පරීක්ෂාවට ලක්කිරීමටත්;

(ඈ) කාරක සභාවේ සහය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමටත්; සහ

(ඉ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමටත්;

බලය තිබිය යුත්තේය.

4. කාරක සභාව සිය පළමු රැස්වීම් පැවැත්වීමේ සිට මාස හයක් ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙනු ලබන වෙනත් හෝ වැඩිදුර කාලයක් ඇතුළත සිය වාර්තාව සකස් කළ යුත්තේය.

4.

පා. 198/'17

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු බන්දුල ගුණවර්ධන මහතා
ගරු පියංකර ජයරත්න මහතා
ගරු සී. බී. රත්නායක මහතා
ගරු ප්‍රසන්න රණතුංග මහතා
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
ගරු කංචන විජේසේකර මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු නාමල් රාජපක්ෂ මහතා
ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා
ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය
ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා
ගරු කනක හේරත් මහතා
ගරු තාරක බාලසූරිය මහතා
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
ගරු එස්. ප්‍රේමරත්න මහතා
ගරු ජයන්ත සමරවීර මහතා
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු සාලින්ද දිසානායක මහතා
ගරු වීරකුමාර දිසානායක මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා කෙරෙහි විශ්වාස භංගත්වය,—

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු විවිධ පාර්ශව විසින් ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතාට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති බරපතල වංචා සහ දූෂණ පිළිබඳ විමර්ශනයන්ට සහභාගි නොවීමෙන් යුක්තිය ඉටු කිරීමේ අවස්ථා අවුරා දමා ඇති හෙයින් ද;

එතුමා විසින් එකී විමර්ශනයන්ට මුහුණ දී සිය ප්‍රතිරූපය රැක ගනු වෙනුවට එකී විමර්ශනයන් මග හැරීම හේතුවෙන් එකී චෝදනාවන්ට ඔහු වැරදිකරු බවට ප්‍රබල සමාජ මතයක් ගොඩ නැගී ඇති හෙයින් ද;

ශ්‍රී ලාංකික වෛද්‍ය අධ්‍යාපනය වාණිජ අරමුණු පෙරදැරිකරගත් ව්‍යාපාරික ප්‍රජාවට බිලි දීම සඳහා රාජ්‍ය බලය අත්තනෝමතික ලෙස උපයෝගී කර ගනිමින් ශ්‍රී ලාංකික වෛද්‍ය අධ්‍යාපනය තුළ බරපතල අර්බුදයක් නිර්මාණය කළ හෙයින් ද;

නෙවිල් ප්‍රනාන්දු රෝහල රජයට පවරා ගත් බවට අමාත්‍ය මණ්ඩලයත්, සමස්ත ජාතියත් නොමග යවමින් එකී පෞද්ගලික හිමිකාරත්වයක් ඇති රෝහල මහජන මුදලින් නඩත්තු කිරීමට කටයුතු කර මහජන මුදල් අවභාවිතා කර ඇති හෙයින් ද;

අභියාචනාධිකරණයේ දී විභාග වුණු අංක CA / Writ 187/2016 නඩුවේ දී සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා ලෙස අධිකරණයට ඉදිරිපත් කළ යුතු කරුණු ඉදිරිපත් නොකරමින් ද, නීතිපතිවරයා හරහා සයිටම් ආයතනයට පක්ෂග්‍රාහිව කරුණු දැක්වීමෙන් ද සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ධුරයේ බලය අයුතු ලෙස යොදා ගෙන ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් සකස් කළ වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතීන් ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම උවමනාවෙන්ම පැහැර හැරීමෙන් ශ්‍රී ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය පිළිබඳ බරපතල අර්බුදයක් බිහි කළ හෙයින් ද;

ඩෙංගු වසංගත රෝගී තත්ත්වයක් ඇති වුණු විට එයට ක්ෂණික පිළියම් යෙදීමට අසමත් වීමෙන් ද, රජයේ රෝහල් වලට ඩෙංගු රෝගීන් ඇතුළත් කර ගැනීම ප්‍රතික්ෂේප කිරීමෙන් ද ජනතාවගේ ජීවත්වීමේ පරම අයිතිය බරපතල ලෙස අවදානමකට ලක් කළ හෙයින් ද;

පියයුරු පිළිකා රෝගය සඳහා අවශ්‍ය කරන ඖෂධ මිලදී ගැනීමට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ටෙන්ඩර් කැඳ වූ අවස්ථාවේ පිළිකා රෝගය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් විසින් ප්‍රතික්ෂේප කළා වූ ද, මිලදී ගැනීමට පෙර භාවිතයේ පැවැතිය යුතු අවම වසර ගණන සම්පූර්ණ නොකළා වූ ද, ඖෂධයක් ඉදිරිපත් කළ, විෂය භාර අමාත්‍ය ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා විසින් එකී සංස්ථාවේ ක්‍රියාකාරි අධ්‍යක්ෂ තනතුරට පත් කළ රූමි මොහොමඩ් මහතා යන අයගේ ඥාති සහෝදරයෙකු වන ඩිල්ෂාඩ් ඉක්‍රම් මොහොමඩ් මහතාට අයත් මෑතකදී ලියාපදිංචි කළ ෆාමේස් පෞද්ගලික සමාගමෙන් මිලදී ගැනීමට කටයුතු කිරීමෙන් ද, රුපියල් මිලියන 986ක් වටිනා ඖෂධ එකී සමාගමෙන් මිලදී ගැනීමෙන්ද, ශ්‍රී ලංකා රජයට මූල්‍ය අලාභයක් සිදුකර ඇති හෙයින් ද;

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා පිළිබඳ විශ්වාසනීයත්වය සම්පූර්ණයෙන්ම නොමැති බැවින්, තවදුරටත් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා ලෙස එම ධුරයේ කටයුතු කිරීමේ හැකියාව පිළිබඳ විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

5.

පා. 212/'17

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු විමල් රාජපක්ෂ මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු සිසිර ජයකොඩි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාපා මහතාට එරෙහිව විශ්වාසභංග යෝජනාව,— පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින්, ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනයන්හි ඡන්දය පැවැත්වීමට,

මැතිවරණ කොමිෂන් සභාවට බලය පවරා, එකී කොමිෂන් සභාව මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරමින් තිබියදීත්, විෂයභාර අමාත්‍යවරයා පළාත් පාලන ඡන්දය පැවැත්වීමට අපොහොසත්වීමෙන්, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට දැඩි බලපෑමක් සිදු වී ඇති බැවින් ද;

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ගරු ෆයිසර් මුස්තාපා මහතා පිළිබඳ විශ්වසනීයත්වය සම්පූර්ණයෙන් නොමැති බැවින් තවදුරටත් එම ධුරයේ කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව විශ්වාසයක් නොපවතින බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

6.

පා. 215/'18

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු හේෂාන් විතානගේ මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා,— ශ්‍රීලන්කන් සහ මිහින් ලංකා යන ගුවන් සමාගම්වලට අති විශාල අලාභ ලැබීමට හේතුපාදක වූ, රජය අනුමත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් හිතාමතාම උල්ලංඝනය කිරීමට අදාළ ගැටලු පිළිබඳව සහ එම අපක්‍රියාවන්ට වගකිව යුතු පුද්ගලයන් පිළිබඳව සොයා බලා වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

අමාත්‍ය මණ්ඩලය විසින් 2011 ජුලි මස 27 වැනි දින අනුමත කරන ලද තීරණය සහ අනෙකුත් කරුණු ඇතුළුව —

(අ) 2012 වසරේ සිට ආරම්භ වන පස් වසරක කාල සීමාවක් සඳහා ශ්‍රීලන්කන් සහ මිහින් ලංකා යන ගුවන් සේවා සමාගම්වලට හිමිකම් ප්‍රාග්ධනය වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 520.0ක් ආයෝජනය කිරීම;

(ආ) ඉහත කී අරමුදල් 2012 වසරේ සිට ඉදිරියට වාර්ෂික ජාතික අයවැය ඇස්තමේන්තුවලින් වෙන්කිරීම; සහ

(ඇ) දේශීය/ විදේශීය බැංකු හෝ මූල්‍ය ආයතනවලින් කෙටිකාලීන හදිසි ණය පහසුකම් ලබාගැනීම පිණිස ඇමරිකානු ඩොලර් මිලියන 270ක ස්වෛරී ඇපකර නොපමාව නිකුත් කිරීමට භාණ්ඩාගාරයට බලය ලබාදීම

යනාදී කරුණු සඳහා ද අනුමතිය ලබාදුන් හෙයින් ද;

ඉහත සඳහන් අනුමතිය ලබාදීමෙන් අනතුරුව, ඔවුන් විසින් සකසන ලද ව්‍යාපාර සැලසුම ප්‍රකාරව තම ගුවන්යානා සංචිතය අලුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා මුල පිරීමට ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් 2012 වසරේදී කටයුතු කරන ලද හෙයින් ද;

එයාර් බස්, බෝයිං, රෝල්ස් රොයිස් සහ ජෙනරල් ඉලෙක්ට්‍රික් යන සමාගම් සමඟින් සාකච්ඡා සම්මුති පැවැත්වූ ශ්‍රීලන්කන් ගුවන් සමාගම එකී නිෂ්පාදකයන් සමඟින් පැවති සාකච්ඡා, සම්මුති නිමාකිරීමෙන් අනතුරුව ට්‍රෙන්ට්700 එන්ජිම සහිත ඒ330-300 ගුවන් යානා හයක් (06) ද, ට්‍රෙන්ට්XWB එන්ජිම සහිත ඒ350-900 ගුවන් යානා හතරක් (04) ද සෘජුවම එයාර්බස් සමාගමෙන් මිලදී ගැනීමට තීරණයක් ගනු ලැබූ හෙයින් ද;

තවද, 2017දී භාරදීමට නියමිත අමතර ඒ350-900 ගුවන්යානා තුනක් (03) ද, කල්බදු පදනමින් ලබාගැනීමට ද තීරණයක් ගෙන තිබූ හෙයින් ද;

පැරණි ගුවන්යානා වෙනුවට නව ගුවන්යානා යෙදවීමේ කටයුත්ත සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබාගැනීමේ පදනම මත තීරණයකට එළඹ තිබූ හෙයින් ද;

පසුව, 2020දී, ඒ350-900 ගුවන්යානාවක් භාරදීම සඳහා ඉඩක් වෙන්කරන බව සහතික කරගැනීම සඳහා 2013 මාර්තු 31 වැනි දිනට පෙරාතුව එයාර්බස් සහ රෝල්ස් රොයිස් සමාගම් සමඟින් අවබෝධතා ගිවිසුමකට එළඹීමට ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් කටයුතු කර තිබූ හෙයින් ද;

2013 අප්‍රේල් මාසයේදී භාණ්ඩාගාර ලේකම්, සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම්, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී සහ භාණ්ඩාගාරයේ නිලධාරීන් අතර පැවති රැස්වීමකදී රජයේ සීමිත වගකීම් සහිත සමාගමක් වශයෙන් ශ්‍රීලන්කන් ගුවන් සමාගම, එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ ව්‍යාපාර සැලසුම් ප්‍රකාරව තම ව්‍යාපාර කටයුතු කරගෙන යාම අවශ්‍ය වන බව ඉහත කී රැස්වීමේ මුලසුන හෙබවූ භාණ්ඩාගාර ලේකම්වරයා විසින් ප්‍රකාශ කර තිබූ හෙයින් ද;

පසුව, 2013 ජූනි මාසයේදී ඒ350-900 ගුවන් යානයට අදාළ මිලදී ගැනීමේ ගිවිසුම අත්සන් කිරීමෙන් අනතුරුව ඒ350 ගුවන් යානයක් මිලදී ගැනීම සඳහා එයාර් බස් සමාගම සමඟින් අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් කටයුතු කර තිබූ හෙයින් ද;

2015න් පසුව එළඹෙන සමයේ ගුවන්යානා අවශ්‍යතාවය සලකා බැලූ ශ්‍රීලන්කන් ගුවන් සමාගම නව ගුවන් ගමන් මාර්ග සැලසුම් කර තවත් ඒ350-900 ගුවන්යානාවක් 2014 සැප්තැම්බර් මාසයේදී ලබාගැනීම සඳහා ශ්‍රීලන්කන් ගුවන් සමාගම විසින් ගත් තීරණය ද සමඟින් ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ගුවන්යානා සංචිතයේ ඒ350-900 ගුවන්යානා සංඛ්‍යාව අට (08) දක්වා ඉහළ ගොස් තිබූ හෙයින් ද;

මෙම ගුවන් යානය කල්බදු පදනම මත ලබාගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ගුවන් යානා කල්බදු පදනමින් ලබාදෙන සමාගම් වෙත ආරාධනා කර ඒ සම්බන්ධයෙන් තේරීම් ක්‍රියාවලියක් දියත් කළ ශ්‍රීලන්කන් ගුවන් සමාගම මෙම ගුවන් යානය කල්බදු පදනම මත ලබාගැනීම සඳහා අවසානයේදී AetCap නමැති සමාගම තෝරා ගෙන තිබූ හෙයින් ද;

ඒ350-900 වර්ගයේ ගුවන් යානාවලට පැය 17ක් දක්වා කාලයක් එකදිගට පියාසර කිරීමේ හැකියාව ඇති හෙයින් එම ගුවන් යානා වර්ගය ලෝකයේ දීර්ඝතම පියාසර කාල පරාසයක් සහිත ගුවන්යානා වර්ගය වන හෙයින් ද;

ශ්‍රී ලංකාව මෙම ගුවන් යානය මිලදී ගත් මුදල හා ගෙවීමට එකඟව ඇති කල්බදු වාරිකය වෙළෙඳ පොළ වටිනාකමට වඩා සැලකිය යුතු මට්ටමකින් ඉහළ අගයන් වන හෙයින් ද;

මෙම ගුවන් යානා අතරින් කිසිවක් ශ්‍රී ලංකාවට ලාභදායී අන්දමින් මෙහෙයුමෙහි යෙදවීමට නොහැකි බවක් පෙනී ගොස් ඇති හෙයින් ද;

ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ එවකට සිටි කළමනාකාරීත්වය විසින් ගනු ලැබූ තීරණ එම ගුවන් සමාගමට මෙන්ම මෙම රටට ද දැවැන්ත අලාභයක් ගෙන දීමට හේතු වූ හෙයින්ද;

පහත සඳහන් කරුණු පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

(අ) එවකට සිටි කළමනාකාරීත්වය රජය විසින් අනුමත කර ඇති ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් සම්පූර්ණයෙන්ම නොසලකා හැර කටයුතු කර තිබේද යන්නත්;

(ආ) පවතින වෙළෙඳ පොළ තත්ත්වයන් සලකා බැලීමේදී, ඉහත සඳහන් කර ඇති පරිදි ගුවන් යානා මිලදී ගැනීම වැරදි විනිශ්චයන් පදනම් කරගෙන ගනු ලැබූ තීරණයක්ද යන්නත්;

(ඇ) එවකට සිටි කළමනාකාරීත්වය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග නිසා ශ්‍රීලන්කන් ගුවන් සමාගමට අලාභයක් සිදුවූයේ ද යන්න සහ, එසේ නම්, ඒ කවර මුදලක්ද යන්න;

(ඈ) එම අලාභ සඳහා කිසියම් පුද්ගලයෙක් හෝ පුද්ගලයන් වගකිවයුත්තන් වන්නේද යන්නත්;

(ඉ) කිසියම් පුද්ගලයෙක් හෝ පුද්ගලයන් හෝ ආයතන මෙම ගනුදෙනු මඟින් කිසියම් අයුතු මුදලක් උපයාගෙන තිබේද යන්න සහ එසේ නම්, ඒ කවුරුන්ද යන්නත්;

(ඊ) රජය විසින් අනුමත කර ඇති ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටින් හිතාමතාම උල්ලංඝනය කිරීමට සහ අයුතු මුදල් ලාභ ලැබීමට වරදකරුවන් වන කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයන්ට විරුද්ධව ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්න; සහ

(උ) කාරක සභාව විසින් සිය විමර්ශනයන්ට අදාළ යැයි සලකනු ලබන වෙනත් ඕනෑම කාරණයක් පිළිබඳව.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් නම් කරනු ලැබිය යුත්තේ ය.

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, මෙම කාරක සභාව සාමාජිකයන් විසි එක් දෙනෙකුට (21) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුත්තේ ය.

3. එකී කාරක සභාවට—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමටද;

(ආ) පුද්ගලයන්, ලිපිලේඛන හා වාර්තා කැඳවීමට ද, පාර්ලිමේන්තුව ඉදිරියේ හෝ එකී කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස සහ තමන් සන්තකයේ හෝ තම පාලනය යටතේ තිබෙන කිසියම් ලේඛනයක්, පොතක්, වාර්තාවක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස කිසියම් පුද්ගලයෙකුට නියම කිරීමට ද;

(ඇ) කාරක සභාවේ සභාපතිවරයා හෝ අදාළ කාර්යය සඳහා නිශ්චිත වශයෙන් බලය පවරන ලද පුද්ගලයකු විසින් සාක්ෂිකරුවන් වාචිකව පරීක්ෂා කොට සත්‍යාක්ෂණය කිරීමට හෝ අන් අයුරකින් විමසා බැලීමට හා දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් මත සාක්ෂකරුවන්ගෙන් ප්‍රශ්න කිරීමට ද;

(ඈ) කාරක සභාව වෙත සහාය ලබා ගැනීම පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවාවන් ලබා ගැනීමට; සහ

(ඉ) කලින් කලට අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට සහ පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වා ගෙන යෑමට ද;

බලය තිබිය යුත්තේ ය.

4. කාරක සභාව සිය පළමු රැස්වීම් පැවැත්වීමේ සිට මාස හයක් (06) ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙනු ලබන වෙනත් හෝ වැඩිදුර කාලයක් ඇතුළත සිය වාර්තාව සකස් කළ යුත්තේය.

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*